
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2557ක් වූ ඇසළ මස (ව්‍යවහාරික වර්ෂ 2013 ජුලි)

21 වෙනි කලාපය



## පෙරහැරෙන්

කියවෙන

## සැඟවුණු දහම් කතාව

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# නියත මිස දිටුවෙන් ලෝකාන්තරික නරකයට...



නියත මිස දිටුව සිත තුළ දරා ගෙන
සියත ඇති බලය ගෙන රවටවා දන
දියත තුළ උතුරු දම් වනසවා ගෙන
මියෙත ඝන අඳුරු නිරයට වහා යන

පින් පවු නැතැයි කියමින් ඒ ගැන වාද
දුන් දේ ඵල නොදෙන බව ගෙන හැර පාද
ඉන් ගොඩනැගෙන මතයෙන් ලොව කර බේද
වෙන් වුණ දාට නිරයට මිස කොහි යාද

මවු පිය ලෙසින් වෙනසක් නැති බවට කියා
ලොවුතුරු බුදුන් නැත කියනට කරුණු සොයා
කිව් කළ නොයෙක් දේ ලෝ සත රවට තියා
හව්හරණක් නැතිව විඳවයි අඳුර අයා

ඝනඳුර මිසක එළි බිඳකුදු නැත පේන
යන එන කෙනෙකු නැත දුටු විලසකි හීන
දැන ගත නොහැක තමනට තමනගෙ මූණ
තැන මහ දුකකි කප් කෙළ ගෙවුණද නේන

ගෙවුණත් කප් ගණන් ආයුස ඉවර නැත
පවු කඳ ගෙවෙන තෙක් අඳුරෙහි දුකම දෙත
ලොවුතුරු බුදුවරුත් පහළව පිරි නිවෙත
සව් සත මුලා කරවා අඳුරෙහි ගිලෙත

ලෝ වැනසුමටවත් නොනැසෙන ලෙසට තැනූ
බෝ ඝනඳුර සැරයි නොපෙනෙන විලස වුණූ
මෝහය දැඩිව අල්වා දම් කළද සුනූ
දෝසය මෙලෙස ඵල දෙයි එය සිතට ගනූ

සක්වල තුනක දිව් ගෙවනා මිනිස් දනා
එක් කළ නරකයකි ඝනඳුර මැදින් තනා
දුක් කල ගෙවන විට පිහිටෙන කෙනෙක් ගැනා
තෙක් කළ ලොවම වැනසෙන දින නොවෙත් දැනා

තියෙන කල ලොවේ දම් මග වනස දමා
මියෙන කල තුමක් කරනද කඳුළු තෙමා
බියෙන අඳුරු ලොව සකසා මෙලොව දිමා
පියෙන දෙනෙත් නොකරයි කිසි විටෙක සමා

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

**1 වන කොටස**



ලෝකයට සම්මා සම්බුදුවරයන් වහන්සේ නමක් පහළ වෙන්නේ ඉතාම කලාතුරකින්. කෙනෙක් තමන් ආපු සසර ගමන එක්ක බලනකොට ඒක ගණනය කරන්න බැරි තරම් ඉතාම කුඩා කාලයකට සීමා වෙනවා. **උපමාවකින් කියනව නම් කෙනෙක් සසර ගමන් කරගෙන ආපු මුළු කාලය සමග සසඳා බලද්දි, බුද්ධ ශාසනයක් පැවතිලා තියෙන කාලය ඇසිපිය ගහන මොහොතක්**, එහෙම නැත්නම් ක්ෂණයක් කියල කියන්න පුළුවන්. ඉතින් ඒ ක්ෂණය මහත් සම්පත්තියක්. ඒ නිසා ඒ කාලය තුල ඉපදෙන මනුස්සයන්, දෙවියන්, බ්‍රහ්මයන් කියනවා අපට ක්ෂණ සම්පත්තියක් ලැබුණ කියල.

ඉතින් ඒක සම්පත්තියක් වෙන්නෙ කොහොමද?

පහුගිය කලාපයෙන් විස්තර කළ, මැරෙන බහුතරය සතර අපායට යන හැටි.... ලිපිය කියවපු කෙනෙකුට, සත්වයා වැඩිපුරම ගත කරන්නෙ කොතනද කියල තේරුම් ගන්න පුළුවන්. එතැනින් සත්වයා සසර ගමන තුල වැඩිපුරම දුක් විඳල තියෙනවද, සැප විඳල තියෙනවද කියලත් තේරුම් ගන්න පුළුවන්. කිසිම කතාවක් නෑ ලැබෙන උත්තරය තමයි අපෝ දුක්මනේ විඳල තියෙන්නෙ කියල. පෙරුම් පුරන කාලයේ පෙර අත් බැවක අපේ ගෞතම බෝසතාණන් වහන්සේ විසි අවුරුද්දක් රජකම් කරන්න ගිහින් කරගත්තු පාප කර්මවලට අවුරුදු 80,000 ක් නිරයේ දුක් විඳින්න සිද්ධ වුණා කියල උන් වහන්සේම දේශනා කරල තියෙනවා. ඉතින් අවුරුදු 20 ක රජ සැප විඳින්න ගිහින් අවුරුදු 80,000 ක්ම දුක් විඳල. ඒ රජ සැප විඳපු අවුරුදු 20 ගත්තමත් ඒ අවුරුදු විස්සම සතුටින් හිටිය කියල අපට හිතන්න පුළුවන්ද? ලෙඩක් දුකක් හැදිල නැද්ද? තරහ ගිය අවස්ථා තිබිල නැද්ද? රාජ්‍යයට සතුරු කරදර තිබිල නැද්ද? හිත මිත්‍රාදීන්, ඥාතින්, ළඟින්ම ආශ්‍රය කරපු අය මිය පරළොව ගිහින් නැද්ද? ඉතින් සැපයි කියල හිතුවට එතනත් මහ දුකක්. දැන් ඒ විදියෙ ගණනය කරන්න බැරි මහා දුක් කන්දරාවකින් මිදෙන්න පාරක් අහගන්න පුළුවන් කෙනෙක් ඉන්නව කියල කිව්වොත් ඒක සම්පත්තියක් නෙවෙයිද? නිකමට හිතන්න මේ වගේ සම්පත්තියක් අපට නිකන් ලබන්න පුළුවන්ද කියල.

උප්පත්ති ජාතියේ යමක් කමක් තේරුම් ගන්න පුළුවන්, ඇස් කන් පේන, ඇහෙන කෙනෙක් වෙන්න නිකන් පුළුවන්ද? ඊටත් වඩා, අප්‍රමාණ කල්ප ලක්ෂ කෝටි ගණන් දුක් විඳිමින්, පාරමිතා පුරමින් උන් වහන්සේ අවබෝධ කරගත් චතුරාර්ය සත්‍ය දහම තේරුම් ගන්න පුළුවන් ජාතියක උප්පත්තිය ලැබීම ලේසි පහසු දෙයක්ද? ජාතිය, චතුරාර්ය සත්‍යය තේරුම් අරගෙන ලැබෙන ආර්ය ජාතිය නම් සංඛාරය කුමක් විය යුතුද? ඒ හා සමාන උතුමන්ට කරපු පුද සත්කාර, ඒ උතුමන්ට දාන මාන ඉඳුම් හිටුම් සලසා දීමෙන් කරපු කාර්යක ප්‍රතිඵලයක්. අඩුම තරමේ ඒ උතුමන් පරිහරණය කරන තැනක් පිරිසිදු කිරීමෙන් කරපු ප්‍රාර්ථනයක් වුනත් සෑහෙනවා. ඉතින් නිවන් දකින්න මූලික වෙන්නෙ චතුරාර්ය සත්‍යාවබෝධය, එහෙම නැත්නම් පටිච්ච සමුප්පාද න්‍යාය ධර්මය හිතට එකඟව අවබෝධ කර ගැනීමෙන්. එහෙම නැත්නම් අනිච්ච, දුක්ඛ, අනත්ත කියන තිලකුණු තේරුම් ගැනීමෙන්. මේ මොන ක්‍රමයක හෝ ප්‍රතිඵලය තමයි නිවන. ඒ නිවන කරා යන මූලික මග තමයි පෙළ. එහෙම නැත්නම් ප්‍රධාන පෙළ. හැබැයි ඒ ප්‍රධාන පෙළට එන්න කලින් කරන්න ඕන වැඩ කොටසක් තියෙනවා. ගමනක් යන්න අවශ්‍ය කළමනා බඩු බාහිරාදිය නිකම්ම ලැබෙන්නෙ නෑ. ගමන යෑම මූලිකයි වගේම, ගමන යන්න අවශ්‍ය කරන කළමනා බඩු බාහිරාදී කාරණා දෙවනියි. ඊළඟට ඒ ගමන යෑමත් අත්‍යවශ්‍යයි. නිවන් දකින්න අවශ්‍ය ප්‍රධාන කාරණාව සද්ධර්මාවබෝධය නම්, ඊට අවශ්‍ය මානසිකත්වය, පරිසරය ☞

හඳාගැනීම දෙවනි කාරණාව වෙනවා. ඒ දෙවනි කාරණාව, එනම් ප්‍රධාන පෙළට එන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය පූජාව තමයි අප්‍රධාන පෙළ. බුද්ධ ශාසනයේ වැඩ සිටි බුදුපියාණන් වහන්සේ ඇතුළු බොහෝ රහතන් වහන්සේලා මේ දෙවන කාරණාව සම්පූර්ණ කරගත්ත හැටි විස්තර කරන කොටස තමයි අප්‍රධාන පෙළ, එහෙමත් නැත්නම් අපදාන පාළිය කියල කියන්නෙ.

අපදාන පාළියේ ප්‍රධාන කොටස් තුනකින් උන්වහන්සේලා කියපු කරපු දේවල් විස්තර වෙනවා. බුදුන් වහන්සේ පෙරුම් පුරන කාලයේ කරපු කුසල කර්මයන්, උන්වහන්සේ පටන් ගත්තු හැටි, මූලික වුණ හැටි බුද්ධාපදානයෙන් විස්තර වෙනවා. ඒ වගේම පසේ බුදුවරයන් වහන්සේලා පටන් ගත්තු හැටි, කියපු කරපු දේවල් විස්තර වෙන්නෙ පච්චේක බුද්ධාපදානයෙන්. අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ඇතුළු බොහෝ අරිහත් ශ්‍රාවකයන් වහන්සේලා සහ ශ්‍රාවිකාවන් වහන්සේලා පටන් ගත්තු හැටි, කියපු කරපු දේවල් විස්තර වෙන්නෙ ථේරාපදානයෙන් සහ ථේරිපදානයෙන්. කෙටියෙන්ම කියනව නම්, ලෝක සත්වයා තුන්තරා බෝධියෙන් එනම්, සම්මා සම්බෝධිය (ලොවුතුරා බුදු), පච්චේක බෝධිය (පසේ බුදු) සහ ශ්‍රාවක බෝධිය (මහ රහත්) කියන මේ තුනින් මොකකින් හරි නිවන් දකිනව නම්, ඒ සඳහා මුල පටන් ගත යුතු ආකාරය මැනෙවින් විස්තර කරන තැනක් තමයි අපදාන පාළිය කියන්නෙ.

ශ්‍රාවකයන් වහන්සේලා අතරින් ප්‍රඥාවෙන් අග්‍ර, බුදුපියාණන්වහන්සේට පමණක් ප්‍රඥාවෙන් දෙවෙනි වුන මහා ශ්‍රාවකයන් වහන්සේ නමක් ඒ කාලයේ වැඩ හිටියා. උන්වහන්සේ ගිහි කාලයේ උපතිස්ස නමිනුත්, පැවිදි වීමෙන් පසු සැරියුත් තෙරුන් වහන්සේ එහෙම නැත්නම් සාරිපුත්ත තෙරුන් වහන්සේ යන නමින් හැඳින්වුවා. උන් වහන්සේ තමයි ගෞතම බුදුපියාණන් වහන්සේගේ දකුණත් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ. උන්වහන්සේ කොහොමද මේ තත්ත්වයට එන්න මුල පටන් ගත්තෙ, මේ තරම් මහා ප්‍රඥා සම්පත්තියක් ලැබුනෙ කොහොමද කියන කාරණාවලට පිළිතුරු අපදාන පාළිය තුළින් හොයල බැලුවොත්, විවිධ වන සතුන්ගෙන්, ගස්වලින්, පොකුණුවලින් පිරුණු හිමාලය කිට්ටුව මනස්කාන්ත පරිසරයක, ලම්බක නම් පර්වතයක් මුදුනේ අසපුවක් තිබුනා. මේ අසපුවේ සුරුචි කියල තවුස් දම් පුරන යෝගියෙක් හිටියා. ඒ නිතරම ධ්‍යාන සුවයෙන් හිටපු උතුමෙක්. එතුමාට ආවතේව කරන්න, උපස්ථාන කරන්න එකල හිටපු කීර්තිමත් බ්‍රාහ්මණ කුලවලින් තවුස් දම් පුරන්න ආපු ගෝලයො 24,000 ක් හිටියා. මේ සියල්ලෝම අංග ලක්ෂණ ශාස්ත්‍රය, තමන්ගෙ බ්‍රාහ්මණ වේද සාස්ත්‍රය ආදී නොයෙක් සාස්ත්‍රවල ඉතාමත් දක්ෂයෝ.

ඒ වගේම මේ ගෝලයන් සියලු දෙනාම පංච අභිඥා ලබපු අය. අහසින් යෑම, එක එක දේවල් මැවීම ආදිය ඒ අයට ඉතාම සුළු කාර්යක්. ඒ වගේම නොයෙක් සෘද්ධි ප්‍රාතිහාර්යන් පාමින් ධ්‍යාන සුවයෙන් සුවසේ කල් ගෙවූ අය. ඒ අතරින් සමහර ගෝලයන් පිණ්ඩපාතය සඳහා අපර ගෝයානයට යනවා. තවත් සමහර අය පූර්ව විදේහයට යනවා. තවත් සමහර අය උතුරුකුරු දිවයිනට යනවා. (මේ දිවයින් ගැන, අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්.... ලිපි පෙළ යටතේ විස්තර කර ඇත.) මේ ගෝලයන් අතරින් සමහර අය, මුලින් පිරිකර අහසින් යවල ඒ අය පිටුපසින් යනවා. ගෝලයෝ විසිහතර දාහම මුළු අහසම වහගෙන. ඉතින් ගෝලයෝ එහෙම නම් ගුරුතුමා ගැන කවර කතාද?

මේ කාලය ගැන කියනව නම් අනෝමදස්සි කියන බුදුපියාණන් වහන්සේ වැඩ හිටපු කාලය. උන්වහන්සේ විවේක සුවය සඳහා හිමාලයට එක්තරා අවස්ථාවක වැඩියා. ඒ වැඩියෙත් අර සුරුචි කියන, සිල් සුවඳින් විසිරිනු තපස් දම් රකින තාපසතුමා ඉන්න ඉසව්වට. ඊළඟට එතන සමාධි සුවයෙන් වැඩ සිටියා.

මෙතනින් එහාට පැහැදිලි කරන්න කලින් තවත් කාරණයක් මතක් කරන්න ඕන. **තිලෝගුරු සම්මා සම්බුදුවරයන් වහන්සේ නමක් කිසිම තැනකට හේතු නැතිව නිකන් වඩින්නෙ නෑ. ඒක ධර්මතාවයක්.** උදේට මහා කරුණා ඥානයෙන්, ඒ වගේම තුන් කල් දක්නා නුවණින්, කාටද මට උදව් කරන්න පුළුවන්, කාවද මම අද නිවන් මාර්ගය කරා ගෙනියන්නෙ, එහෙම නැත්නම් කවදා හෝ නිවන් මාර්ගයක් විවෘත කරගන්න පුළුවන් කෙනෙක් ඉන්නවද... ආදී කාරණා සඳහා ලෝකය දිහා බලනවා. ඉතින් අනිවාර්යෙන්ම මේ තාපස තුමයි එතුමාගේ ගෝලයො ටිකයි උන්වහන්සේගේ මහා ඥානයට හසුවෙන්න ඇති. ඒ නිසා හිතාමතාම හිමාලය වෙත වැඩිය වෙන්න ඕන.

ඉතින් මේ සුරුචි කියන තවුස් තුමාත් දේහ අංග ලක්ෂණ සාස්තර ආදිය ගැන හොඳටම දැනගෙන හිටිය කෙනෙක්. ඒ නිසා මේ හිමාලය සමීපයට වැඩල ඉන්නෙ බුදුපියාණන් වහන්සේ නමක් කියල අමුතුවෙන් කියන්න දෙයක් නොතිබෙන්න ඇති. එතුමා බුදුපියාණන් වහන්සේ ගැන කරපු වර්ණනාවෙන්ම ඒක ඔප්පු වෙනවා. එතුමා බුදුපියාණන්-වහන්සේව දකින්නේ දිලිසෙන මහනෙල් මලක් වගේ, ආලෝකවත් ගින්නක් වගේ, අහසේ දකින අකුණක් වගේ. උන්වහන්සේගෙන් විහිදෙන ප්‍රභාව දකින්නේ එහෙමයි. ඊට පස්සෙ තමන්ට පුරුදු අංග ලක්ෂණ සාස්ත්‍රය අනුව මේ ඉන්නෙ බුදු කෙනෙක්ද, එහෙම නැත්නම් වෙන කවුරුවත්ද කියල හොයල බැලුවා. ඒ සාස්තර තුලින් පරතෙරට ගිය මේ උතුමාට, දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් සහ අසූවක් අනු ව්‍යංජණ ලක්ෂණවලින් යුත් මේ මහා පුරුෂයා හඳුනගන්න මහ වෙලාවක් ගියේ නෑ.

ඊට පස්සෙ මේ තාපස තුමා මල්වලින් අනෝමදස්සි බුදුපියාණන් වහන්සේ පුදල, මහා වර්ණනාවක් කරන්න පටන් ගත්තා. මොකක් ගැනද මේ වර්ණනාව කළේ? තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අසමසම සර්වඥතා ඥානය ගැන. ඒ වර්ණනාවත් විවිධාකාරයෙන් කළා.

ඔබ වහන්සේ, ලෝක සත්වයා අඳුරෙන් මුදවන මහා පහන් එළියක් වගේ. මේ මුළු සප්ත මහා සාගරයම පොඩි භාජනයකින් මනින්න පුළුවන්, ඒත් ඔබ වහන්සේ සතු සර්වඥතා ඥානය මම කොහොම මනින්නද? මේ මහ පොළව තරාදියක එක පැත්තකට දාල දරන්න පුළුවන්, ඒත් ඔබ වහන්සේගේ සර්වඥතා ඥානය කොහොම දරන්නද? මේ මුළු අහසම කුඩා නූල් කැල්ලකින් මනින්න පුළුවන්, ඒත් ඔබ වහන්සේගේ සර්වඥතා ඥානය කොහොම මනින්නද? බුද්ධ ඥානය මේ මහා සාගරයත් පරදා, මේ මහ පොළවත් පරදා යනවා. මට ඒකට උපමාවක්වත් කියා ගන්න බෑ.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, අසම සම සර්වඥතා ඥානය ගැන මේ තාපස තුමා කොහොමද වර්ණනා කළේ කියල. ඒක මෙහෙමයි හොයා

ගන්නෙ. මේ තාපසතුමත් එසේ මෙසේ කෙනෙක් නෙවෙයි. බොහෝ සාස්ත්‍රවල පරතෙරට ගියපු කෙනෙක්. ඒ වගේම පංච අභිඤ්ඤා ලබපු උත්තමයෙක්. ඕන තැනකට ඍද්ධියෙන් වඩින්න පුළුවන්. එතුමාට විශේෂ ඥාන බලයක් තිබුණා. ඒ ගැන එතුමා දැනගෙන හිටියා. ඒ ඥානය තුලින් මහා බුද්ධ ඥානය අනුමාන කළා. හරියට මේ වගේ. අපි ලුණු කැටයක් කටේ දාගෙන දැනෙන ලුණු රසය ගැන හිතනවා, ඊට පස්සෙ මහ මුහුද ගාවට ගිහින් නැවතත් හිතනවා අර පුංචි ලුණු කැටය මෙච්චර ලුණු රසනම්, මේ මහ මුහුදම ලුණු කැටයක් කරල රස බැලුවොත් කොච්චර ලුණු රසක් ඇත්ද කියල. තමන්ට අර මුළු ලුණු රසම නොතේරුනත්, ලැබුන අත්දැකීම තුලින් අර විශාල ප්‍රමාණය ගැන හිතාගන්න පුළුවන්. එහෙම නැත්නම් අනුමානයක් ඇති කරගන්න පුළුවන්. මෙන්න මේ විදියට තමයි අර තාපසතුමා අසමසම බුද්ධ ඥානය වර්ණනා කළේ.

ඊට පස්සෙ අනෝමදස්සි බුදුපියාණන්වහන්සේ සමාධියෙන් නැගී සිටියා. ඒත් එක්කම උන්වහන්සේගේ අරිහත් ශ්‍රාවකයන් වහන්සේ නමක් වූ නිසභ අරිහතුන්වහන්සේ බුදුන්වහන්සේ සමාධි සුවයෙන් නැගී සිටිය බව දැක්කා. ලක්ෂ ගණන් අරිහතුන් වහන්සේලා සමග අර තාපසතුමා ඉන්න ඉසව්වට වැඩියා. ඉන්පසු මේ අරිහතුන් වහන්සේලා සමීපයේ වැඩහුන් බුදුපියාණන් වහන්සේ සිනහ පහල කළා. උන්වහන්සේ සමීපයේ උපස්ථාන කරමින් හිටපු වරුණ නම් තෙරුන් වහන්සේ බුදුන්වහන්සේ ළඟට ඇවිත්, ස්වාමීනි ඔබ වහන්සේ සිනහ පහල කළේ ඇයි කියල විමසා සිටියා.

**බුදුපියාණන් වහන්සේ නමක් හේතුවක් නැතුව කිසි දෙයක් කරන්නෙ නෑ. ඒ උන්වහන්සේලාගේ ස්වභාවය. ඒක ධර්මතාවයක්.** තැනකට වඩිනව නම් අනිවාර්යයෙන් එතැන්ට වඩින්නෙ එක සත්වයෙක් හෝ සසරින් මුදවන්න, එහෙම නැත්නම් මතු සසරින් මිදීමට හේතු පූර්ණ කර දෙන්න මග පෙන්වන්න. එහෙම වඩින්නෙත් ඒ අයට ඒ සඳහා හේතු තියේනම් විතරයි. බුදුවරයන් වහන්සේ නමක් සිනහ පහළ කිරීමත් ඒ වගේ. අනිවාර්යයෙන් යමක් දැකලමයි සිනහ පහළ කරන්නෙ. මේක උන්වහන්සේ වටා සිටින අය දන්නවා. ඒ නිසාමයි අර වරුණ තෙරුන් වහන්සේ ඇවිත් අර විදියට විමසුවේ.

උන්වහන්සේ මේ පැණයට පිළිතුරු වශයෙන් අනාගත වාක්‍යයක් ප්‍රකාශ කළා. මට මේ මලින් පුදල, ගෞරව කරල මාගේ සර්වඥතා ඥානය ගැන විවිධාකාරයෙන් නැවත නැවත වර්ණනා කළ මේ තවුසාගේ ලැබීම ගැන අසව් යැයි උන් වහන්සේ ප්‍රකාශයක් කළා. මුලින්ම මලින් කරපු බුද්ධ පූජාවේ ආනිසංස මේ විදියට ප්‍රකාශ කළා.

මේ තවුසාට යන යන තැන ඇත්, අස්, රිය, පාබල සෙනග නිතර නිතර ලැබෙනවා. හැට දහසක් තූර්ය වාදක කණ්ඩායම්ද, බෙර වාදනය කරන්නන්ද, නිතර නිතර උවටැන් කරන්නන්ද ලැබෙනවා. දිව්‍යාංගනාවන් මෙන් ඉතාම රූබර ස්ත්‍රීන් දහසය දාහක් මොහු වට කරගෙන නිතරම සිටිනවා. කල්ප ලක්ෂයක් දෙව් ලොව ඉපදී ඒ සම්පත් බුක්ති විඳින්න ලැබෙනවා. එසේම ඒ අතර දහස් වතාවක් ශක්‍ර දේවේන්ද්‍රයන් වෙනවා. දහස් වාරයක් සක්විති රජ වෙනවා.

දැන් ප්‍රශ්නයක් එන්න පුළුවන්, මේ එක වතාවක් කරපු බුද්ධ පූජාවකට මෙච්චර ලැබෙන්නෙ කොහොමද කියල.

මුලින් සඳහන් කළා, සත්වයෙක් සසර ගමන තුල විඳින දුක් කන්දරාව. ඒක මෙච්චරයි කියල ගණනය කරන්න පුළුවන්ද? සතර අපාගත වෙලා දුක් විඳින ප්‍රමාණය මෙච්චරයි කියල ගණනය කරන්න පුළුවන්ද? බෑ. ඉතින් ඒ අප්‍රමාණ දුක් කඳකින් නිදහස් වෙන්න ක්‍රමයක් කියල දීපු උත්තමයෙකුගේ ගුණ කන්දරාව මෙච්චරයි කියල කියන්න පුළුවන්ද? අන්න අර තාපස තුමා දැක්කෙ මේ ගුණ කඳ. ඒ ගුණ කඳට තමයි පූජාව කළේ. එහෙම නැතිව පුද්ගලයෙකුට නෙවෙයි. ඉතින් ඒ අප්‍රමාණ ගුණ කඳ තමන්ගේ සිහි නුවණින් දැකල තමයි අර විදියට මල් පූජා කළේ. අප්‍රමාණයට කරපු පූජාවකට ලැබීමත් අප්‍රමාණයි. ඒක තමයි මේ ලැබීමට හේතුව.

එතකොට අර සම කරන්න බැරි සර්වඥතා ඥානය ගැන කරපු වර්ණනාවට ලැබීම කොහොමද?

අනෝමදස්සි බුදුපියාණන් වහන්සේ ඒ ගැන අවසානයේ මෙහෙම සඳහනක් කරනවා. මෙතුමාගේ අවසාන අත්බැව සාරි කියන බැමිණියකගේ කුසේ පිළිසිඳ ගන්නවා. මවගේ නාම ගෝත්‍රයෙන්, එනම් සාරි බැමිණියගේ පුතා, එහෙම නැත්නම් සාරිපුත්‍ර යන නමින් ප්‍රකට වෙනවා. මහා තීක්ෂණ ප්‍රඥාව ඇති කෙනෙක් වෙනවා. ඒ කාලයේ පහල වෙන ගෞතම නම් බුදුන් වහන්සේගේ දකුණත් සවු බවට පත්වෙනවා. ඊළඟට උන්වහන්සේ සැරියුත් හිමියන්ගේ ප්‍රඥාව ගැන උපමාවක් කියනවා. හිමාලය පටන් මහ සමුදුර දක්වා ඇති සියලුම වැලි කැට ගණන් කරල, මෙච්චරක් වැලි කැට තිබුණ කියල කියන්න පුළුවන්. ඒත් මේ සැරියුත් තෙරුන් වහන්සේගේ ප්‍රඥාව මෙතැකැයි කියල කියන්න බෑ. මහ සමුදුරේ රළ මෙපමණයි කියල ගණන් කරන්න පුළුවන්, ඒත් සැරියුත් තෙරුන් වහන්සේගේ ප්‍රඥාව කෙළවර දකින්න බෑ. ඉතින් මේ ආකාරයෙන් විවිධ උපමාවලින් සැරියුත් තෙරුන් වහන්සේගේ ප්‍රඥාව වර්ණනා කළා.

මෙහෙම ගිහින් හේතුවට අනුකූල ඵලය උන්වහන්සේට ලැබුණා. **ඉමහත් ගෞරවයෙන් ඥානයෙන් දැකල එදා අනෝමදස්සි බුදුපියාණන් වහන්සේගේ අසමසම ප්‍රඥාවට, සර්වඥතා ඥානයට ගරු කිරීමේ, වර්ණනා කිරීමේ හේතුවේ ඵලය වුනේ, ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රඥාවෙන් බුදුන් වහන්සේට පමණක් දෙවෙනි දකුණු අගසවු තනතුර ලැබීම.**

දැන් මෙතනින් හිතට ගන්න ඕන දෙයක් තියෙනවා. බුද්ධ ශාසනය **කෙරෙහි ගුණයන් දැක පැහැදීම සුළු පටු කාරණයක් නෙවෙයි.** සසර ගමනත් පහසු කරවන, අවසානයේ අමා මහ නිවනින්ම කෙලවර කර ගන්න පුළුවන් දෙයක්. හැබැයි ඒකෙ අනෙක් පැත්තත් ඒ වගේමයි. සුළු අත්වැරැද්දක් වුණත් ඒකෙන් කල්ප ලක්ෂ කෝටි ගාණක් දුගතියට යන්නත් පුළුවන්. ශාසන න්‍යාය හරි බරපතලයි. හරියට දළි පිහියෙන් කිරි පැණි කනව වගෙයි කියල කියන්නෙත් මේ හේතුව නිසා. හරි ගියොත් හරි ගියාමයි, ඒ වගේම වැරදුනොත් මහ විනාශයක්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*අපදාන පාලිය 1 - සාරිපුත්ත ථේරාපදානය ඇසුරින් සකස් කළේ*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# නිවනට පසුතලය සකසන පාරමී...

ලොවුතුරා බුද්ධත්වයට පත් වීමට දස පාරමිතා පිරීම සිදු කළ යුතු බව ඔබ අප හොඳින් දන්නා කාරණයක්. මෙතනදී පාරමිතා හෙවත් පාරමී කියන්නෙ මොකක්ද කියල පළමුවෙන්ම විග්‍රහ කරල ගත්තොත්, **මිහිරියාව කරා පෙරාගෙන පෙරාගෙන යාම තමයි පාරමී කියන්නෙ.** 'මී' යන්නෙන් දැක්වෙන දහම් අදහස තමයි මිහිරියාව. ''පාර'' කියන්නෙ මාර්ගයේ පෙරාගෙන යනවා කියන එක. මිහිරියාව හොයාගෙන, පෙරාගෙන ගියාම අවසානයේදී හමුවන මිහිරියාව තමයි නිවන. ඒ නිසා තමයි පරම සුවය නිවන කියල කිව්වෙ. නිවනට පත් වෙන තුරුම පෙරාගෙන, එළි පෙහෙළි කරගෙන යන්න ඕන. මෙහෙම පෙරාගෙන ගිහින් නිවන සම්පූර්ණ වෙච්ච දවසට පාරමී සම්පූර්ණයි. අපිට අවශ්‍ය දේ පමණක් නෙවෙයි, ලෝක සත්වයාට අවශ්‍ය දේත් පෙරල දෙනවා.

'බුද්ධො හං බෝධ ඉස්සාමී මුක්තෝ හං මෝචයේ පරේ, තින්නෝ හං තාර ඉස්සාමී, සංසාරෝගෝ මහබ්බයා' මේ සංසාර ඕගය හෙවත් මහා සැඩ පහරේ භයානකකම අවබෝධ වෙච්ච පුද්ගලයා තමන් පමණක් නෙවෙයි, අනෙක් අයටත් අවබෝධ කරල දෙන්න ඕන කියන මහා උතුම් ගුණයෙන් යුක්ත වෙනවා. තමන්ව සහ අනුන්ව නිවන කරා පෙරාගෙන යන්න අධිෂ්ඨාන කරල ඔවුන්ටත් පාර පෙන්වනවා. නිවන් මගට හේතු තියෙන යම් පුද්ගලයෙක් යම් දෘෂ්ටියකින් වැහිල කල් ගෙවනව නම්, ඒ පුද්ගලයාව නිවන් මගට ගැනීම සත්වයෙකුට කරන්න පුළුවන් ලොකුම සේවයක් කියල නිගමනය කරනවා. මේ ගුණය යම් කෙනෙකුට පවතිනවද, ඒ මාර්ගය පෙන්වීම සඳහා අවශ්‍ය වන්නා වූ ඥාන බල කල්ප කාලයක් ගිහින් පූර්ණ වුණාම ඒ කටයුත්ත කරන්න පුළුවන් වෙනවා. ලොවුතුරා බුද්ධත්වයට පත්වෙන්න පසුතලය නිර්මාණය වෙන්නෙ මේ වගේ ගුණ වඩමින්, තමනුත් අවබෝධය ලබා ගනිමින්, ලෝක සත්වයාත් දුකෙන් මුදවා ගෙන මේ සසර ගමන කෙළවර කරන ක්‍රමවේදය ලෝක සත්වයාට අවබෝධ කරල දෙනවා කියන පරම අධිෂ්ඨානය මුල් කරගෙන.

ධර්මය තුළින් නිවන කියන්නෙ මොකක්ද කියල නිගමනය කර ගත්තට පස්සෙ, නිවන අරමුණු කරගෙන ඒ නිවන කරා ගමන් කිරීමට පවතින බාධක මොනවද, නිවනේ හිත පිහිටල සුද්ධ වෙන්නෙ නැත්තෙ ඇයි, ප්‍රභාස්වර බවට පත් වෙන්නෙ නැත්තෙ ඇයි කියන ප්‍රශ්න සිතට නැගෙනවා. ආගන්තුක උපක්ලේශයන්ගෙන් සිත ග්‍රහණය වෙලා විඤ්ඤාණය බවට පත් වෙලා තියෙන නිසයි එහෙම සිද්ධ වෙන්නෙ. මේක හරියට වල් බිහි වෙච්ච විශාල පාරක් තනියම එළි පෙහෙළි කරගෙන යනව වගේ වැඩක්. එහෙනම් මේ කෙලෙස් සහිත වල් බිහි වෙච්ච කොටස් එළි පෙහෙළි කරගෙන, අන්‍යයන්ටත් තමන්ට අවබෝධ වෙච්ච ධර්මය පැහැදිලි කර දෙමින් කර



ගෙන යන වැඩ කොටස තමයි පාරමිතා කියන්නෙ. ලොවුතුරා බුද්ධත්වයට පත් වෙන පාරමිතා රටාවක් තියෙනවා. සර්වඥතා ඥානය සඳහා මනස සුද්ධ භාවයට පත් කර ගන්න, ඔප මට්ටම් කර ගන්න, වල් බිහි වෙච්ච කොටස් එළි පෙහෙළි කරගෙන, පෙරාගෙන පෙරාගෙන යා යුතු ගමන තමයි ලොවුතුරා බුද්ධත්වයට හේතු වන දස පාරමිතා කොටස කියන්නෙ.

පෘතජ්ජන මනුස්සයට ධර්මය පැහැදිලි කර දීම බොහොම අපහසු කාර්යක්. ඒ නිසා, අනෙක් අයගෙන් මට වැඩක් නෑ, තේරුම් ගන්න කෙනෙක් තේරුම් ගත්තාවේ, මම මගේ වැඩේ කරගෙන මාර්ගය පාද ගන්නවා කියල හිතන කොටසකුත් ඉන්නවා. මේ අදහස තියෙන අය පච්චේක බුද්ධ (පසේ බුදු) පාරමිතාව පුරමින් කටයුතු කරනවා.

නමුත් දයානුකම්පාව වැඩි පුද්ගලයා, තමන්ට බැන්නත් මේ වටිනා ධර්ම කොටස කොහොම හරි දෙන්න ඕන, තමන්ට බැනල හරි ධර්මයේ යම් කොටසක් තේරුම් ගත්තොත් ඒ පුද්ගලයාට කවදාහරි මිදීමක් තියේවි කියල හිතනවා. තමන්ට බුදු වෙන්න බැරි වුණත් තමන් තේරුම් ගත්ත ධර්මය තව කාට හරි අවබෝධ කරල දෙන්න ඕන කියන සිතිවිල්ල පවතින, ඒ අනුව ඒකට ගැළපෙන වැඩ පිළිවෙල කරගෙන යන පුද්ගලයන් ශ්‍රාවක පාරමිතාව පුරමින් යනවා. මේ ආකාරයට මේ අදහස් තුළින් පුද්ගලයා මාර්ගය පුරාගෙන යනවා.

මේ කුමන ආකාරයකින් හෝ නිවනට පත් වෙන්න 'පභස්වර මිදං භික්ඛවේ චිත්තං' කියන තැනට හිත පමුණුවන්න ඕන. ඒ විදියට නගන ප්‍රභාස්වර චිත්තයට තමයි යථාවබෝධය ලැබෙන්නෙ. ඒ ප්‍රභාස්වර චිත්තය සර්ව සම්පූර්ණයෙන් පහළ වුණාම යථාවබෝධයට පවතින බාධක පහ වෙනවා. විදර්ශනා නුවණ ඒ චිත්තයට පැහැදිලිව නැගෙනවා. අනිච්ච, දුක්ඛ, අනත්ත ලෙස ත්‍රිලක්ෂණය දැකල, චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමේ ප්‍රධානම පසුතලයේ පහසුකම ලෝකෝත්තර දහැන් වැඩීමෙන් සැලසෙනවා. ඒ බව ආනෙඤ්ජ සප්පාය සූත්‍රවලදී පවා පැහැදිලි කරල තියෙනවා. එතැන් පටන් එළි පෙහෙළි කරගෙන, සුද්ධ කරගෙන, පෙරාගෙන යන ගමන තමයි ශ්‍රාවක පාරමිතාවේ අග්‍ර කොටස කියන්නෙ.

ඇස්, හිස්, මස්, ලේ දන් දීලා දාන පාරමිතාව, සීල පාරමිතාව ආදී දස පාරමිතා පුරමින් කටයුතු කරන්නෙ, මතු බුදු වෙන්න බලාපොරොත්තු වෙන බෝධි සත්වයන් වහන්සේලා හැටියටයි අටුවා ආදී ග්‍රන්ථවල සඳහන් වෙන්නෙ. අනිත් අයට කරන්න තියෙන්නෙ දන් දීමෙන් අවශ්‍ය වන්නා වූ පසුතලය හදා ගැනීම. **ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ (පටිභාන ඥානය) කියන මේ පහ, නිවන් දකින කෙනෙකුට පසුතලය හදාගෙන මාර්ගය වඩන්න අවශ්‍ය වෙනවා.** ආර්ය අෂ්ටාංගික මාර්ගය පූර්ණ කර ගන්න ඕන මේ තුළින් ගොඩ නැගුණ පසුතලයක ඉඳල. මේ පසුතලය දුර්වල නම් ආර්ය මාර්ගය පූර්ණ කර ගැනීමේ හැකියාව දුර්වල වෙනවා. එතකොට මග වැඩීම ප්‍රමාද වෙනවා. ඒ ප්‍රමාදය අවම කර ගන්න, ඒ සඳහා ☞

අවශ්‍ය වන්නා වූ යම් පුණ්‍ය කටයුත්තක් කළ යුතුද, ඒක කරන්න ඕන. එහෙනම් ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ කියන දේවල් ලැබෙන්නෙ අපි කරන පින් දහම්වලින්. දන් දීම, පූජෝපහාර කිරීම, ශාසනය උදෙසා කරන ඇප උපස්ථාන ආදී නිවන් මගට හේතු කාරක වන කුසලයෙන්, පිනෙන් නිවනට අවශ්‍ය වන්නා වූ පසුතලය නිර්මාණය වෙනවා. ඒ නිසා පිං දහම් කරන්න ඕන. මේ විදියට පිං දහම් කරන කොට මේ අත්භවේදී කරන ලද එක්තරා පුණ්‍ය කොටසක් ඒකෙන් ක්‍රියාත්මක වෙනවා. ඒක අනාගතයට උපනිශ්‍රය වෙනවා. පෙර අත්බැව්වලදී කරල තිබුන නම්, මේ අත්භවයේදී ඒකට අවශ්‍ය පසුතලය හැදෙන කොට ඒවා ඇදිල එනවා. එහෙම ඇදිල ඇවිත් පුද්ගලයාගේ ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ වැඩීමක් වෙනවා. එබඳු වැඩීමක් තියෙන නුවණකින් අරි අටඟි මග අනුගමනය කරන්න මුල පුරන කොට, මනා සේ වැටහිලා ධෛර්යය ඇති වෙලා, අලසකම් බිඳිල, මාර්ගය අනුගමනය කරන්න හැකියාව මතු වෙනවා. නුවණ වැඩෙන්න පටන් ගන්නවා. මේ පැහැදිලි කළේ අරි අටඟි මග වැඩීමට අවශ්‍ය වන්නා වූ පසුතලය නිර්මාණය වෙන ආකාරය. එහෙම නැතුව මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම නෙවෙයි. මේ කාරණය පටලවා නොගත යුතුයි.

හැබැයි මේ කිව්වෙ පාරමිතා පුරන කොට විශේෂයෙන්ම වැදගත් වෙන කොටස. නමුත් එතනට එන්න පෙර, පිරිය යුතු මූලික අවස්ථාවක් තියෙනවා. පඩි පෙළක් නගිනව වගේ මුලින්ම ලෞකික ගුණ එකින් එක දක දක ඒ තුළින් සුද්ධ වෙන්න ඕන. ඒ **ලෞකික ගුණවලින් දැන ගත යුතු ඉහළම ගුණය තමයි මවු ගුණ. ඊළඟට පිය ගුණය. මවු කෙනෙකුට වඩා ලෞකික ගුණ තියෙන තව කෙනෙක් නෑ.** එතකොට ඒ මවු ගුණය මොකක්ද කියල හඳුනන්න ඕන. එහෙම හඳුන ගත්තට පස්සෙ මවු ගුණය ඒ පුද්ගලයා ළඟ තියෙනව නම්, ඒ ගුණය දෙවෙනි කරන්නෙ නෑ. ජීවිත පරදුවෙන් ඒ ගුණයට ගරු කරනවා. ඒ ගුණයට ගරු කිරීම තමයි ලෝකෝත්තර අවබෝධයට මුල් වෙන්නෙ. එතනින් එහාට තියෙන පඩියෙන් තමයි බලවත් දස පාරමී ගුණ වැඩීම ආරම්භ වෙන්නෙ. ලෝකෝත්තර දහම අවබෝධ වෙන්නෙ, කවද හරි මේ කියන මට්ටමේ ලෞකික ගුණයට ගරු කරන්න ජීවිත පරදුවෙන් කටයුතු කරන කෙනෙකුට. ඒ නිසා තමයි අපේ බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලයේ තමන්ගෙ මව කර පිට තියාගෙන පිහිනීමේ කතාවක් මේ පාරමිතා පිරීමට සම්බන්ධ වෙන්නෙ.

අනෙක් කෙනෙක් වුණත් ලෞකික ගුණ අතරින් වැඩිය යුතු ඉහළම ගුණය තමයි මවු ගුණ. ඒ මට්ටමට ගුණ වැඩුණු කෙනෙකුට තමයි ඒ ලැබෙන සුද්ධතාවයෙන් ලෝකෝත්තර පැත්තට නැඹුරු වන අවබෝධයට මුල පුරන්න හේතු වෙන්නෙ. **කවදහරි මේ ගුණයට ආපු කෙනෙක් ලේසියෙන් පිරිහෙන්නෙ නෑ, ගැඹුරු විනාශයකට වැටෙන්නෙ නෑ.** ඒ තත්ත්වයට පත් වෙලා තමයි බුදු දහම තේරුම් ගන්න පුළුවන් මානසිකත්වය උදා වෙන්නෙ. එහෙම නැති කෙනෙකුට ගල මතු පිට කැඳ වත් කළා වගේ, අහන බණ ලිස්සල යනව මිසක් හිතේ පිහිටන්නෙ නෑ.

මෙතනිනුත් පිය ගුණයට වඩා මවු ගුණය විශේෂයි. පිය ගුණයෙන් ඇවිත් තමයි මවු ගුණයට එන්න ඕන. ඒ තමයි උපරිම ලෞකික ගුණය. එයින් එහාට තවත් ලෞකික ගුණයක් නෑ. නමුත් ඊටත් ඉහළින් තමයි ලෝකෝත්තර වන බුද්ධ ශ්‍රාවක ගුණ තියෙන්නෙ. ඒක මවු පිය ගුණයටත් වඩා ඉහළයි. වැද්දෙක් වෙලා හරි, ශ්‍රාවකයන් වහන්සේ කෙනෙක් කෙරෙහි වන්දනා මාන කිරීම එන්නෙ මවු පිය ගුණයටත් පස්සෙ. පෙර තිරිසනෙක් වෙලා හිටියත්, දැන් මනුස්සයෙක් නම් මුල් අවස්ථාවේ ඒ ගුණය තිබිල තියෙන්න ඕන. සමහර විට ඒක බාහිරින් වැහිල අභ්‍යන්තරයේ සැඟවිලා තියෙන්න පුළුවන්. එහෙම වැඩිච්ච නැති කෙනෙකුට එතැනින් එහාට යන්න බෑ.

සමහරු කියනවා නිවන් දකින්න ඕන නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයම වඩන්න, වෙනත් දේවල් නොකළ යුතුයි කියල. මෙතනදී වෙනත් දේවල් කියල අදහස් කරන පුණ්‍ය කටයුතු කරල නිවන් ලබන්න බැහැ කියන්නෙ, තම තමන්ගේ දැනීමේ තියෙන අඩුපාඩුවක් නිසා. මාර්ගය වැඩීම කරන්න ඕන තමයි. නමුත් මාර්ගයට වැටෙන්න අවශ්‍ය වන්නා වූ පසුතලය නිර්මාණය කර ගැනීම තමන් සතු කාර්යක්. ආර්යන් උදෙසා පැහැදුණු සිතින් ගරු සත්කාර වගේම ඇප උපස්ථාන කිරීම, දන් දීම, පුණ්‍ය කටයුතුවල යෙදී කටයුතු කිරීම ආදී කුසල කටයුතුවලින් ඒ පසුතලය නිර්මාණය වීමක් සිද්ධ වෙනවා. ඒ නිසා පිං කුසල් අනිවාර්යෙන්ම කළ යුතු වෙනවා. මේ විදියට පිං කුසල් කිරීමෙන් ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ කියන දේවල් ලැබෙන්න හේතු වෙනවා. ඉතිං නිවන් ලබන්න මේ ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ තියෙන්න ඕන.

මෙතනදී ආයුස කිව්වම, ලෞකික වශයෙන් හෙවත් සාමාන්‍යයෙන් කතා කරන ආයුස නෙවෙයි මේ කියන්නෙ. ඊට වඩා විශේෂයක් මේකෙන් කියවෙනවා. පමාදෝ මච්චුනෝපදං කිව්වම, ප්‍රමාද වෙච්ච පුද්ගලයා මැරිච්ච පුද්ගලයෙක් වගෙයි. අප්පමාදෝ අමතපදං කිව්වම, ඒ අප්‍රමාද වෙච්ච තැන් පටන් තමයි ආයුස වැඩෙන්නෙ. ඒ අර්ථයෙන් තමයි ආයුස කියන එක ගන්න ඕන. ''**අදමින් ජීවත් වෙනවා විතරට - දැහැමින් මිය යනු සොඳමයි දන හට**'' අධර්මයෙන් ජීවත් වෙනවට වඩා දැහැමින් ජීවත් වෙලා මිය යාම හොඳයි කියල ධර්මයේ පෙන්වා තියෙනවා. මෙන්න මේ වගේ **දැහැමින් ජීවත් වෙන එක දවසත් නියම ආයුසක්. ඒක අධර්මයෙන් ජීවත් වෙන අවුරුදු 100 ටත් වඩා වටිනවා.**

ඊළඟට මෙතනදී වර්ණ කියල කිව්වෙ කළු, සුදු, තලෙළු කියන දේවල් නෙවෙයි. අපි කෙනෙකුට කියනවා 'ඔහු හරි පිං පාටයි, හරි කරුණාවන්ත පාටයි….'' ආදී වශයෙන්. මේ පාටයි (වර්ණ) කියල හැඳින්නුවෙ, යම් පුද්ගලයෙක් සතු කායික මානසික ප්‍රබෝධය. ප්‍රබෝධය නැත්නම් මලානික වෙනවා, නිදි මත එනවා, කේන්ති යනවා. එහෙනම් වර්ණවත් වෙන්න ඕන ධර්මයෙන්, ගුණයෙන්. ධර්මයක්, ගුණයක් ඇහෙන කොට ඒ කෙරෙහි ප්‍රබෝධ වෙන්න ඕන. ඒ ප්‍රබෝධයෙන් කායික හා මානසිකත්වයේ ඇති වන ස්වභාවය තමයි වර්ණ කියන්නෙ. සමහර අයට ගුණයක් ඇහෙන කොට හරි කටුකයි. ඒ වගේ දෙයක් අහන්න කැමති නෑ. තවත් සමහරෙක් ගුණ අහන කොට හරි ප්‍රබෝධයි, සැහැල්ලුයි, නිදි මත නෑ, චිත්ත ප්‍රසාදය එනවා. ඒ ගතිය තමයි වර්ණ කියන්නෙ.

සැප කිව්වමත් කායික, මානසික සැපයක් තියෙනවා. නමුත් මේ කියන්නෙ පංච කාම සැප නෙවෙයි. මෙතනදී ප්‍රධාන වශයෙන්ම දැහැන් සුවය තමයි වැදගත් වෙන්නෙ. උපචාර දැහැනක හෝ සුවයක් තියෙන්න ඕන. ඒ වගේම දහමට හිත තිව්වම ඇති වන කායික මානසික නිදහස් බව, නිරාමිස ප්‍රීතිය නිසා හටගන්නා සැහැල්ලුව, පස්සද්දිය, ඒ නිසා හට ගන්නා සුවය. ඒ සුවය තමයි මෙතනදී විශේෂ වෙන්නෙ. එහෙම නැතිව නිකං කාම සුවය නෙවෙයි.

ඊළඟට බලය කියන්නෙත් ශරීරයේ තියෙන යෝධ බලය, කායික ශක්තිය නෙවෙයි. ඒ බලයත් වෙන පැත්තකින් නිවනට උපනිශ්‍රය වෙන්න පුළුවන්. නමුත් මෙතනදී ලෝකෝත්තර වශයෙන් නියම බලය කියන්නෙ ශ්‍රද්ධා බල, වීර්ය බල, සති බල, සමාධි බල හා ප්‍රඥා බල කියන මේ පහ තමයි.

පටිභාන නුවණ කියන්නෙ අපි එදිනෙදා ජීවිතයේදී වැඩ කටයුතු කරන කොට තියෙන ලෞකික නුවණ නෙවෙයි. මේ සංසාරයට සත්වයා බැඳල තියෙන දස සංයෝජන ධර්ම කියන පටි, හංග

කරල දාන්න අවශ්‍ය වෙන නුවණ තමයි පටිභාන නුවණ කියන්නෙ. ඒ නුවණින් තමයි කෙලින්ම චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න පුළුවන් වෙන්නෙ.

''මා භික්ඛවේ පුඤ්ඤානං භායිත්ත සුඛස්සේතං භික්ඛවේ අධිවචනං පුඤ්ඤන්ති" මහණෙනි, පිනට බිය වෙන්න එපා, සුඛයට කියන තවත් නමක් තමයි පින කියන්නේ (මඛාදේව සූත්‍රය). ඒ නිසා පිනට බිය විය යුතු නෑ, එය අරි අටඟි මග අනුගමනය කරන්න පිටිවහලක් මිසක් බාධකයක් වෙන්නෙ නෑ. මේ විදියට බුදුන් වහන්සේ පෙන්වා දෙනවා. ''සුමනාවනි, දන් දිය යුතුමය, පිං කළ යුතුමය, දෙවි වූ අයටත් මිනිස් වූ අයටත් ශ්‍රමණ වූ අයටත් නිවන් අවබෝධ කරන තුරුම පින උපකාරී වේ'' (සුමනා සූත්‍රය). බුදුන් වහන්සේ එක් අවස්ථාවක සුමනා උපාසිකාවට මෙහෙම දේශනා කරනවා. පුණ්‍ය කටයුතු කිරීම තුළින් ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ ලබල ඒවා පසුතලය කරගෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන්න ඕන. එහෙම නැත්නම් මග වැඩීමට අපහසුතාවයන් ඇතිවෙන්න පුළුවන්. උදාහරණයක් විදියට විදර්ශනා භාවනා කරන්න ගියාම නොයෙක් ආබාධයන් මතු වෙන්න ඉඩ තියෙනවා. කැරකිලි, ක්ලාන්ත ගති, හිරවීම් ආදිය සිද්ධ වෙන්න පුළුවන්. ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ කියන මේ දේවල්වල යම් අඩුපාඩුවක් තිබුණම ඒ වගේ බාධක එනවා. එහෙම අඩුපාඩුවක් තියෙනව නම්, ඒකට අවශ්‍ය වන්නා වූ වැඩ කොටස පළමුවෙන්ම කළ යුතුයි. **අමතක වීම, දැනීම් නැති වී යාම, යමක් අවබෝධ කර ගැනීමේ ශක්තියේ අඩුපාඩුවක් පැවතීම ආදී දුර්වලකම් පවතින කොට දැක ගැනීමට, වටහා ගැනීමට උපකාරී වන යම් දෙයක් ආර්යන් උදෙසා පූජා කිරීමෙන් තමන්ට ලැබෙන්නා වූ පින තුළින්, අර අඩුපාඩුකම් අවම කර ගන්න උපනිශ්‍රයක් ලැබෙන ක්‍රමවේදයක් තියෙනවා.**

උදාහරණයක් විදියට ආර්යන් උදෙසා කරන පහන් ආලෝක පූජාවෙන් ප්‍රඥාව ලැබෙනවා. බුදුන් වහන්සේගේ නමින් ආමන්ත්‍රණය කරල පහනක් පත්තු කරන දේ නෙවෙයි මේ කියන්නෙ. උදාහරණ විදියට යම් ආර්ය කෙනෙක් ඉතා දුෂ්කර පරිසරයක වැඩ වාසය කරන කොට ඒ වැඩ වසන ස්ථානයට යන්න පාරක් නැත්නම්, රාත්‍රියට ගමන් කරන්න ආලෝකයක් නැත්නම් වැඩ වාසය කරන ස්ථානය අවට ආලෝකය ලබා දීම, ආලෝක පහන් කණු ඉදි කර දීම, මාර්ගය එළි පෙහෙළි කර දීම ආදී කටයුතු පැහැදුණු සිතින් කිරීමෙන්, එසේ පවතින්නා වූ දුර්වලතාවයන් අවම කර ගන්න පුළුවන් වෙනවා. එමගින් අරි අටඟි මග පූර්ණ කර ගන්න තමන්ට පවතින බාධක අවම වෙනවා.

ඒ වගේම භාවනා කරන කොට සමහරුන්ට නිතර බඩගිනි එනවා, ශරීරය අප්‍රාණික වෙනවා. පෙර සසරේ හෝ මේ භවයේ දන් දීම්වල තිබුණු ශක්තියේ අඩුකම නිසා එවැනි බාධක එනවා. දන් දීමේ ශක්තිය නොඅඩුව තිබුණ නම් චිත්තජ රූප නැගිල හරි, අර බඩගින්න නැති වෙලා ප්‍රබෝධය ඇති කරවනවා. බඩගින්න නැතිව, ශරීරයට අප්‍රාණික ස්වභාවයකුත් නැතිව දවස් ගාණක් ප්‍රීතිය ආහාරය කරගෙන ඉන්නත් හැකියාව ලැබෙන්න පුළුවන්. පිනේ පිං ඵලයක් ලෙස ප්‍රීතිය ආහාරය කරමින් චිත්තජ ආහාර නිපදවනවා. එක් බත් පිඬක් පමණක් ආහාරයට අරගෙන දවස් කීපයක් වුණත් භාවනානුයෝගීව ඉන්න හැකියාව ලබා දෙනවා. කයට දුබලතාවයක් නොලබා ප්‍රබෝධමත්ව සිටීමට පවා හැකියාව ලැබෙන මේ ආකාරයේ වූ ක්‍රමවේදයක් තියෙනවා.

මේ විදියට ආයු, වර්ණ, සැප, බල, නුවණ කියන දේවල් පවතින කොට නිවන් මග වඩා ගැනීමේ පසුතලය හදා ගැනීමට රුකුල් වෙනවා. ඒ නිසා අප්‍රමාදීව පිං කරන්න ඕන. කොච්චර පිං දහම් කළත් වැඩි වෙන්නෙ නෑ. වැඩියෙන් පිං කළොත් නිවන් මගට බාධක අඩු වෙනවා. කොච්චර පිං කළත් හේතුවේ ඵලයක් විදියට ඒක තමන්ට මතුවට උදව්වක් උපකාරයක් මිසක් බාධකයක් වෙන්නෙ නෑ කියන කාරණය අවබෝධ කර ගන්න ඕන. නමුත් ප්‍රඥාව වැඩුණු ආර්යන් වහන්සේලා, තමන්ගෙ වැඩේ දැන් ඉවරයි කියල, අන් අයගෙන් තමන්ට වැඩක් නෑ කියල හිතන්නෙ නෑ. තමන් ආපු මාර්ගය අන්‍යයන්ටත් පෙන්වල, ඒ අයට සසර දුකින් ගොඩවෙන්න මාර්ගය පෙන්වල දෙන යුතුකම උන්වහන්සේලා නොපිරිහෙළා ඉටු කරනවා. මේ නිසා අරිහත්වයට පත් වෙලා හිටියත්, දාන පූජා දෙන කෙනාට දයානුකම්පාවෙන් උදව් උපකාර කිරීම අරිහතුන් වහන්සේලාගේ ලක්ෂණයක්. ඒ නිසා තමන් පාරමී පුරන ගමන් අනෙක් අයටත් අත හිත දීල වැඩ කටයුතු කරන්න ඕන. එතකොට නිවන් මාර්ගයට තියෙන බාධක අඩු වෙලා මග වඩා ගන්න හේතු හැදෙනවා.

වර්තමානයේ බුදු බව පතන ඇත්තන් පිළිබඳව නිතර නිතර අහන්න ලැබෙනවා. රජ කෙනෙක් තුළ පවතින පෘතජ්ජන ගතිය නිසා ඕනෑම අං තට්ටුවක් පළඳින්න සැදී පැහැදී සිටිනවා වගේ, තමන් ගුණවතෙක් කියල හිතාගෙන ආත්ම දෘෂ්ටියෙන් අරගෙන බුදු බව පතන කෙනෙක් බවට පත් වෙලා, එක්තරා පිරිසක් හදාගෙන, එක්තරා බෝධි සත්වයින් වහන්සේ නමක් වගේ ක්‍රියා කරනවා. නමුත් මේ ආකාරයට බුදු බව පැතීම් සිද්ධ කළත් හරවත්ව, බුදු බව තේරුම් අරගෙන පතන අය ඉන්නව නම් දාහකට එක් කෙනෙක්වත් නෑ. බුදුන් වහන්සේ පෙන්වා දුන් නිවන් මග පැත්තකට දාල මේ වගේ දේවල් කිරීම, හරියට අතේ ඉන්න කුරුල්ල අත් හැරල ඉගිල්ලෙන උකුස්සන්ට අත දික් කරනව වගේ වැඩක්. තමන් ජීවත් වෙන පවුලේ කීපදෙනා සමගවත් හොඳින් ඉන්න බැරි අය, මේ ලෝකෙ තියෙන සියලු අවුල්වලට මුහුණ දීල බුදු බව පතන්න හදනවා. මොන බාධක ආවත්, දස මාර බල සේනා ආවත් තමන් කම්පා වෙන්නෙ නැති කෙනෙක් කියල පෙන්වන්න හදන, එතැන හිත පිහිටුවන්න උත්සාහ කරන පිරිස් ඉන්නවා. මේක හරිම භයානකයි. **හේතු නැතුව පැතුම් පතාගෙන ගියාම දකින්න තියෙන නිවනත් ඈහිරෙනවා. අන්තිමට බුදු බවත් නෑ, නිවනත් නෑ.**

**කෙනෙක් හේතු ඇතුව බුදු බව පතාගෙන පෙර සසරේ පටන් පිං දහම් කටයුතු කරගෙන ආව නම්, ඒ පුද්ගලයා අරිහත්වයට පත් වෙන්න කොච්චර උත්සාහ කළත් ඒ ඵලය ලැබෙන්නෙ නෑ. නමුත් ගුණ වැඩෙනවා.** ඒ උත්සාහය ගඟට කැපුව ඉනි වගේ අපතෙ යන්නෙ නෑ. ඒක වීර්ය පාරමිතා ගුණ සපුරන්න හේතු වෙනවා. විවරණ 23 ක් ලබා ගත්ත ගෞතම බෝධි සත්වයින් වහන්සේ, ජෝතිපාල මානවක විදියට එක් අත්භවයක ඉපිදිලා, මහණ වෙලා අරිහත්වයට පත් වෙන්න උත්සාහ ගත්තා. ඒ අවස්ථාවේදී අරිහත්වයට පත් වෙන්න උන් වහන්සේට සීලයෙන්වත්, සමාධියෙන්වත් අඩුවක්, බාධකයක් තිබුනෙ නෑ. එහෙනම් ඇයි තමන්ට අරිහත්වය වැඩෙන්නෙ නැත්තෙ කියන ප්‍රශ්නය උන් වහන්සේ ඒ කාලයේ වැඩ හිටපු කාශ්‍යප බුදුන් වහන්සේගෙන් විමසුවා. එතකොට කාශ්‍යප බුදුන් වහන්සේ, මතු බුදු බව සඳහා විවරණ ලබා සිටින්නේ ඔබ වහන්සේ බවත්, ඒ නිසා අරිහත්වය ලැබෙන්නෙ නැති බවත් පෙන්වා දුන්නා. මේ විදියට 24 වැනි විවරණයත් කාශ්‍යප බුදුන් වහන්සේගෙන් ජෝතිපාල මානවකට (ගෞතම බෝධිසත්වයන් වහන්සේට) ලැබුණා. හැබැයි එතකල්ම ජෝතිපාල මානවක මහණ වෙලා හිටියත්, තමන් බුදු බව පතා ගෙන යන බව දැන ගෙන හිටියෙ නෑ. ඒ නිසා හදිසි වෙන්නෙ නැතුව, මනුස්ස අත්භවයක් ලබපු අවස්ථාවෙන් ලෝක යථාර්ථය අවබෝධ කරගෙන දහම් අවබෝධය ලබන්න උත්සාහ ගන්න ඕන.

*වෙහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරී**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

# මල් පූජාවෙන් නිවන් දකින හැටි

ප්‍රහනක් උපමා කරගෙන නිවන් දකින පහන් පූජාවක් කරන හැටි පසුගිය කලාපයෙන් විස්තර කළා. ඒ වගේම ඥාන සම්ප්‍රයුක්තව මල් පූජා කරලත් නිවන් දකින්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. ශාසන මාර්ගයට බහින කොට පළමුවෙන්ම ඇතුල් වෙන්න ඕන සීල ශාසනයට. **ප්‍රඥාවෙන් තොර සීලයක් නෑ. ඒ වගේම සීලයෙන් තොර ප්‍රඥාවක් නෑ.** බමුණු ධර්මය අනුව පරම්පරාවෙන් ගෙනා කරුණුවලින්, බමුණෙකු විසින් අත් හැරිය යුතු සහ අත් නොහැරිය යුතු, බමුණෙකුට සුදුසු කාරණා විමසීමේදී මේ කාරණා එකිනෙකට අත්වැල් බැඳගත්තු කාරණා දෙකක් බවත්, එය නිතර සිහි කළ යුතු බවත් ධර්මයේ සඳහන් වෙනවා. බමුණෙක් වෙන්න නම් මවු පිය පරම්පරා 7 ක් ආපස්සට පාරිශුද්ධ විය යුතු බව බමුණන් විසින් තීරණය කරල තිබුණා. ඒක තමයි අත් හරින්න කියල කිව්වෙ. ඒ වගේම සීලය හා ප්‍රඥාව තිබිය යුතු බවත් බමුණන් විසින් තීරණය කරල තිබුණා. ඒ කාරණා 2 තමයි අත් නොහැරිය යුතුයි කියල කිව්වෙ. උදාහරණ උපමා සසඳමින් සීල ගුණ තේරුම් අරගෙන අනුගමනය කිරීම තමයි ප්‍රඥා සහගත සීල මාර්ගය කියන්නෙ.

අනාදියේ පටන් සත්වයා දුසිල් බවට ඇද දමන, සීල ගුණ අකා මකා දමන පළමු බාධකය තමයි කාමය. පළමුවෙන්ම ලස්සන දැකල, සුවඳට ළං වෙලා, මුදු පහසට බැඳිල, කාම රොන් පහස ලබල, ආස්වාද පැණි බීල මත් වෙන බඹරුන් බිඟුන් වගේ, මනුස්සයත් මාර තොණ්ඩු පහකින් බැඳිච්ච කාම භවයට බැස ගන්නවා. තණ්හාවෙන් ඇලෙනවා. උපාදානයෙන් බැඳෙනවා. කාම තරඟයෙන් කාම වස්තු ලබාගන්න කාම පොර පිටියට බැස ගන්නවා. ඒවා මම කරගන්න, මගෙ කරගන්න නොයෙක් නොපනත්කම් කරනවා. දස අකුසලයට බැස ගන්නවා. මෙතනදී මුල කැපුවොත් අග ලියලන්නෙ නෑ. හැබැයි මුල නොකපා අග කපන්න ගියොත් පඳුරු දමමින් ලියලනවා. මෙන්න මේ වගේ ලෝක මුලාවට සත්වයා ඇදෙන ආකාරය දැක බලාගන්න මල් හොඳ උපමාවක් වෙනවා. මේ උපමාව විග්‍රහ කරල බලන්න ඕන.

මල් උයනකට ගියොත් දකින්න තියෙන්නෙ මොනවද? මල් ගස් තියෙනවා. මල් වැල් තියෙනවා. ඒ ගස් වැල්වල යන්තම් පබළු වගේ හැදිච්ච පුංචි මල් කැකුළු තියෙනවා. ඊට වඩා ටිකක් ලොකු ලොකු මල් කැකුළු තියෙනවා. හොඳ හැඩට, ලස්සන පාටට, සුවඳ විහිදෙන පිපුණ මල් තියෙනවා. පිපුණ මල්වල තියෙන සුවඳ, ලස්සන පාට, රොන්සුණු, පැණි වගේ දේවල් මල් කැකුළුවල නෑ. මල් වටේ කැරකි කැරකි සුවඳ ඉව කරල බඹරුන්, මී මැස්සන්, සමනලුන් වගේ කෘමි සතුන් ඇවිත් පිපුණ මල් මත වහනවා. සුමුදු පෙති කනවා. රොන්සුණු කනවා. පැණි ටික උරා බොනවා. ටික වෙලාවකින් ඉගිල්ලිලා යනවා. මේ විදියට බඹරු මී මැස්සො ආදී සතුන් ඉගිල්ලිලා ගිහින් පැයක් දෙකක් ගතවෙච්ච මල් තියෙනවා. ඒව මලානික වෙලා, ලස්සන අඩුවෙලා. ඒ වගේ තවත් දවසක් විතර ගතවෙච්ච මල් තියෙනවා. ඒවායේ සමහර පෙති පරවෙලා, හැලිලා. පිපුණ මලේ තිබුණ ලස්සන සිත් ඇද ගන්නා ගතිය, සුවඳ, රොන්සුණු, පැණි වගේ දේවල් දැන් මොකුත් නෑ. තවත් දවසක් දෙකක් ගතවෙච්ච මල් තියෙනවා. ඒවායේ මල් පෙති වේලිලා, නටුව අග පුංචි කරලක්, ගෙඩියක් හැදෙන්න පටන් අරගෙන තියෙනවා. ඒ ගෙඩි කරල් ටිකෙන් ටික මෝරල තියෙන අවස්ථාත් දකින්න පුළුවන්. සමහර ගස්වැල්වල කීප වතාවක් ගෙඩි, කරල් මෝරල ඒ ගස් වැල් මැරී යමින් තියෙනවා. සමහර ගස් වැල් මැරිල.



දැන් මේ දැක්ක දේවල් අපේ ජීවිත ලෝකයට උපමා කරල බැලුවොත් මේ මනුස්ස මල් උයනෙ පුරුෂයො, ඒ මල්ගස් වගේ. ස්ත්‍රීන් මල්වැල් වගේ. ගස් වැල්වල තිබුණ පබළු තරම් පුංචි මල් කැකුළු වගේ ළදරුවො ඉන්නවා, ළදරු අඟපසඟ තියෙනවා. ඊට ටිකක් ලොකු මල් කැකුළු වගේ ළමා, ගැටවර අවස්ථා ගත කරන පිරිසක් ඉන්නවා. ලස්සන පාටට, හැඩට, සුවඳට පිපුණ මල් වගේ තරුණ තරුණියන් ඉන්නවා. මේ අයගෙ ඇස, කන, දිව, නාසය, කය, මන කියන ඉඳුරන් හරියට මල් පොකුරු වගෙයි. මේ ඉඳුරන් වටා සැරි සරන, ඒවාට ගෝචර වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්‍ම මල්වල තියෙන රොන්සුණු වගෙයි. මලේ ලස්සන දැකල මලට ඇවිත් සුවඳට වසඟ වෙලා, රොන්සුණු, පැණි බීල මත් වෙලා, මල් පෙතිවල මුදු පහසට කැමැත්තෙන් බැඳිල, ඒ මත ලැගල ටික වෙලාවකින් බඹරුන් බිඟුන් ඉගිල්ලිලා යනවා.

තරුණ තරුණියනුත් එකිනෙකාගේ රූපයට, කටහඬට, සුවඳට, මුදු පහසට කැමැත්තෙන් බැඳෙනවා. දැන් මේ බැඳීම හේතුවෙන් කාම බීජයන් හදවතේ තැන්පත් වෙනවා. මතු මතුත් මේ රූපය දකින්න, කටහඬ අහන්න, මුදු පහස විඳින්න, කාම රස විඳින්න ඇතිවුන කැමැත්ත තමයි කාම බීජ කිව්වෙ. මලට ආව කෘමි සත්තු නිකම්ම ආපහු ඉගිලිලා ගියේ නෑ. එතැන පරාග පෝෂණය කියන සංසිද්ධිය සිදු කරලයි ගියේ. ඒ හේතුවෙන් එතැන ගෙඩි කරල් හට ගන්නවා. මල් කැකුළු මෝරල පිපෙන්න ගස වැල පෝෂණය උර උරා දුන්න වගේ, දැන් ගෙඩි කරල් ☞

මෝරන්න පෝෂණය උර උරා දෙනවා. මේ විදියට පරපුර බෝ කරන බීජ මෝරන්න පෝෂණය උර උරා දීල ගස් වැල් මැරිල යනවා. නමුත් මෝරපු බීජ පසේ නොයෙක් තැන්වලට විසිරිලා පැතිරිලා යන්න තවත් උපක්‍රමයක් හැදෙනවා. ගෙඩිය, කරල මෝරන කාලෙට නැවතත් වරේට ලස්සන පාටක් එනවා. සුවඳක් විහිදෙනවා. ලස්සන පාටට, හැඩට, සුවඳට රැවටිලා ඇදිල එන කුරුල්ලන් වගේ සත්තු ඒවා ගිල දමනවා. කොහේ හරි ගිහින් පහරපුවම අර බීජ පොලවට වැටිල ගස් වැල් පරපුර හදනවා. මේක තමයි ගස් වැල් ලස්සනට, සුවඳට, හැඩට මල් පිපෙන පරපුර බෝ කරන මාර උගුල.

රූපෙට, කටහඬට, සුවඳට, මුදු පහසට බැඳෙන තරුණ තරුණියන්ටත් මේ වගේ මාර උගුලක් හැදෙනවා. මෙලොව වශයෙන් දරු පරපුරක් හදන්න වෙනවා. ඒ දරු පරපුර තමන්ගෙ කරගෙන, තමන්ට ඕන හැටියට දියුණු කරන්න, උගන්වන්න, පෝෂණය කරන්න අප්‍රමාණ වෙහෙස විඳිනවා, දුක් විඳිනවා. ඒ බලාපොරොත්තු ඉෂ්ට කරගන්න බාධා එනකොට රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් බැඳීගෙන කටයුතු කරනවා. ඒ සංඛාරවල විපාක විඳිනවා. නමුත් ඒ විඳින දුක්, ආස්වාදය පසුපස ඇදිල ආව ආදීනවයක් කියල දකින්නෙ නෑ. චතුරාර්‍ය සත්‍යය නොදැනීම - අවිද්‍යාව එක්ක බැඳුන තණ්හාව නිසා, **දුක ආස්වාදයෙන් වැසී යන නිසා ආදීනවය නොපෙනී යනවා.** පෘථජ්ජන ස්වභාවය තමයි තමන් සහ අනෙක් අය සංසන්දනය කිරීම. හැම දේම බලන්නෙ මෙන්න මේ සාපේක්ෂතාවය මුල් කරගෙන. ලෝකෙ අනිත් හැම දෙනාටමත් එහෙමයි. තමන් විතරක් විඳින දුකක් නෙවෙයි. ලෝක සත්වයා, දුක ආස්වාදයෙන් වහගෙන ආදීනවය නොදැකීමෙන් නැවත නැවත දුකට පත් වෙනවා. ඒ නිසා දරු පරපුර පෝෂණය කරන්න, රැක බලාගන්න දුක් විඳල, වෙහෙස වෙලා තමන්ට ලැබුණ වටිනා මිනිස් ජීවිතය, දුර්ලභ වූ මිනිස් බව නිකම්ම මෝරල දිරාපත් වෙලා මැරිල යනවා. හරියට මල් පුදින්න, ගෙඩි කරල් මෝරන්න පෝෂණය උර උරා දීල ගස්වැල් මැරිල වේලිලා ගියා වගේ.

කය මැරිල ගියත් රූපෙට, කටහඬට, සුවඳට, මුදු පහසට කැමැත්තෙන් බැඳුන හේතුවෙන් කාම බීජ හදවතේ තැන්පත් වෙලා. මතු මතුත් ආස්වාද විඳින්න බලාපොරොත්තුව තියපු හේතුවෙන් ගොඩ නැගුන ශක්තිය ක්‍රියාත්මක වෙලා. ඒ කැමති දේ ළංකර දෙන්න මතු භවයක් සකස් වෙනවා. භවයක් හටගත්තොත් ඒකට උරුම ජාතියක්, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන මහා දුක් ගිනි කඳ උදා කර දෙනවා. මතු උපතක් ලබන්න සිද්ධ වෙනවා.

මල් ගස් ළඟ ඉඳන් අපි මේ ටික සිහි කරල මල් කැඩුවොත්, ඒකත් ජීවිතයට උපමා කරල බලන්න ඕන. නටුවෙන් මල් කැඩුවම ගෙඩි කරල් හටගන්නෙ නෑ. බීජ සකස් වෙන්නෙ නෑ. බීජ නැත්නම් ගස් වැල් පරපුර මෙතනින් අවසන් වෙනවා. හේතුව නැත්නම් ඵලයක් ඇතිවෙන්නෙ නෑ. ඒ වගේ මේ රූපෙට, කටහඬට (ශබ්දයට), සුවඳට (ගන්ධයට), කාම රසයට (රස), මුදු පහසට (ස්පර්ශයට) බැඳෙන්නෙ නැතිව, ලෝක සම්මත චාරිත්‍රයක් හැටියට තරුණ වයසෙදි ආවාහයක් විවාහයක් කර ගන්නවා. **විවාහයක් කරගන්න කොට සොයා බලන්න ඕන කරුණු තුනක් ගැන** බුදු පියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ **ආවාහ විවාහ වෙන දෙපල සම සීල ගුණයෙන්, සම ත්‍යාග ගුණයෙන්, සම ප්‍රඥා ගුණයෙන් යුක්ත වෙනවද කියන කාරණය.** උතුම් බුදු පදවි ලැබුවෙත් මනුස්සයෙක් වෙලා ඉපදීමෙන්. ඒ උතුම් ආර්‍ය මාර්ගයේ යන පිරිසට මනුස්සයෙක් වෙලා උපදින්න යම් පින්වත් දෙමවුපිය පිරිසක් ඉන්න ඕන. ඒ නිසා එබඳු පින්වත් පිරිසට උපකාර පිණිස දරුවන් හදනවා. ඒ අයට ජීවත් වෙන්න වැඩ පිළිවෙලක් හදාගන්න ශිල්ප ශාස්ත්‍ර උගන්වනවා. දිනන්න, තරඟ කරන්න, අන් අයට වඩා ඉහළින් ඉන්දන්න නෙවෙයි. පින්වන්ත ගුණවන්ත දරුවො කොහොමත් ඉහළින් ඉන්නවා. හැබැයි ඒ, මේ ලෝකෙට බැඳෙන තරඟ වැඩ පිළිවෙලේ නෙවෙයි. ලෝකෙන් එතෙර වෙන ගුණවත් නැණවත්කමේ ඉහළින් ඉන්නවා. ඒ අය තමන්ගෙ කරගන්න, තමන්ට ඕන හැටියට උගන්වන්න ඕන නෑ. මවු-පිය දූ දරු සබඳතාවය ගැන මේ විදියට දැනුවත් වුනා නම්, තමන්ටත් ආර්ය මාර්ගයේ යන්න උපකාර කරන පින්වත් දරුවන් ඇති දෙමවුපියන් වෙන්න පුළුවන්.

කාම බීජයට හේතු වන අවිද්‍යා, තණ්හා නිරෝධ කළොත් මතු උපත නවතිනවා. මේ හේතුව නිසයි මේ ඵලය හට ගන්නෙ. හේතුව නැත්නම් ඵලයක් නෑ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම ආස්වාද විඳින්නයි ඇස, කන, නාසය, දිව, ශරීරය, මන උවමනා කරන්නෙ. ආස්වාද විඳින්න කැමැත්තෙන් බැඳුනෙ නැත්නම්, නටුවෙන් කඩපු මල් වගේ මතු පරපුර සකස් වීම නවතිනවා. මල රැඳිල තියෙන්නෙ නටුවෙ වගේ, කැමැත්තෙන් බැඳීම හෙවත් ඡන්දරාගයෙන් තමයි භව සකස්වීම රැඳිල තියෙන්නෙ. මල් උපමා කරගෙන මේ චතුරාර්‍ය සත්‍යය ජීවිතයට ගලපල බැලුවම, කාම වස්තු කෙරේ ඡන්ද රාගයෙන් බැඳෙන හේතුවෙනුයි භව සකස් වෙන්නෙ කියල දැනගෙන, ඒ ඡන්ද රාගයෙන් මිදුන නම් භව ඇතිවෙන්නෙ නෑ. එහෙනම් ජාති, ජරා මරණ, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස කියන මහා දුක් ගිනි කඳ උදාවෙන්නෙ නෑ.

මල් කඩපු ගස වැල උපමා කරගෙන අපි පසිඳුරන් සංවර කරගන්න ඕන. ලෝකයේ සුන්දර මුලා සහගත රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ තිබුණත් දැන් අපිට ඒවා බරක් නෑ. අපි ඒවාට ඇලිල බැඳිල නැති නිසා මල් කඩපු ගසවැල වගේ වෙනවා. කාම භවයට බීජ දමන මග අහුරල තියෙනවා. එහෙම වුණාම මේ කය කාම ලෝකයේ තියෙන අන්තිම කය වෙනවා. මතු කාම කයක් හදන බීජ ජනිත වෙන්නෙ නැති නිසා, කාම ලෝකයෙන් නිදහස් වෙලා තමයි කය අත් හරින්නෙ, මිය යන්නෙ. දැන් නටුවෙන් කඩපු මේ මල්වලට, ඡන්දරාගය නමැති නටුවෙන් නොබැඳුණු ඇස, කන, නාසය..... මන කියන සංවර කරගත් ඉඳුරන් නමැති මල් පොකුරු සමූහය උපමා කරල, මහා සංවර ගුණයෙන් යුත් ඒ උතුම් බුදු පියාණන් වහන්සේ පාමුල මේ මල් පුදමියි කියල හිතා ගෙන මල් පූජා කරන්න ඕන.

ස්වාමීනි, මලින් පෙන්වපු මාර මුලාවත්, එයින් නික්මෙන නෙක්ඛම්මයත් දැකපු අපි මේ පැමිණියේ, ඔබ වහන්සේ අපට දුන් දහම් පිළිවෙත ගැන පැහැදිලා උපහාරයක් කරන්නයි. මාර දහම් පහ පාගා නැගී සිටි බුදු පියාණනි, මේ මල් දමිය යුතු තැන ඔබ වහන්සේ අපට දහම් මගින් පෙන්වා දී තියෙනවා. ශ්‍රී පාදයට පැගෙන මේ මුලාව පිළිබිඹු කරන මල් අපි බිම දමනවා. අපිත් මල් උයනක ගස් වැල් වගේ උපමා සසඳා බලා ඉඳුරන් පහ කියන මල් කඩා පා දූවිලි සේ පාමුල තියනවා. මතු මාර මුලාව ඇති කරන කාමයට නොබැඳෙන බවටත්, පළමුව කාම දුසිරිතෙන් වෙන් වෙලා මේ මාර්ගය පූර්ණ කරන බවටත් පොරොන්දු වෙනවා.

මේ විදියට බුදු සිරිපා මුල මල් පූජා කරල සිහි කරන දහම් ක්‍රමය නිසා ඉඳුරන් සංවරයෙන් සීල සාසනය වැඩෙන්න ඒක මහත් පිටිවහලක් වෙනවා. පෙර බොදුනුවන්ගේ මල් පූජාව තමයි මේ කියන ප්‍රතිපත්තිමය මල් පූජාව.

එතකොට මල් උපමා කරගෙන චතුරාර්‍ය සත්‍යය දැකල, ඒ උතුම් සත්‍යය දේශනා කරපු බුදු පියාණන් වහන්සේගේ ගුණ සිහි කරල, ගුණ උපහාර පිණිස මල් පූජා කිරීමකුයි මේ කළේ. මලක් දිහා මතු පිටින් දකිනවට වඩා ගැඹුරු ☞

ජීවිතාවබෝධයක් ලබන දැකීමක් නිසා මේක විදර්ශනා භාවනාවක් වෙනවා. ජීවිතය කියන්නෙ අපි කැමති සේ නොපවතින (අනිච්ච), ඒ හේතුවෙන් දුක උපදවන (දුක්ඛ), ඒ කරුණු දෙකම නිසා අසාර වන (අනත්ත) පෙර භවවල සංඛාර හේතුවෙන් හටගත් සංඛතයක්. ක්‍ෂය වෙවී වැනසී යන දෙයක්. යලි යලිත් නොපැතිය යුතු දෙයක්. එබඳු අසාර වූ ඇස, කන....... මන සංවර කර ගනිමි'' යි අධිෂ්ඨාන කරගන්න ඕන.

භාවනා පූර්ව කෘත්‍යයක් හැටියට ත්‍රිවිධ රත්නයට ජීවිතය පූජා කරන්න කියල, සමහර භාවනා උගන්වන තැන්වලදි අහන්න ලැබෙනවා. ''බුද්ධං ජීවිත පරියන්තං.....'' කියන වචනවලින් නෙවෙයි, ජීවිත පරිත්‍යාගයෙන් බුදුන් පුදන පිළිවෙලකුයි මේ සඳහන් කළේ. ඇස, කන, නාසය.... මන මල් පොකුරුවලට උපමා කරල පිදුව නම්, ජීවිත පරිත්‍යාගයෙන් පිදුව වෙනවා.

දෙව් ලොව දෙව් කෙනෙක් ආයු පිරිහිලා චුත වෙන්න ආසන්න වෙනකොට පැළඳගෙන හිටපු මල් මැලවෙනවා, පරවෙනවා, සුවඳ නැති වෙනවා. ජීවිතයේ අසාර බව මෙනෙහි කරන්න, මල් උපමා වෙන අවස්ථාවක් තමයි ඒ.

**පහන් පුදා නිවන් දැකපු අය වගේම, මල් පුදා නිවන් දැකපු අය පිළිබඳවත් අපදාන පාලියේ සඳහන් වෙනවා.** පුණ්ණා තෙරණිය මෙවැනි ප්‍රකාශයක් කරල තියෙනවා.

''........ මම එකල චතුභාගා ගං ඉවුරෙහි කින්නරියක් වී විසුවෙමි. දිනක් බබළන, නැවත උපතක් නැති, බුදු බව ලබාගෙන සිටි උන් වහන්සේ දිටිමි. (පසේ බුදුන් වහන්සේ නමක්) පහන් සිතින්, යහපත් මනසින්, ඇඳිලි බැඳගෙන මල් මාලයක් ගෙන උන් වහන්සේ පිදුවෙමි. ඒ යහපත් පින්කමෙන් නිදසෙහි දේවගණයා වෙත ගියෙමි...... මෙයින් සිවු නවුතයකට පෙර මම යම් මලක් පිදුවෙම් ද ඒ හේතුවෙන් මම දුගතිය නොහඳුනමි. මේ මල් පිදීමෙහි අනුසස්ය. මම කෙලෙස් දැවීමි. ත්‍රිවිද්‍යාව ලබා ගතිමි. බුදුරදුන්ගේ අවවාද පිළිපැදීමි.......'' (ථේරි ගාථා අට්ඨ කථා 10 පිටුව)

ඒ කිඳුරිය මල් පිදුවේ විදර්ශනා වඩල නෙවෙයි. පසේ බුදු පියාණන් වහන්සේගේ සෞම්‍ය ස්වරූපයට සිත පැහැදීමෙන්. **රහත් උතුමන්ගේ ගුණ සිහි කරල, සිත පහදවාගෙන කරපු මල් පිදුමත් නිවන් මගට යොමු කරල තියෙනව නම්, විදර්ශනාත්මකව ගුණ සිහි කරල මල් පිදීමේ කුසලය ගැන කවර කතාද?**

*වැහැරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )**
**කඩවත**

# සද්ධා වැසි වසී ලබනා තුරු නිවන

පැතුමක් පතා අම්මා බුදු වන ලෙසට
නිවනින් සැනසෙන්න තව ඉන්නද කුමට
මෙතුවක් සිතා සිටි තතු නොම දත් කමට
මතු මෙත් බුදුන් තවමත් හිඳිනව මුලට

ඊටත් වැඩි හොඳයි දුක දෙන සැපත වෙසින්
කාටත් ඇරුණ මග යමු නිසි පියවි ඇසින්
දෝසත් දුරු කරන් පෙර මග අපම විසින්
ලෝකෙත් කුමකට ද කෝ අප කැමති ලෙසින්

රාගය සොඳුරු ගින්නකි ගිනි සිසිල දෙන
ද්වේෂය කුරිරු උණ්ඩෙකි ගිනි පුලිඟු මෙන
මෝහය අඳුරු කන්දකි විද බලනු මැන
මේ තුන කවුරු වින්දද වෙයි දුරම යන

සමුගෙන යන විටදි සඳහට දෙනෙත පියා
අම්මා වෙයිද මා ඊළඟ භවයෙ කියා
අප නොදනිතත් යා යුතු තැන රඳන නියා
කළ කී දේ තිබෙනවලු එක තැනක ලියා

දුලභව ලද මිනිස්කම රැක ගමු දිනලා
හැම භවයම දුකයි තිලකුණු ලෙස දැකලා
සසරක හැටි අනේ දැන ගත් පසු හිතලා
හැකි ඉක්මනට යමු පසු පසවත් නොබලා

ආ මග අසාරයි දාහය මතු වෙනවා
කෝ සැනසුමක් පාපය නම් දැඩි වෙනවා
ඒ සිවු අපා ගැන බඩ පපුවද දනවා
යා වෙමු අපිත් හෙට බුදු පෙරහැර එනවා

මිනිසුන් සතුන් ලෙස විඳිනා දුක් ගැහැට
පිනවන්නට සිතා මේ ඇස කන හිතට
කොතරම් රැවටුණි ද රස හැඩ වැඩ රුවට
සැහීමක් කොහිද මායා සට කපට

දැන නොසිටියත් පෙර මේ රස කතන්දර
බියකරු බව නොදැන සසරේ පරක් තෙර
හැඩි දැඩි මහ පඬි ද කළ හැකි නිරුත්තර
අස්වනු නෙලමු මහ පින් කෙත අනුත්තර

අත අල්ලා ගියත් ඉස්සර හැම තැනම
යා යුතුමයි සැවොම මේ මග තනි ලෙසම
එහෙනම් පමා නොම වී යමු ළඟ ළඟම
මිහිරියි සුවයි නිවුනයි දැක දැන දැනම

සජ්ජායනා කර සිත සම වැදි දැහැන
විජ්ජාචරණ වුණ බුදු හිමි රුව මවන
වජ්ජාසනයෙ හිඳ දෙසු දම් සිහි කරන
සද්ධා වැසි වසී ලබනා තුරු නිවන

**ස්වර්ණා සමරසිංහ**
**නැදිමාල - දෙහිවල**

# ලෝකයේ භාෂාවන් හට ගත් මූලධර්මය සහ වෙනත් භාෂාවක වචනවලට

# හෙළ බසින් නිරුක්ති දිය හැකි ක්‍රමවේදය

*(පසුගිය කලාපයෙන් - ලක්ෂණය, රසය, පච්චු පටිධානය හා පදටිධානය මුල්කරගෙන ධර්මය විග්‍රහ කරන හැටි....)*

පද නිරුක්ති ගැන කතා කිරීමේදී යම් කිසි භාෂාවක පදයකට ඇති පද නිරුක්තිය, වෙනත් භාෂාවකින් ප්‍රකාශ කිරීම සමහර අයට තේරුම් ගන්න බැරි ගැටළුවක් වෙලා තියෙනවා. ''ඉංග්‍රීසි භාෂාවක වචනයක්, දෙමළ භාෂාවක වචනයක් කොහොමද සිංහල භාෂාවෙන් කඩල නිරුක්ති දෙන්නෙ? භාෂා ව්‍යාකරණ නීතිරීති නැතුව එහෙම නිරුක්ති දෙන්න පුළුවන්ද?.....'' මේ වගේ විවිධ ප්‍රශ්න සමහර උදවිය මතු කරනවා. බුදුන් වහන්සේ දේශනා කරපු නිරුක්ති පටිසම්භිදා ඥානය කියන්නෙ මොන වගේ දෙයක්ද, ලෝකයේ භාෂාවන් ගොඩ නැගුණු මූලධර්මය මොකක්ද කියල නොදන්නාකම නිසාත්, පසු කාලීනව හදාගත් භාෂා නීතිරීතිවලට කොටු වෙලා ඒ තුලින් සත්‍යය සොයන්න යාමත් නිසා මේ වගේ ගැටළු මතු වෙනවා. දැන් මේ ඒ ගැටළුවට විසඳුම තමයි ඉදිරිපත් කරන්නෙ.

ඕනෑම භාෂාවක ඕනෑම වචනයක් හැදෙන්න මුල් වෙච්ච හේතුවක් තියෙනවා. අද ලෝකයේ විවිධ භාෂාවන් සිය ගණනක් කතා කළත්, මේ පෘථිවියේ මනුස්සයා පහළ වෙන්න පෙර හිටපු ආදි බ්‍රහ්මකල්පික මිනිස්සුන්ට මේ වගේ හදාගත්තු භාෂාවල් තිබුණෙ නෑ. ඒ හිටපු **සියලුම මිනිස්සුන්ගෙ මුල් භාෂාව වුණේ හැඟීම් දනවන සා මාගධී මූල භාෂාව.** නමුත් පසුකාලීනව මනුස්සයා තණ්හාවෙන් ලෝකය තමන්ගෙ කියල ගොඩ ගහගන්න යෑම නිසා, එදා තිබ්බ්ච පුණ්‍ය ශක්තීන් පිරිහිලා ගිහින් ක්‍රමයෙන් තමන්ගෙ ජීවන පැවැත්මට අවශ්‍ය කරන ආහාර, ජලය, වාසස්ථාන ආදී දේවල් සොයා ගන්න, ඒවාට අවශ්‍ය හොඳ හොඳ තැන් සොයා ගන්න තරගයක නියැලෙන්න පටන් ගත්තා. මේ නිසා දැන් මේ ලෝකයේ ඉන්න සියලුම මිනිස්සුන්ගෙ මුල බැලුවොත්, ඒ සියල්ලම ඒකීය වශයෙන් පොදුවේ යම් ප්‍රදේශයක ඉඳල විවිධ හේතූන් උඩ විවිධ ප්‍රදේශවලට බෙදිල ගියපු පිරිස්. මේ වෙනස් වීමට ප්‍රධාන වශයෙන් හේතු වුනේ අර කියපු තරගකාරීත්වයත් සමග ඇති වෙච්ච මුහුදු හා ගුවන් ගමන්. මේ දෙකෙන් පස්සෙ තමයි දුරස්ථ ප්‍රදේශ හොයාගෙන කාලයත් සමග මිනිස්සු වෙන වෙනම පදිංචි වෙන්න පටන් ගත්තෙ. එතකල් මිනිස්සුන්ට ඈතට යන්න බැරි වුණා. මේ විදියට විවිධ ප්‍රදේශවලට සංක්‍රමණය වෙනකොටත් විවිධ පිරිස් හැදිල කණ්ඩායම් වශයෙන්මයි සංක්‍රමණය වුණේ. ඒ විදියට මුලින් කැඩෙන්නෙ නැතිව හිටපු පිරිස් නැව් හා ගුවන් ගමන් නිසා වෙන් වුණා.



මෙතනදී ගුවන් යානා ගැන කතා කරන කොට ඒක අද ඊයෙ හොයාගත්තු එකක් නෙවෙයි. මීට අවුරුදු හත් අට දාහකටත් පෙර මුල් කාලෙ තිබ්බ්ච අහස් යානා තමයි ඔය දඬු මොණර යන්ත්‍රය.... ආදී වශයෙන් කියන්නෙ. ඒ වගේ දේවල් අදින් වසර දහස් ගණනකටත් පෙර තිබුණයි කියල සාධක ඕනෑ තරම් දැන් සොයා ගෙන තියෙනවා. හැබැයි මේ කියන්නෙ ඊටත් බොහෝ ඈත කාලයකට පෙර. ඒ වගේම මුහුදු ගමන් යන්න ඒ කාලෙ රුවල් නැව් තිබුණා. ඉතින් කොහොම හරි එදා හිටපු මිනිස්සු, පිරිස් වශයෙන් එකතු වෙලා ඔය වගේ යානාවලින් ගිහින් ඒක කැඩුණොත් කොතන හරි පහත් බිමකට බානවා. ඉතින් ආපු ලොකු දුරක් නැවතත් පයින් යන්න බෑ. ඒක හදාගන්න බැරි වුණොත් ඒ ප්‍රදේශයේ පැළ පදියම් වෙනවා. සමහර විට යානාව බාන කොට එතැන තිබුණෙ පහත් බිමක් හෝ මොනව හරි කටු පඳුරු තියෙන භූමියක් වෙන්න පුළුවන්. ඒ ප්‍රදේශයට තමන්ගෙ හිත ඇදී යාම නිසා හෝ කැඩිච්ච යානාව නැවතත් ඉහළට ගන්න බැරි වුණාම හෝ අර මිනිස්සු එතැනදී රංචුවක් විදියට එකතු වෙනවා. ඊට පස්සෙ මේ පිරිස ඒ භූමියේ රාජ්‍යයක් හදාගෙන කාලයක් යන කොට ක්‍රමයෙන් මුල් ආභාසයන් ඔස්සේ ඒ ප්‍රදේශයට හරියන විදියට භාෂාව හැඩ ගැහෙනවා. එහෙම නැත්නම් මුහුදු මගින් යද්දි නැව කුණාටුවකට හසුවෙලා දූපතකට ගොඩ බානවා. නැවත යන්න ක්‍රමයක් නැති වුණාම එතැන පදිංචි වෙනවා. නැත්නම් තමන්ගෙ හිත ගිය භූමියක් අහුවුණොත් එතැන නතර වෙනවා. මේ වගේ සිද්ධි අදත් වෙනවා. සමහර අපේ ගම්වල හිටපු මිනිස්සු පොඩි කාලෙදිම එක්කො අපේ රටේම වෙනත් ප්‍රදේශයකට ගිහින්, එහෙම නැත්නම් රස්සාවක් කරන්න කියල වෙනත් රට රාජ්‍යයකට ගිහින් නැවත අවුරුදු ගණනාවකට එන්නෙ නැතුව යනවා. සමහර විට එහෙ පදිංචි වෙලා පවුල් වෙනවා. නැවතත් අපේ මුල් ගම්බිම්වලට ආවම දකින්න ලැබෙනවා, අර ඒ අයගෙ මුලින් තිබ්බ්ච භාෂා රටාව වෙනස් බව. ඒ වගේම සමහර විට විවිධ කලකෝලාහල නිසා මුල් ගම්බිම් අතහැරල වෙනත් ප්‍රදේශවල පදිංචියට ගියාමත්, කාලයක් යන කොට අර මුලින් කතා කරපු භාෂා රටාව වෙනස් වෙනවා. ඒ වෙනස් වීමත් බාහිර හේතු මත විවිධ මට්ටම්වලින් සිද්ධ වෙන්න පුළුවන්.

මෙන්න මේ වගේ මනුස්සයගෙ ආදි මුල් කාලය ගත්තොත්, මුල් ප්‍රදේශවල ඉඳල ඈත ප්‍රදේශවලට සංක්‍රමණය වෙන කොට ඒ නව ප්‍රදේශවල තියෙන සීත, උෂ්ණ, සුළඟ, භූමියේ ☞

පිහිටීම.... ආදී විවිධ කාලගුණ, දේශගුණ රටාවන් නිසා තමයි මුලින් එක භාෂාවක් විදියට තිබ්ච්ච ක්‍රමය, පසුව විවිධ භාෂාවන් බවට පත්වෙන්න හේතු වෙන්නෙ. නමුත් මුල ගත්තොත් මේ හැමෝගෙම මූල භාෂාව එකයි. අර කලින් කිව්ව වගේ බ්‍රහ්ම කල්පික මනුස්සයො ලෝකයට ඉස්සෙල්ලම ඇවිත් තමයි මූලාරම්භය පටන් ගත්තෙ. එතැනින් පටන් ගත්තු හැම මනුස්සයකුගෙම මූල භාෂාව තමයි සා මාගධී කියල කිව්වෙ. **සා කියන්නෙ සුද්ධ කියන එක. මාගධී කියන්නෙ මාර්ගයේ ආදී කියන එක.** අද සංස්කෘත භාෂාව කියන්නෙ මේකෙන් පසුව සකස් කරගත් එකක්. ඒ කියන්නෙ ඒ මුල් වචනවලට අනුකූලව ඒ වචන අරගෙන පොඩ්ඩක් හර බර කරල හදාගත්තු එකක්.

ඊළඟට මේ විදියට මුලින් මූල භාෂාවෙන් කතා කරල, පස්සෙ විවිධ කාලවල විවිධ හේතූන් උඩ වන ගතවීම්, රුක්ෂ ජීවිත ගතකිරීම් ආදී විවිධ ක්‍රම නිසා ඒ ඒ ප්‍රදේශවලට ගැලපෙන විදියට වචන පරිණාමය වෙන්න පටන් ගත්තා. දැන් කලින් හිටපු මුල් ප්‍රදේශයෙන් විවිධ පැතිවලට ගියාට පස්සෙ, ඒ පැතිවල අපි මුලින් කතා කරපු භාෂා ක්‍රමය කතා කරන්න බැරිව ගියා. මොකද අර කියන කාලගුණ, දේශගුණ ආදී වෙනස්කම් නිසා. එතකොට මොකද කරන්නෙ, අර මුල් භාෂාවෙන් ගත්තු වචනම ශබ්ද වෙනස් කරල කතා කරන්න පටන් ගන්නවා.

උදාහරණයක් විදියට ගත්තොත් අපි යමෙකුට යමක් පවසන්න, ඒයි.... මේ.... කියල කතා කරනවා. හැබැයි මුහුදු ගමනක් ගියොත් ඒ මුහුදෙ රළ සෝෂාව වැඩියි. දැන් අර ගෙදර කලින් කතා කරපු විදියට ඒයි.... මේ.... ආදී වශයෙන් කිව්වට ඇහෙන්නෙ නෑ. දැන් මොකද කරන්නෙ අඩෝ...... කියල පුළුවන් තරම් හයියෙන් කෑ ගහන්න වෙනවා. නැත්නම් ඇහෙන්නෙ නෑ. එතකොට ඒක කෑ ගහල ගන්න ශබ්දයක් මිසක් භාෂාවක් නෙවෙයි. හැබැයි තැනේ හැටියට අකමැත්තෙන්, අමාරුවෙන් හරි ඒ විදියට කතා කරන්න වෙනවා. මේ නිසා කලින්ට වඩා සැඩ පරුෂ භාෂාවක් ඒකට හදාගන්න වෙනවා. ඊට පස්සෙ කාලයක් යනකොට ඒ රටාව තමයි පරිවර්තනය වෙලා ඒ අයගෙ භාෂාව විදියට පත් වෙන්නෙ. එහෙම වෙලා ක්‍රමයෙන් දුරස් වෙන කොට, අර මුල් භාෂාවත් එක්ක බැලුවම මතු පිටින් හොයා ගන්නත් බැරි විදියට වෙනස් වෙන්න පුළුවන්. අපේ රට ගත්තත්, විවිධ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වැදි ජන වහර, ගාඩි ජන වහර, ධීවර ජන වහර, පතල් ජන වහර, සබරගමු ජන වහර, උඩරට ජන වහර ආදී වශයෙන් ඒ ඒ ප්‍රදේශවල කතා කරන භාෂාවන්ගේ වෙනස්කම් තියෙනවා. ඒ වගේම ප්‍රධාන භාෂාවන් ගත්තොත් කනට ඇති වන මිහිරි, අමිහිරි බවත් විවිධ භාෂාවන් අනුව වෙනස් වෙනවා.

උදාහරණ විදියට දෙමළ මිනිස්සු කතා කරන කොට කනක් ඇහෙන්න නෑ, කරච්චලේ කියල බොහෝ කොට කියනවා. පිරිසක් එකතු වෙලා සෝෂා කරන කොටත්, දෙමලුන්ට පඩි දුන්න වගේ කියල අපි අතර කතාවට කියනවා. හැබැයි එහෙම කියන්නෙ දෙමළ කථා කරන අයට අපහාස කරන්න නෙවෙයි. ඒ භාෂාවෙ ස්වභාවය නිසා. නමුත් ඉංග්‍රීසි මිනිස්සු කතා කරන කොට අපි එහෙම කියන්නෙ නෑ. ඒ අය කොච්චර කතා කළත් අගට එස් (S) ශබ්දය



එන විදියට නිකං පොඩි පොඩි ශබ්ද පිට වෙනව මිසක්, අර වගේ මහ සෝෂාවක් නෑ. අහගෙන ඉන්න අමාරු ශබ්දත් ඒකෙ නෑ. එතකොට මේකට හේතුව මොකක්ද?

දෙමළ මිනිස්සු කියන්නෙ බොහොම කර්කෂ ප්‍රදේශවල ජීවත් වෙච්ච උදවියක්. අනිත් අයට වගේ ස්වභාව සුන්දරත්වය විඳගෙන ඇතුළත සුව පහසු විදියට හදාගත්තු කාමරවලට වෙලා සැප විඳින ස්වභාවයක් ඒ අයට තිබුණෙ නෑ. යාපනය, වවුනියාව වගේ පැති ගත්තොත් ඒ අය බොහොම දුක් මහන්සියෙන් උදේ පාන්දරින් නැගිටල, තියෙන මොනව හරි රොටියක් වගේ දෙයක් පුච්චගෙන කාල, කහට උගුරක් බීල තමන්ගෙ ජීවිතය ගැට ගහගන්න කාෂ්ට පොළවෙ දහඩිය මහන්සිය හෙළනවා. ඔය විදියට රෑ බෝවෙන කල්ම වැඩ කරනවා. අදටත් වතු කම්කරුවො ගත්තම එහෙමයි. තේ වතුවල හරි රබර් වතුවල හරි ඒ අය බොහොම අඩු පහසුකම් යටතේ වැඩි බර වැඩ කොටසක් කරනවා. ඒ අය ලැයිමෙ හරි ඉන්නෙ බොහෝ විට රෑට නිදාගන්න ටිකට විතරයි. විශේෂයෙන් ඉස්සර එක ලැයිමක් ගත්තොත් අනෙක් ලැයිම තිබුණෙ ඊට තවත් හුගක් දුරින්. ඉතින් තේකක් හරි වෙනත් මොනව හරි අවශ්‍ය දෙයක් ගෙන්න ගන්න ඕන වෙන කොට, අර වගේ හෙමින් මෘදුවට කතා කරල හරි යන්නෙ නෑ. දැන් ඉතින් වාංග කියල කිව්වට මදි. මේ නිසා වාංගඩා කියල හයියෙන් කෑ ගහනවා. වාංග කියන එකයි, අඩා කියන එකයි එකතු වෙලා තමයි වාංගඩා කියන්නෙ. ඒක අනෙක් කෙනාට ඇහිල ප්‍රත්‍ය වෙන්න නම් මේ වගේ විශේෂ කෑල්ලක් දාල කියන්න වෙනවා. අන්තිමට වාංග කියන එක වාංගඩා වෙනවා.

ඒ වගේ, වචන හැදෙන කොට අපි නොදැනුවත්වම මෙහෙම ක්‍රමයක් එනවා. මෙතනත් මුලට ගියාම වා.... වා..... වරෙන් කියල තමයි මුලින්ම එන්නෙ. අඬගහන කොට මුලට වා.... කියනවා. මේ විදියට වා.... තමයි ඒකට මුල් වුණේ. මෙන්න මේ වගේ **මූලික වචන හැදෙන කොට මුලින් තනි අකුරින් තමයි ශබ්දය ආවෙ. ඈ.... ඈ.... කියල අඬනවා. හිහ්.... හිහ්.... කියල හිනාවෙනවා.** ඒ වගේ මුල් කාලවල බොහෝ කොටම අකුරක දෙකක ශබ්දවලින් තමයි අදහස් ප්‍රකාශ කළේ. නමුත් කාලයක් යන කොට අවශ්‍යතාවයන් වැඩි වෙන කොට, ඒ වගේම අර කියපු කාලගුණ, දේශගුණ වෙනස්කම් නිසා අදහස එක අකුරකින් දෙකකින් ප්‍රකාශ කරන්න බැරි වෙනවා. එතකොට ඒකෙන් ඇදිල තවත් අකුරු ඇඳෙනවා. ඒ ඇඳීම නිසා භාෂාවකට අලුතින් පද හැදෙනවා. හැබැයි ඒවා කවුරුවත් හදපු ඒව නෙවෙයි. ස්වභාව ධර්මය අනුව මනුස්සයින්ට එහෙම දෙයක් කරන්න සිද්ධ වෙනවා. එතකොට කාටවත් නිකං එහෙම කතා කරන්න බෑ.

උදාහරණ විදියට ගත්තොත් පොඩි එවුන් තමන්ගෙ මව දැක්කම මා.... මා..... ම්මා.... ම්මා.... කියල කියනවා. ඔච්චරයි පොඩි එවුන් කියන්න දන්නෙ. කොයි පොඩි එකත් ඔහොම තමයි මුලින්ම කතා කරන්නෙ. නමුත් ඊට පස්සෙ ඒ ඒ ප්‍රදේශය අනුව අර කියපු බාහිර වෙනස්කම්

අනුව ඒ ''මා, ම්මා'' වෙනස් වෙනවා. එතකොට අම්ම වෙන්නෙත්, මදර් (Mother) වෙන්නෙත්, මමා වෙන්නෙත් ඒකම තමයි. මේ වගේ විවිධ පැතිවලට වචන වෙනස් වෙවී යනවා. මෙන්න මෙහෙම යෑමේ ප්‍රතිඵලය තමයි විවිධ භාෂාවල් කතා කරන පිරිස් බිහිවීම.

දැන් ඊළඟට ඉංග්‍රීසි භාෂාව හැදෙන්නත් මේ වගේ හේතුවක් තියෙනවා. අපි හයියෙන් හුස්ම ඇරියොත්, එහෙම හුස්ම අරින්නෙ පපුව ඇතුලෙ තියෙන වැඩිපුර රස්නය පිට කරන්න. ඒ වගේම දත් ඇඳි දෙක තද කරගෙන, හිර කරගෙන කතා කරන්නෙ අර ශරීරය ඇතුලෙ තියෙන උෂ්ණය පිටවීම නවත්ත ගන්න. අපි වෙන විදියකට තේරුම් ගත්තත් බටහිර රටවල මිනිස්සු, කෙනෙක් මුණ ගැහුනම අතට අත දෙන්නෙත්, තුරුල් කරගෙන සිප වැළඳ ගන්නෙත් මෙන්න මේ වෙනස්කම නිසා. මොකද අපි වගේ ආයුබෝවන් කියල සද්දෙට කතා කළොත් එතනත් ශක්තිය වැයවෙලා උෂ්ණත්වය පිට වෙනවා. නමුත් පසු කාලීනව මේ වගේ දේවල් විලාසිතාවට, කලාවට එහෙම නැත්නම් ලෙංගතුකමට කළත්, ඒකෙ මූලාරම්භය වුණේ අර වගේ සීත රටවල්වල. ඒ වගේම සීතලට වචන කතා කරන කොට පුළුවන් තරම් කටේ තියාගෙන තොල් යන්තමට තමයි හොල්ලන්නෙ. එහෙම නැතිව විලාප තියන්නෙ නෑ. මොකද උෂ්ණත්වය පිට වෙනවා. මේ විදියට එංගලන්තය වගේ සීත රටවල තොල් අඩුවෙන් හොල්ලන ශක්තියෙන් හැදිච්ච භාෂාවක් ඒ අයට උරුම වුණා. අර මූලධර්මයට අනුව පොදු හැඟීමෙන් ආපු හඬට දේශගුණය, කාලගුණය ආදී හේතූන් මත පරිවාර ශබ්ද ඒ අයට ආවා.

''ප, බ'' වගේ අකුරුවලින් එන වචනවලට අහුවෙච්ච ශබ්ද බොහොමයක් තොල් විතරක් හොල්ලල කතා කරන ඒවා. ඒ එක පැත්තක භාෂාවක් හැදිච්ච හැටි. එතකොට දිව වැඩියෙන් හොල්ලන භාෂාව තියෙන්නෙ රස්නෙ ප්‍රදේශවල. රස්නෙට හැහ්.... හැහ්.... ගාලා හැම වෙලේම හලිය හලිය වගේ හඬක් තමයි එන්නෙ. බල්ල දිව එළියට දාගෙන වෙලාවකට රස්නෙ පිට කරනව වගේ ස්වභාවයක්. ඒ වගේ, මිනිස්සුන්ටත් රස්නෙ වෙලාවට දිව ඇතුලෙ තියාගෙන කතා කරන්න බෑ. දිවෙන් තමයි රස්නය පිට දාන්නෙ. නමුත් බල්ල වගේ දිව එළියට දම්මෙ නැතුවට, රස්නෙ වෙලාවට දිව පුළුවන් තරම් හොල්ලල කතා කරන ක්‍රමයක් මිනිස්සුන්ටත් ස්වභාවයෙන්ම හැදිල තියෙනවා. ඒ ක්‍රමය තමයි උෂ්ණ ප්‍රදේශවල ජීවත් වෙන අයට තියෙන්නෙ. එතකොට සද්දෙත් වැඩියි. ඒ ශබ්දයට අනුකූලව හඬත් ගොරෝසුයි. දිව ඇතුලෙ තියාගෙන කතා කරන කොට තොල් ප්‍රදේශ හිමින් ශබ්ද වෙනවා. එතකොට ශබ්දය උගුරෙන් තමයි එන්නෙ. මොකද දිව පැටලි පැටලි යන හැටියට ශබ්දයත් හැදෙනවා. Z, S වගේ ශබ්ද කරන කොට ඒ ශබ්දය බොහොම හෙමින් සුමටව උගුර ඇතුලෙන් තමයි එන්නෙ. එතකොට උෂ්ණත්වය පිටවීම අඩු වෙනවා. ඒ නිසා තමයි ඉංග්‍රීසි ජාතිකයන්ගෙ වැඩිපුරම Z, S වගේ අකුරු ශබ්ද වෙන්නෙ. ඒ අය ඒක උගුර යටින් කිව්වට, අපි ඉංග්‍රීසි කතා කරන කොට හයියෙන් කට හොල්ලල ඉසෙඩ්...., එස්..... කියල කියනවා. මොකද අපිට කොච්චර කතා කළත් අර විදියට දිව ඇතුලෙ තියාගෙන කතා කරන්න බෑ. ඒ අපේ කාලගුණ, දේශගුණ රටාව අනුව හැඩ ගැහිච්ච හැටි. නමුත් ඉංග්‍රීසි ජාතිකයො ඒක බොහොම සියුම් විදියට තමයි උච්චාරණය කරන්නෙ. හේතුව සීතලට



ඇතුලෙ දිව ගුලි වෙලා. උෂ්ණයට දිව පළල් කරල එළියට දානවා. එතකොට ඒ භාෂාව හරි සද්දයි. ඒ වගේම කැඩිච්ච ලක්ෂණ පෙන්නුම් කරනවා, වචනවල ඇද කුද තියෙනවා. මොකද දිව එළියෙ තියෙන කොට දිවේ පැටලුම් වැඩියි. දිව එහෙ මෙහෙ යන කොට ඒ ශබ්දය ගමන් කරන මාධ්‍යය වැඩියි. මේ නිසා පොඩි පොඩි අමතර කෑලි එනවා. අපේ භාෂාවේ වචන කතා කරන කොට සද්ධ වෙන්නෙ ඔය හේතුව උඩ. නමුත් ඉංග්‍රීසි ජාතිකයො කතා කරන කොට කනට ඇහෙන ගානට තමයි කතා කරන්නෙ. **හැබැයි මේ විදියට භාෂාවන් පරිණාමය වීම බොහෝ දිගු කාලීන ක්‍රියාවලියක්.**

**මොන භාෂාවෙන් වුණත් යම් කෙනෙක් ශබ්දයක් කරල තමයි මුලින් අදහසක් දෙන්නෙ, වචන ප්‍රකාශ කරල නෙවෙයි. උදාහරණ විදියට ගත්තොත් ඕනම කෙනෙක් බය වෙච්ච වෙලාවට ඇහ්.... කියල කෑ ගැහෙනවා. අපි ඇහුවොත් සිංහලෙන්ද, දෙමළෙන්ද, ඉංග්‍රීසියෙන්ද ඒ කෑ ගැහුවෙ කියල එහෙම දෙයක් එතැන නෑ. ඒ කියන්නෙ අපිට හදිසි කම්පනයක් වෙච්ච වෙලාවක කෑ ගහන්නෙ ඔය භාෂාවල්වලින් නෙවෙයි. අපේ හැඟීම් භාෂාව තමයි එතකොට නැගෙන්නෙ.** සා මාගධී කියන හැඟීම් භාෂාව තමයි සියලු මිනිස්සුන්ගෙ මුල් භාෂාව. ඒ හැඟීම් භාෂාව විවිධාකාර හේතු උඩ පසු කාලීනව වෙනස් වෙලා තියෙනවා. හැබැයි මූලික ශබ්දයක් අරගෙන, ඒ ශබ්දය මාධ්‍ය කරගෙන ඒක වටා පරිවාර ශබ්ද දාල, ඒ විදියට තමයි විවිධ භාෂාවල් හැදිල තියෙන්නෙ. කෙනෙකුට මොකක් හරි අදහසක් ප්‍රකාශ කරන්න ඕන නම්, හැඟීමට එන ඒ අදහසේ ශබ්දය ඒ වචනය තුළ ගැබ් වෙනවා. ඒ ගැබ් වෙච්ච අදහසේ ශබ්දයට අනුකූලව, අර අනෙක් බාහිර හේතු උඩ තමයි ඒ වටා පරිවාර ශබ්ද නැගෙන්නෙ. එතකොට අර මුල් ශබ්දය වැහිල යනවා. හැබැයි වැහිල ගියා මිසක් නැතිවෙලා නෑ. මැද න්‍යෂ්ටිය වගේ ඒ මූල ශබ්දය වචනය තුළ පිහිටනවා. ඒ මූල ශබ්දය මොන භාෂාවෙන් වුනත් අහක් කරන්න බෑ. ඒක පොදුයි. නමුත් එහෙම දෙයක් තියෙනවයි කියන කාරණය අද ඉන්න අය දන්නෙ නෑ. මේ නිසා මූල ශබ්දය වටා තියෙන පරිවාර ශබ්දවලින් තමයි භාෂාවන් වෙනස් වෙන්නෙ.

මේ හැම භාෂාවකම වචනවල මූල ශබ්දයක් තියෙනවා. ඒක කවුරුවත් උගන්වපු දෙයක් නෙවෙයි. ගති හඬ අනුව ඇදිල ආව ශබ්දය තමයි ඒ. ඒ ගති හඬට අනුකූල මූල ශබ්දය තමයි හැඟීම් දෙන්න ප්‍රධාන වෙන්නෙ. අර කියපු විවිධ බාහිර හේතූන් උඩ, ඒ මූල ශබ්දය වටා පරිවාර ශබ්ද වට කරන කොට විවිධ පද බවට පත් වෙනවා. ඊට පස්සෙ මුලින් ඒකීය වෙලා තිබිච්ච හඬ, බහු හඬ බවට පත්වෙනවා. එතකොට භාෂාවන් වෙනස් වෙනවා. ඒ හේතුවෙන් තමයි ලෝකයේ විවිධ භාෂා රටාවන් හටගන්නෙ. නමුත් කවුරු කොහොම කතා කළත් ඒ කතා කරන කොට ඉස්සෙල්ලම හැඟීම අල්ල ගන්නවා. ඒ හැඟීම වටා පරිවාර හඬ වට කරනවා. ඊට පස්සෙ ඒ වට කරපු ශබ්දයෙන් කතා කරනවා. නමුත් කොච්චර කතා කළත්, කතා කරල තියෙන්නෙ අර හැඟීම් හඬ මාධ්‍ය කරගෙන. ඒක හැම භාෂා පදයකම තියෙනවා. නමුත් වෙලා තියෙන්නෙ ඒ හැඟීම් හඬ තෝරගන්න තියෙන ශුද්ධ මානසිකත්වයක් මිනිස්සුන්ට නෑ. මේ නිසා අපි හිතන් ඉන්නෙ ඒක වෙනම පදයක්, වෙනම ක්‍රමයක් කියල. පස්සෙ කාලයක ඒ අය වෙනම ☞

පිරිසක්, අපි වෙනම පිරිසක් හැටියට සලකන්න පටන් ගත්තා. නමුත් මුල එකයි. අපි මුලින් එකතු වෙලා ඉඳල පසුව වෙන් වෙච්ච හැටි දන්නෙ නෑ.

කොහොම නමුත් මුලින්ම අපි එකට හිටපු බවට හොඳ සාධක තියෙනවා. දැන් ලෝකය ගත්තොත් ප්‍රධාන වශයෙන්ම බටහිර හා පෙර දිග කියල කොටස් 2 කට වෙන් කර ගෙන තියෙනවා. නමුත් උඩින් බැලුවොත් ඉංග්‍රීසීන්, ලන්දේසීන් වගේ අය අපට සම්බන්ධ වෙලා තවම මහ ලොකු කාලයක් ගිහින් නෑ. ඒක වැඩි ඈත නෙවෙයි. නිකං උඩින් මත්තෙන් බැලුවොත් මීට බොහෝ ඈත අතීත කාලයේ එහෙම සම්බන්ධයක් තිබ්ච්ච බවටවත් ලකුණු නෑ. මේ නිසා බොහෝ කොටම අද හිතන් ඉන්නෙ, මේ අවුරුදු හාර පන්සියයකින් මෙහා මේ වෙනස්වීම සිද්ධ වුණා කියල. මේ නිසා දැන් බටහිර කියන්නෙ වෙනම පැත්තක්. ඒ අයගෙ විද්‍යාවත් බටහිර විද්‍යාව කියල වෙනම එකක්. මේ විදියට තමයි මතු පිටින් බැලුවම පේන්නෙ. නමුත් දැන් බලන්න, අවුරුද්දකට තියෙන මාස ගණන හැදිච්ච හැටි. බටහිර ඒ මිනිස්සුන්ටත් මාස 12 යි, පෙර දිග සිංහල අපටත් මාස 12 යි. මෙහාට බටහිර ජාතීන් එන්න කලිනුත් එහෙමයි. ඊළඟට ජැනුඅරි (January), ෆෙබ්රුඅරි (February), මාර්ච් (March)..... මේ ආදී වශයෙන් බටහිර ජාතීන් හදපු එකට පවා අපි, අපිට පහසු වෙන විදියට ජනවාරි, පෙබරවාරි, මාර්තු...... ආදී වශයෙන් හදා ගත්තා. ඒ අපේ සිංහල ක්‍රමයට ගැලපෙන විදියට. එතකොට අර ශබ්දයටම අපි පරිවාර ශබ්ද එකතු කළා. දැන් ජැනුඅරි - ජනවාරි කරගත්තෙ අපි, ෆෙබ්රුඅරි - පෙබරවාරි කරගත්තෙත් අපි, මාර්ච් - මාර්තු කරගත්තෙත් අපි. අපි අපිට පහසු වෙන විදියට හදා ගත්තා.

දැන් මෙතනින් පේනවා මොකක් හරි යමක් කියන්න මුල ශබ්දයක් ගත්තට පස්සෙ, ඒ ශබ්දය අපට ගන්න ඕන වෙන කොට, අපි ඒකට තව තවත් ශබ්ද දාල පරිවාර ශබ්දවලින් වෙනස් කරගන්නවයි කියන කාරණය. අපි ජනවාරි, පෙබරවාරි.... ආදී විදියට සිංහල ක්‍රමය කියල හදාගෙන මාස 12 ක් කියල කිව්වත් ඕක එන්න පෙරත් අපිට දුරුතු, නවම්, මැදින්, බක්..... කියල මාස 12 ක් තිබුණා. එතකොට අපිටත් 12 යි, ඒ අයටත් 12 යි. දැන් එතකොට දෙගොල්ලන්ටම 12 ක් වුණේ කොහොමද? ඊළඟට අපෙත් සති 4 ක් මාස 1 යි. ඒ අයගෙත් සති 4 ක් මාස 1 යි. ඒ වගේම අපිට දවස් 7 ක් සති 1 යි. ඒ අයටත් දවස් 7 ක් සති 1 යි. එතකොට කොහොමද දෙගොල්ලන්ටම දවස් 7 ක් වුණේ? සන්ඩේ, මන්ඩේ, ටියුස්ඩේ.... මේ ආදී වශයෙන් ඒ අයටත් දින 7 ක් තියෙනවා. අපිට ඉරිදා, සඳුදා, අඟහරුවාදා.... ආදී වශයෙන්, එහෙම නැත්නම් රිවි දින, සඳු දින, කුජ දින.... ආදී වශයෙන් දවස් 7 ක් තියෙනවා. මේ වගේ සතියට දින 7 ක් වශයෙන් ගත්ත මිසක් දින 10 ක් හෝ වෙනත් සංඛ්‍යාවක් ඒ අය ගත්තෙ නැත්තෙ ඇයි? අපේ ගාණම ඒ අයටත් ආවෙ කොහොමද? අපි වගේම ඒ අයත් දින හදාගන්න ග්‍රහයන්ගේ මූලිකත්වය අරගෙන තියෙනවා. ඒක විශේෂ දෙයක්.

මේ විදියට අපි ළඟ තිබ්ච්ච මූලධර්මය ඒ අයටත් සම්බන්ධයක් නොතිබුණා නම් මේ වගේ සමානත්වයක් කොයින්ද? දැන් මේකෙන් පැහැදිලිව පේනවා, මුල් කාලයේ මේ සියල්ලම යම්කිසි මූලධර්මයක පිහිටි බව. ඒ මූලික වෙච්ච ශබ්දවල කොටස් සංක්‍රමණය වෙද්දි ගෙනිහින් තමයි පරිවාර ශබ්දත් එකතු කරල ක්‍රමයෙන් වෙනත් භාෂාවන් ගොඩ නැගුනෙ. අපි මොන ජාතියෙ භාෂාවන් කතා කළත්, අපිට හොයාගන්න බැරි වෙලා තියෙනවා ඒ පරිවාර භාෂාවන් හැදිච්ච මූලධර්මය. ඒ වචනවලින් එන හඬේ කොතැන හරි අපේ මූල ශබ්දය සම්බන්ධ වෙලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි මුල වෙච්ච දේ පේන්නෙ. නමුත් මුල පේන්නෙ නැති එකයි මේ ගැටළුව වෙලා තියෙන්නෙ. ඉතින් මේ නිසා කියනවා, අපි හදපු පදේ මෙහෙම අදහසක් තමයි දෙන්නෙ කියල. නමුත් පදේ හැදිල තියෙන විදිය නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් එන පද නිරුක්තියට මිසක් වෙන එකකට අහු වෙන්නෙ නෑ. ඉතින් නිරුක්ති පටිසම්භිදා ඥානය නැත්නම් මෙතනදිත් පදය හැදිච්ච හැටි, ඒ මූල ධර්මය කියන්න බැරි වෙනවා.

ඒ වගේම ඒ පද නිරුක්තිය හෙළ භාෂාවෙන් ගන්න හරි පහසුයි. මේ නිසා හෙළ භාෂාව දන්න අයට ඒක හරි පහසුයි. හේතුව හෙළ භාෂාව තමයි මේකෙ මූලධර්මය. මූල මාගධී කියල කියන කොට මාගධී භාෂාවෙ සුද්ධ මාගධී ක්‍රමයක් තියෙනවා. ඒක තමයි සා මාගධී කිව්වෙ. නමුත් සා මාගධියට ගියාමත් ඒක හැදිල තියෙන්නෙ අපේ ඉන්ද්‍රියන් හයම සුද්ධ වෙලා නෙවෙයි. ඒ කියන්නෙ මන සුද්ධ වෙලා නෙවෙයි. නමුත් ඉන්ද්‍රියන් 5 ක්, සුද්ද වෙලා, එළිවෙලා. ඒ කියන්නෙ ඇස, කන, නාසය, දිව ශරීරය කියන ඉන්ද්‍රියන් 5 කාමයන්ගෙන් වෙන් කර ගෙන, ආලෝක කරගෙන ඒක තමයි ආදි බ්‍රහ්ම කල්පික මිනිස්සුන්ටත් තිබුණෙ. නමුත් ඒ අයටත් මනෝන්ද්‍රිය සුද්ධ කරගන්න බැරුව ගියා. එතකොට **අර 5 ක් එළිකර ගත්තු භාෂාව තමයි පහ, එළි - පාළි වුණේ.** නමුත් මන **කියල හය වෙනි එකකුත් තියෙනවා.** **අර 5 ට මනසත් එකතු කරගත්තම හය, එළි - හෙළි භාෂාව වුණා.** ඒ නිසා දැන් කලින් වගේ නෙවෙයි පූර්ණ එළිය. එතකොට එළි පාලි, හෙළි පෙහෙළි කියල පසු කාලීනව ඒක කොච්චර නම් වෙනස් වුණාද? ඉස්සෙල්ලම එළිය ආවා. ඒ ආපු එළියෙන් පහ එළි වෙලා පෙහෙළි වුණා, එළි පෙහෙළි වුණා. ඊළඟට හෙළ පාළි වුණා. දැන් පෙළ පාළියක් යනව කියල අපි අද කියනවා. මේ ක්‍රමයෙන් සකස් වෙලා වෙනස් වෙච්ච හැටි තමයි. කවුරු වචන හැදුවත්, කොහොම හැදුණත් මොකක්ද පෙළ පාලි කිව්වෙ? මේ පෙළපාලිය හැදෙන්නත් මුලක් තියෙනවා. නමුත් දැන් ඒක වැහිල ගිහින්.

එදා ඔය හෙළි වෙච්ච අය තමයි ඉස්සරහින්ම ගියේ. ඒ තමයි මහ රහතන් වහන්සේලා. මොකද හයම එළි කරගත්තෙ උන් වහන්සේලා විතරයි. ඊළඟට පහ එළි කරගත්තු උදවිය පිටි පස්සෙන් ගියා. ඒ තමයි බ්‍රාහ්මණ කොටස. ධර්මය හෙළි කරමින් ලෝකයාට සුද්ධතාවය දුන්නෙ ඒ විදියට ගිහින් තමයි. අඳුරු දුරු කරල, කිළිටි දුරු කළේ ඔය හෙළි කරගත්තු උදවියයි, පහ එළි කරගත්තු උදවියයි දෙගොල්ලොම එකතු වෙලා. හෙළි වෙච්ච අය තමයි රහතන් වහන්සේලා. නැවතත් එළි කරගන්න දෙයක් උන් වහන්සේලාට නෑ. එතකොට 5 ක් එළි කරගත්තු බ්‍රාහ්මණ කොටස තමයි පිටිපස්සෙන් ගියේ. මේ දෙගොල්ලන්ම එකතු වෙලා යන ගමනට කිව්ව, හෙළි සහ පහ එළි යනව කියල. ඒ යන්නෙ මොකටද හෙළි පෙහෙළි කරන්න. අදත් සුද්ධ පවිත්‍ර කරන වැඩවලට හෙළි පෙහෙළි කරනවයි කියල කියනවා. ඒ පද මාලාව ඒ තරමටම දුර ගිහින් තියෙනවා. නමුත් ඒ වචන ආපු විදිය දන්නෙ නෑ. නමුත් එදා පෙළපාලි යනවයි කියල යම්කිසි තැනකට ගියේ ගහ මරා ගන්න නෙවෙයි. පිරිසක් විදියට එකතු වෙලා ගියේ මිනිස්සුන්ට යමක් කියල දෙන්න. **එදා හෙළි පෙහෙළි කරන්න පෙළපාලි ගියා. අද ගහ මරාගන්න, විරෝධය පාන්න පෙළ පාලි යනවා.** හැබැයි කොහෙන්ද ඔය වචන ආවෙ කියල ඇහුවොත් ඒක හොයන්න පොත්වලින් බෑ. ඒක තමයි නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් හොයා ගන්න වෙන්නෙ. මෙන්න මේ වගේ අපි දන්නෙ නැති වචන තියෙනවා.

මේ වගේ තවත් වචනයක් තමයි හොටෙල් කියන වචනය. අපි හිතන් ඉන්නෙ මේ වචනය ඉංග්‍රීසි වචනයක් කියල. නමුත් මුල ගත්තොත් අපිටත් මෙහෙම වචනයක් තිබුණා. ඒක අද අපි දන්නෙ නැති පැත්තක්. වැසිකිළිවල

තියෙන අසූචි ආදී අපද්‍රව්‍යවලින් ජීව වායුව (ගෑස්) ගන්න ක්‍රමය අද ඊයෙ විතරක් නෙවෙයි, එදා රජ කාලෙත් තිබුණා. ඒවායින් බට දාල ඇදගෙන ගිහින් ගල් තලාවකට යටින් සම්බන්ධ කරල රත් කරන ක්‍රමයක් එදා තිබුණා. ඒ ගල් තලාවට යටින් එන වායුව ගිනි ගැනීමෙන් තමයි ගල් තලාව රත් වුනේ. ඕක ඉතින් හොඳට මැදල තියෙන පැතලි ගලක්. ඒ ගල රත් වුණාම ඒක උඩට දාල තමයි ඒ කාලෙ හිටපු මිනිස්සු රොටී වගේ දේවල් හදල තලාගෙන පුච්චගෙන කෑවෙ. ඒ වගේම දූන් තේ එන්න ඉස්සරත්, කෝපි කහට හරි බෙලි මල්, රණවරා වගේ මොනව හරි බොන්න හදාගත්තෙත් ඔය රත්වෙච්ච ගල් තලේ උඩ වතුර මුට්ටියක් හෝ ගල් වලක් තියේ නම් ඒකෙ තියල රත් කරගෙන. ඔතන පැළක් හදාගෙන ඔය වැඩේ කරන කොට අර යටින් එන ගින්දර හෝ හඬින් ගල් තලේ යටට තමයි ආවෙ. ඒ සද්දෙ මිනිස්සුන්ට ඇහෙනවා. ඒ හෝ.... ගාන තලේට දාල තමයි එදා මොනව හරි රත් කරගත්තෙ. මේ නිසා තමයි හෝ + තලය - හෝතලය කියල එදා සිංහල ක්‍රමයට කිව්වෙ. නමුත් මේ හෝතලයට එහෙම කියාගන්න බැරිව, හොටෙල් කියල කිව්වෙ ඉංග්‍රීසි ජාතිකයින්. හරියට ස්කූල් (School) කියන ඉංග්‍රීසි වචනය අපිට ඒ විදියට කියන්න අමාරු නිසා අපි ඉස්කෝලෙ කියල කියනව වගේ තමයි. කොහොම හරි දූන් මේ හෝටලය කියන වචනය ඉංග්‍රීසින්ගෙ වචනයක් වෙලා. අපි හිතන් ඉන්නෙ අපි ඒ මිනිස්සුන්ගෙ හොටෙල් කියන වචනය හෝටලය කරගත්ත කියල. නමුත් ඒක නෙවෙයි වෙලා තියෙන්නෙ. අපි කෝපි කහට බොන තැනට ඇවිත් හෝතලය කියල කියා ගන්න බැරි වෙච්ච නිසා, ඒ අයට පහසු වෙන විදියට හොටෙල් කියල කියන්න ගත්තු එක තමයි අපි නැවතත් හෝටලය කරගෙන තියෙන්නෙ. නමුත් මේ වචනය මේ අවුරුදු හාර පන්සියයකට මෙහා ආපු එකක් නෙවෙයි. ඊට හුඟක් ඉස්සර ඉඳන් අපිට තිබිච්ච වචනයක්.

මේ වගේ අපි දන්නෙ නැති මූලධර්මයක් තියෙනවා. මේ විදියට මේ හැම භාෂාවකම, හැම පදයකම අභ්‍යන්තරයේ අර හෙළි භාෂාව හෙවත් අපේ හෙළ භාෂාවේ ගති හඬට අනුකූල හෙළ සංඥාව තියෙනවා. ඒ හෙළ සංඥාව වට කරල තමයි අර පරිවාර හඬ තියෙන්නෙ. ඕක අපට පේන්නෙ නැතිවට මේ වචනය මොකක්ද කියල අපේ හෙළ භාෂාවේ එන හඬේ ගැබ්වෙලා තියෙනවා.



ඒ නිසා තමයි වෙනත් භාෂාවන්වල වචනවලටත් හෙළ බසින් නිරුක්ති දෙන්න පුළුවන් වෙන්නෙ. හැබැයි මේ හෙළ බස කියල කියන්නෙ දූන් තියෙන සිංහල (හෙළ) භාෂාවම නෙවෙයි. දූන් තියෙන්නෙ මිශ්‍ර එකක්. නමුත් එදා තිබුණෙ සුද්ධ හෙළ බස. කාලයත් සමගම ඒක විවිධ භාෂාවන් සමග මිශ්‍ර වෙලා, අද එදා තිබිච්ච හෙළ බස ඒ විදියටම නෑ. නමුත් මේ හැම වචනයකම හඬේ ඒ සුද්ධ හෙළ සංඥාව ගැබ් වෙලා තියෙනවා. ඒක නිරුක්ති පටිසම්භිදා ඥානයට ගෝචර වෙනවා. හැබැයි ඉතින් නිරුක්ති පටිසම්භිදා ඥානය නැත්නම් ඒක හොයාගන්නත් බෑ. ඒ ඥානය උපරිමයටම තියෙනව නම්, ඕනෑම භාෂාවක ඕනෑම වචනයක් මුල හැදුණු තැන පටන් දූන් තියෙන තැනට ආපු විදියටම කියන්න පුළුවන්. ඒක කාගෙන්වත් අහගෙන කියන එකක් නෙවෙයි. හැබැයි හැමෝටම කියන්නත් බෑ. ඒකට අර ඥානය තියෙන්න ඕන.

එහෙනම් මේ ලෝකයේ සියලුම මිනිස්සු මුලින්ම කතා කළේ සා මාගධී මූල භාෂාවෙන්. ඒක පහ එළි භාෂාව. පාළි කිව්වෙ ඒකයි. හැබැයි මේ පාලි කියන්නෙ දූන් තියෙන පාලි භාෂාවම නෙවෙයි. එදා තිබිච්ච පාලි භාෂාව අදට වඩා හුඟක් වෙනස්. අද ඒක කාලයත් සමග සෑහෙන දුරට පරිණාමය වෙලා. ඒ නිසා තමයි එදා අගත අනගත චතුදිස සගස දිනේ කියල කිව්ව එක, අද වෙන කොට ආගතා නාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස දේම කියල වෙනස් වෙලා තියෙන්නෙ. නිකං ඉඳල හය එළි කරගන්න හෙවත් හෙළි කරගන්න හම්බ වෙන්නෙ නෑ. ඒකට වැඩපිළිවෙලක් තියෙනවා. හය එළි හෙවත් හෙළි කරගත්තෙ රහතන් වහන්සේලා. මේ නිසා **සිවු පිළි සිඹියාපත් මහරහතන් වහන්සේලාට භාෂාවක් හැදෙනවා. ඒක තමයි හෙළ බස කියන්නෙ.** ඒක රහතන් වහන්සේලාගේ ඉඳන් මග ඵල ලාභීන් දක්වා ආර්යන් අතර මිසක් වෙන කොහේවත් නෑ. **සීහ හෙළ හෙවත් ශ්‍රේෂ්ඨතම හෙළයා තමයි බුදුන් වහන්සේ. එහෙම නැත්නම් ශ්‍රේෂ්ටතම ළයක් ඇත්තා. ඉතින් හෙළයන්ගෙ නායකයා බුදු රජාණන් වහන්සේ කියල තමයි දිව්‍යාපදානයෙත් කියල තියෙන්නෙ. මේ නිසා බුදුන් වහන්සේ පටන් ගත්තු භාෂාව තමයි මේ හෙළ බස කියන්නෙ.** උන් වහන්සේ පහල වෙන්න පෙර හිටියෙ, පහ එළි කරගත්තු අය. ඒ අය බුදුන් වහන්සේගෙන් බණ අහල හය වෙනි ඉන්ද්‍රියත් හෙළි කරගෙන තමයි අන්තිමට පාළිවල ඉඳල හෙළවලට සුද්ධ වුණේ. පාළි කතා කරපු අය හෙළි කරගෙන හෙළ වුණා. එතකොට **පාළි පිරිස හෙළ පිරිසක් බවට පත්වුණේ බුදුන් වහන්සේගෙන් ලැබිච්ච ආභාසය නිසා.**

දූන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, බුදුන් වහන්සේ හඳුන්වා දුන් භාෂාව හෙළ බස නම්, ඇයි උන් වහන්සේ මාගධී භාෂාවෙන් දහම් දේශනා කළේ කියල. ඒකට හේතුව මේකයි. බුදු කෙනෙක් පහළ වෙන කොට ලෝකයේ හැමෝටම තේරුම් ගන්න පුළුවන් භාෂාවක් විදියට තියෙන්නෙ මාගධී භාෂාව විතරයි. ඒ තමයි හැමෝගෙම හැඟීම් දනවන ආදි කල්පික භාෂාව. නමුත් හෙළ බස එන්නෙ බුදු කෙනෙක්ගෙ පහළ වීමත් සමග. ඊට පස්සෙ තමයි ඒක ක්‍රමානුකූලව මිනිස්සු අතරට යන්නෙ. ඉතින් ඒ හෙළ බස උන් වහන්සේ ඇතුළු මහ රහතන් වහන්සේලාට වැටහුණාට, ඒ කාලෙ ඉන්න අනෙක් අයට වැටහෙන්නෙ නෑ. මේ නිසා තමයි හැමෝටම තේරෙන මාගධී භාෂාවෙන් ධර්මය දේශනා කළේ.

**හැබැයි මෙතනදී හෙළ බස කියල කිව්වම මේ කතා කරන්නෙ, යම් පිරිසකට සීමා කරගෙන දූන් කියන විදියට උප්පැන්න සහතිකයේ තියෙන සිංහල ගැන නෙවෙයි. බුදුන් වහන්සේ පෙන්වා දුන් ආකාරයට හෙළයෙක් වෙන්න, මේ ලෝකෙ ඕනෑම මනුස්සයෙකුට පුළුවන්. හැබැයි ඒ උන් වහන්සේ දේශනා කරපු ධර්මය අහල, අර කියපු විදියට හෙළි කරගත්තොත් තමයි. නමුත් මේ කාරණය අද වැහිල ගිහින්.**

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වෑහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# පෙරහරෙන් කියවෙන සැඟවුණු දහම් කතාව...



ඇසළ මාසය කියන්නෙ රටේ විවිධ ප්‍රදේශවල පන්සල්, දේවාල මුල් කරගෙන පෙරහර පවත්වන කාලය. එතැන් පටන් තවත් මාසයක් දෙකක් යනකල් ශ්‍රී දළදා පෙරහරේ පටන් විවිධ ප්‍රදේශවල මේ පෙරහර ඇසළ සැණකෙළියක් විදියට පැවැත්වෙනවා. මේක අනාදිමත් කාලයක පටන් පැවතුණත් විශේෂයෙන් අද වෙන කොට මේ පෙරහරෙන් කියවෙන සැබෑ අරුත් දැන ගෙන නෙවෙයි පෙරහර පවත්වන්නෙ, පෙරහර බලන්නෙ. මේ නිසා මොකද වෙලා තියෙන්නෙ, සමහරු සුන්දර බුද්ධාගම ආදී වචනවලින් පැරණි බෞද්ධ වත්පිළිවෙත් විවේචනයට ලක් කරනවා. ''මේක පස්සෙ හදාගත්තු එකක්, බුදුන් වහන්සේගෙ එකක් නෙවෙයි. නිකං සංකේත ටිකක් විතරක් පෙන්නල මිනිස්සු මුලාවට පත් කරන විනෝද වැඩ පිළිවෙලක්, නිකං පොඩි එවුන් නටවනවා...'' මේ විදියට සමහරු විවිධාකාරයෙන් මේ පෙරහර විවේචනය කරනවා. පෙරහරේ තියෙන දහම් අර්ථය තේරුම් අරගෙන නැති නිසා තමයි එහෙම විවේචනය කරන්නෙ. පෙරහර කරන උදවියත් බොහෝ කොටම දහම් අර්ථය දැනගෙන නොකරන නිසා ඒ විවේචනවලට උත්තරත් නෑ.

ඈත අතීතයේ පටන් පැවතෙන මේ පෙරහරේ එහෙම වැදගත්කමක් නොතිබුණා නම් මෙච්චර කාලයක් එක දිගට පැවතෙන්න විදියක් නෑ. විශේෂයෙන් ලෝකයේ යථා ස්වභාවය පෙන්වා දෙන බුදු දහමත් සමග එකට බැඳිල මේ විදියට පැවතෙන්න විදියක් නෑ. මේ නිසා පෙරහරේ දහම් අර්ථය මොකක්ද කියල මතුපිටින් බලන්නෙ නැතිව ගැඹුරින් විමසා බැලිය යුතුයි. මෙතනදී අනාදිමත් කාලයක පටන් පැවත එන මේ පෙරහර චාරිත්‍රය විවිධ කාලවලදී, විවිධ ප්‍රදේශ වශයෙන් ඇවිත් අද වෙන කොට යම් යම් වෙනස්කම් ඇති වෙලා තියෙන්න පුළුවන් වුණත්, එදත් අදත් ප්‍රාදේශීය වශයෙනුත් මේ හැම පෙරහරකටම මුල් වෙච්ච මූල ධර්මයක් තියෙනවා, පොදුවේ කියවෙන දහම් අර්ථයක් තියෙනවා. ඒ පොදු දහම් අර්ථය තමයි මේ පෙන්වා දෙන්න උත්සාහ කරන්නෙ. මේ නිසා එදා පටන් අද දක්වා පෙරහරට එකතු වෙච්ච නව අංගයන්, වෙනස් වූ අංගයන් හා ප්‍රාදේශීය වශයෙන් තියෙන වෙනස්කම් නොසලකා, විශේෂයෙන් පෙර පැවතුන ක්‍රමයට ඉදිරිපත් කරන පොදු දහම් අර්ථයක් තමයි මේ පැහැදිලි කරන්නෙ.

අපි හැමෝටම එක්තරා හරයක් හෙවත් සාර ධර්ම කියල කොටසක් තියෙනවා. විශේෂයෙන් බොදුනුවන්ට විමුක්තිය සලසා ගන්න ඒ සාර ධර්ම වැදගත් වෙනවා. ඒ සඳහා පළමුවෙන්ම කරන්න ඕන පූර්ව හරයක් තියෙනවා. ඒ කියන්නෙ මහා සාර ධර්ම ගන්න පෙර ලබාගන්න ඕන සාර ධර්ම කොටසක් තියෙනවා. කොටින්ම කියනව නම් මේ **සමාජයේ බොහොමයක් මිනිස්සුන්ට එක පාරටම නිවන් දකින බණක් කිව්වට තේරෙන්නෙ නෑ, ඒ සඳහා යොමු වෙන්නෙ නෑ. මේ නිසා ඒ නිවන් දකින බණ අහන්න පෙර, මේ සංසාරයේ ස්වභාවය මෙන්න මෙහෙමයි කියල යම් යම් රූප, ශබ්ද මාධ්‍ය යොදාගෙන පෙන්වනවා, ඒ සඳහා පරිසරය සකස් කරල දෙනවා.** මොකද ඒ වගේ දේවල් බලන්න අහන්න බොහොමයක් උදවිය කැමතියි. අන්න ඒ වගේ **නිවන් දකින බණ හෙවත් හරය අහගන්න පෙර කරන දේ තමයි පෙරහර කියන්නෙ.** එතකොට ඉස්සර පන්සලේ බණ කියන්න පෙර තමයි ඔය පෙරහර පැවැත්වුණේ. මහ හරය ගන්න බණ අහන්න පෙර ඒකට හැඩ ගැහිල පසුතලය සකස් කරගන්න ඕන, මනස හදාගන්න ඕන. ඒ සඳහා කරන පෙර වැඩ පිළිවෙල තමයි පෙරහර කියන්නෙ.

මේ වගේ පෙරහරක් කරන්න පළමුව සාම්ප්‍රදායිකව බොහෝ තැන්වල කෙරෙන සිරිතක් තමයි සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පැවැත්වීම. දස දහසක් සක්වල ඉන්න දිව්‍ය බ්‍රහ්ම ආදීන්ට, මේ කරන්න යන සත් කටයුත්ත ගැන මූල සංඥාවක් ලබා දීමක් මේකෙන් කෙරෙනවා. මොකද එක පාරටම ගහෙන් ගෙඩි එන්න වගේ කරනවට වඩා අර වගේ දැනුම් දීමක් කිරීම විශේෂයි. මෙතනදී දෙවියන්ගෙ දේවකාරි කියල කොටසක් තියෙනවා. ඒ අයත් බොහොම කැමතියි මේ වගේ පිංකම්වලට. ඉතින් ඒ අයත් මේ කටයුත්තට මුල පටන්ම ප්‍රසාදය දක්වල ආශිර්වාද කරනවා. ඒ අයගෙ බැල්ම ලැබෙනවා. ඒත් එක්කම සමහර විට සාංඝික දානයකුත් දෙනවා. ඒකෙනුත් අර වගේ මුල පිරීමක් තමයි කෙරෙන්නෙ. පිං කැමති විවිධ කොටස් ඒකට සම්බන්ධ වෙනවා.

ඊළඟට කප් හිටවනවයි කියල චාරිත්‍රයක් තියෙනවා. ඒ සඳහා පේ කරන්න, කොස් ගස් වගේ කිරි ගහක අත්තක් කපා ගන්නවා. මේ කිරි ගහකත් විශේෂත්වයක් තියෙනවා. ඒවායින් විශේෂ සුදු කිරණ ශක්තියක් විහිදෙනවා. ඒ වගේම කිරි ගහ මෘදුයි. මෘදු කියන්නෙ කොවුල නෑ කියන එක නෙවෙයි. ඒකෙ ස්වභාවය තමයි ඒ. නමුත් කිරි නැති හර ගස්වල තියෙන්නෙ රළු ස්වභාවයක්. කිරි ගස්වල තියෙන ශාන්ත ස්වභාවය නිසා බොහෝ කොටම දේවතා සම්බන්ධය වැටෙනවා. කිරි ගහක අත්තක් කපල ඒක පන්සල් භූමියේ හෝ දේවාල අසල හිටවීමෙන් ඒක මාධ්‍යයක් කරගෙන දේවතා ආකර්ශනය සිද්ධ වෙනවා. ඒ අත්ත විශේෂයෙන් කැප කරනවා. ඊට පස්සෙ දෙවි දේවතාවුන්ට ඇවිත් වාසභවනයක් වශයෙන් ඉන්න පුළුවන්. මොකද ඉඳිකටු සිදුරක තරම් ප්‍රදේශයකත් 10000 ක් ඉඳගෙන බණ ඇහුවයි කියල ධර්මයේ සඳහන් වෙනවා. ඒ නිසා ඔය හිටවන අත්ත හොඳටම ප්‍රමාණවත්. කොහොම හරි ඒ අයට ඉන්න කැප කරපු පරිසරයක් තියෙන්න ඕන. මහ රහතන් වහන්සේලා වැඩ ඉඳෙද්දි නම් ඔය වගේ පරිසරය හදාගන්න කිරි ගස් හොයන්න ඕන වුණේ නෑ. ශාන්ත පරිසරය කොහොමත් තිබුණා. එහෙම නැති ☞

තැනකදී ඒ අයගෙ විමන් පිහිටන්න වෘක්ෂයක් තියෙන්න ඕන. එතකොට තමයි පහසු වෙන්නෙ. නැකතට කප් හිටවනවයි කියල හොඳ වෙලාවක් බලල කළාම ඒ වෙලාව තමයි හොඳ දේවල්වලට හේතු වෙන්නෙ.

ඒ වගේම නොඉඳුල් වළංවලින් විහාර මැදුරේ බුදු ආසන, මල් ආසන, දේවාල ආසන ආදිය සෝදා පවිත්‍ර කරන්න ඒ වළං හදන කුඹල්කරුවන් විසින් ඒවා පෙරහරකින් ගෙනත් පූජ කරන සිරිතක් තිබුණා. ඒක තමයි කුඹල් පෙරහැර කියල යන්නෙ. මුල් කාලෙ ඉඳන්ම ගම්බිම්වල කුඹල් වැඩ කරන උදවිය ඒ කටයුතු භාරගෙන තිබුණා. ආරම්භයට අවශ්‍ය කරන වැඩ කොටසට මේ වගේ නොඉඳුල් වළං, මැටි පහන්, පැන් කල ආදිය පූජ කරල ඒ අයත් මේකට සම්බන්ධ වෙනවා.

ඊළඟට මල් පෙරහර කියල දෙයක් තියෙනවා. පුංචි ළමයින්ගෙ ගති ලක්ෂණ තමයි ඒකෙන් පෙන්වන්නෙ. ඒ කියන්නෙ මල් අරගෙන යන පොඩි ළමයි දැක්කම සැඩ ගති නැති වෙලා මෘදු මානසිකත්වය ඇතිවෙලා ඒකට අවශ්‍ය කරන පසුතලය හැදෙනවා.

පාවඩ පෙරහර කියල මොන විදියට කළත් ඒකෙත් සැඟවිච්ච දහම් අරුතක් තියෙනවා. පහත හෙවත් බිම තියෙන්නෙ යම්කිසි කුණු රොඩු වගේ අපද්‍රව්‍ය. ඒ උඩින් පාවඩයක් එළනවයි කියන්නෙ අර පහත් අපද්‍රව්‍යවලින් ආරක්ෂා කරනවයි කියන එක. එතකොට සීලයට උපමා කරල තියෙන්නෙ පොළොව. සීලය පිරිසිදු කරගන්නව කියන සංකේතය තමයි මේ පෙන්වන්නෙ. එතකොට පොළොවෙ කටු, කුණු අපද්‍රව්‍ය තියෙනව නම් ඒවා ඊර්සියා, ක්‍රෝධ, මාන ආදිය වගේ. සුදු පාවඩ එලා ඒ මතින් සදාතුක කරඬුව වැඩමවීමෙන් ඒ වගේ අපද්‍රව්‍ය සුද්ධ කිරීම සංකේතවත් වෙනවා. ඒ වගේම කවිකාර මඩුව කියල එකක් තියෙනවා. බුදු ගුණ සහ ඒ ගුණ තුළින් කෙරෙන ආශිර්වාදයක් තමයි මේකෙන් කෙරෙන්නෙ.

ඊළඟට මේ පෙරහර වීදි පෙරහර කියල සාමාන්‍යයෙන් ඒ අවට ගම්වල තියෙන ප්‍රධාන මං මාවත්වල ගමන් කිරීමක් සිද්ධ වෙනවා. මේ වීදිවල ඒ ඒ ප්‍රදේශවලට අරක්ගත් දේවතා, යක්ස කොටස් ඉන්නවා. මේ වගේ දෙයක් ඒ අයටත් දැනුම් දීල ඇරයුමක් කෙරෙනවා. සමහර වෙලාවට එහෙම නොකළොත් ඒ අය අමනාප වෙනවා. අමනාප වුණොත් විරුද්ධකම් කරන්න පුළුවන්. නමුත් අපි ඕනෑම අවස්ථාවක කෙනෙකුට ආරාධනා කළොත් ඒ පුද්ගලයා සංතෝස වෙනව වගේ දෙයක් මෙතනත් සිද්ධ වෙනවා. ඒ අය යම්කිසි ආරාධනාවක් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඒ යන ගමන් විශේෂ ගම්පතිවරුන්ගෙ ගෙවල් අසල නවත්තල, ඒ ස්ථානවල ඒ අයටත් උපහාර සඳහා පොඩි නැටුමක් දෙකක් නටනවා. එහෙම නටල ඒ අයගෙත් අවසරය ලබාගන්නවා. එතකොට තමයි චිත්ත ප්‍රසාදය ඇති වෙන්නෙ. මේ විදියට වීදියක් වීදියක් ගානෙ පෙරහර යනවා.

තවත් ඉදිරියට යන කොට රන්දෝලි පෙරහර කියල උත්කර්ෂවත් වෙනවා. ඒක වටිනාම දේවල් එකතු කරල සකස් කරල යවන පෙරහරක්. වත්කම් පෙන්වීමත්, ලබාගැනීමත් දෙකම මෙතනදී සිද්ධ වෙනවා. මේ පෙරහර යන කොට ඉස්සර හිටපු මිනිස්සු ඒකට පුණ්‍යාධාර විදියට තමන් ළඟ තියෙන රත්රන් කාසි ආදිය විසි කරනවා. මේ විදියට යම්කිසි වටිනාකමක් ඒකට ලබා දෙනවා.

දැන් මේ විදියට ගමන් කරන මහ පෙරහරක එකින් එකට විවිධ අංග තියෙනවා. ඒවායේ අනුපිළිවෙල සමහර විට යම් යම් අවස්ථාවල වෙනස් වෙන්න පුළුවන් වුණත්, මේ විස්තර කරන්නෙ සාමාන්‍යයෙන් ඒ වගේ පෙරහරක ඒ ඒ අංගයන්ගෙන් සංකේතාත්මකව අදහස් කරන දේ. ඒ තමයි සැඟවුණු දහම් අරුත.

ඉස්සෙල්ලම කසකාරයො යනවා. මේ සමාජයේ ජීවත් වෙන කොට පොඩි පොඩි දේවල්වලට රණ්ඩු සරුවල් ඇති කරගත්තොත්, අවසානයේ මහ සද්දෙට විනාසයක් ඇති වෙන්න පුළුවන්. කසය පටන් ගන්න කොටම ඇද වෙලා ගිහින් අවසානයේ මහා කම්පනයක් ඇති කරනවා. අර ඇද ගහපු කසය අවසානයේ කෘෂ බවට පත් වෙනවා. මිනිස්සුත් අවිද්‍යාව, තණ්හාව නිසා මේ වගේ ඇද වෙලා අවසානයේ කෘෂ බවට පත්වෙනවා. **කෘෂ බවට පත්වෙන කොට කියනවා කසයක් වගේ කියල.** ඉතින් ඒකෙ අවසන් ප්‍රතිඵලය තමයි රණ්ඩු සරුවල් වෙවී විනාශ වීම. එහෙම වුණොත් මෙන්න මේ කසය වගේ මහා කම්පනයක් ඇති වෙලා කෘෂ බවට පත්වෙන්න සිද්ධ වෙනවා. එතකොට පුංචියට පටන් ගත්තු එක ලොකු විනාශයකින් කෙළවර වෙනවා. ඒක තමයි මේ පෙන්වන්නෙ.

දැන් මෙහෙම යන කොට රාග, ද්වේෂ, මෝහ ගිනි හට ගෙන ඒකට බැඳුනම හැම වෙලේම ගිනි ගත්තු ගමනක් ඇති වෙනවා. මේ තුන අවුල ගෙන යන ගමන අපට පේන්නෙ නෑ. ඒක තමයි මේ ගිනි බෝලවලින් සංකේතවත් කරන්නෙ. අපිට පේන්නෙ ගිනි රවුම් යනව විතරයි. මෙන්න මේ වගේ මේ සංසාර ගමනත් ඒකට උපමා කරල බලන්න ඕන. මේ සසර ගමනත් ලෝක සත්වයා ගිනි ගෙන යන ගමනක්. **අවිද්‍යාවෙන්, තණ්හාවෙන් තැවි තැවී, දැවි දැවී ලෝක සත්වයා යන හැටි තමයි මේ ගිනි බෝල කරකැවීමෙන් පෙන්වන්නෙ.** ඇලෙනවා, ගැටෙනවා. ඔය දෙකෙන් තමයි සත්වයා යන්නෙ. ඇලීමෙන් ගැටීමෙන් රාග ගින්නයි, ද්වේෂ ගින්නයි හට ගන්නවා. මෝහය නිසා මේක පටල ගන්නවා. රාග ද්වේෂ නිසා මෝහයත්, මෝහය නිසා රාග ද්වේෂත් හටගන්නවා. මේක පෙන්වන්න තමයි ගිනි බෝල දෙපැත්තට කර කවමින් යන්නෙ. මේ විදියට නොදන ගියොත් රාග, ද්වේෂ, මෝහ ගිනි ඇවිලිලා අරමුණු හොයාගන්න බැරි ගමනක් යන්න වෙනවා. ඒවාට වට වෙලා, කොටු වෙලා රවුම් ගහනවා. නිරෝධ කරන්න බෑ. රෝදයක් වගේ රවුමට ගින්දර කරකවන්නෙ ඒක පෙන්වන්න, සසර ගමන ගිනි කියල හඳුන ගන්න, මේ වගේ ගිනි චක්‍රවල තමයි ලෝක සත්වයා යන්නෙ කියල හඳුන ගන්න.

ඊළඟට ඇත්තු පෙළක් යනවා. හොඳට ලස්සනට සැරසිලා, ලෝකයට මහන්තත්වය පෙන්වන්න, ආඩම්බරකමට ලොකු අය වෙලා ලෝකයට පේන්න යනවා. රාග, ද්වේෂ, මෝහවලින් ගිනි ගෙන ගියාම ලෝක සත්වයා මේ වගේ තත්ත්වයන්ට පත් වෙනවා. මහන් තත්වය නිසා මනස පහත් තත්වයට පත් වෙනවා. ගාම්භීර වෙලා පුහු ආඩම්බරකමින් මනස උදුම්මගෙන, ලොකු අය කියල හිතාගෙන යනවා. ඔය ලොකුකම් අත්හැරල යන්න ඕන. ලොකුකම් එක්ක ගියොත් වෙන්නෙ මෙන්න මේකයි කියල බලා ගන්න. ලොකුවට මහත් වෙලා තිරිසනෙක් වෙනවා. ඒ තත්ත්වය බලාගන්න, එතැනට පත් වෙන්න එපා. **මහන් තත්වයට පත් වෙලා මහත් වෙච්ච අයගෙ ස්වභාවය තමයි මේ අලි පෙරහරින් පෙන්වන්නෙ.** සංඛාරයට අනුව ජාතිය ගොඩ නැගෙන හැටි.

ඊළඟට ඒ ඇත් පෙළත් එක්කම නිළමෙල යනවා. **නිළ තල දරාගෙන, බඩ මහතට පුම්බගෙන ඒවායින් මත්වෙලා, ලෝකෙන් අරගෙන ගසාගෙන කාල ගොඩ ගහගෙන ඉන්න අයගෙ හැටි පෙන්වන්න තමයි මේ යන්නෙ.** ඒ අයත් වට කරගෙන මුරකාවල් දාගෙන මුරායුධ අරගෙන යන කොටසක් ඉන්නවා. සමාජය තුළ තම තමන් සම්පත් අරගෙන ඒවායින් මත් වෙලා බඩ වඩාගෙන, ඊට පස්සෙ ඒවා රැකගන්න මුරකාවල් දාගෙන යන හැටි තමයි මේ පෙන්වන්නෙ. දැන් ඉතින් මේ වගේ තත්ත්වයන්ට පත් වෙලා, මහන් තත්ව කමට, ලොකුකමට ඔළුව ලොකු කරගෙන, තමන්ට තියෙන එකක් පෙන්වන්නෙ නැතුව වෙනත් කෙනෙක්ගෙ ඔළුවක් පැළඳගෙන ඉන්නවා. හදවතේ නැති හිනාවක් අර වෙස් මූණෙන් මතු කරගෙන අභ්‍යන්තරයේ නැති දෙයක් පිටට පෙන්වනවා. නැති අයත්

පුළුවන්කාරකමෙන් යන හැටි තමයි මේ පෙන්වන්නෙ.

බොරු කකුල් දාගෙන තවත් කට්ටියක් මේක පිටිපස්සෙන් යනවා. ලොකුකම් පෙන්වගෙන, බොරුවට උඩගුකමින් අනිත් අයට වඩා උඩින් යනවා. නැති ලොකුකම් පෙන්වනවා. ඒකත් මේ සසර ගමනේ යන කොට තියෙන සමාජයක හැටි. කෙට්ටු අය තමයි බොරු කකුල් බැඳගෙන යන්නෙ. ඇති දෙයක් නෑ. නමුත් හරිම උඩගුයි. හරිම අහංකාරයි. ලෝකෙට කැපිල පේන්න දඟලන, අපි මෙහෙමයි කියන ගති ලක්ෂණ තමයි මේකෙන් පෙන්වන්නෙ. මේකෙ කටුක විපාක තමයි ඊළඟට පස්සෙන් එන්නෙ.

මේ වගේ හැසිරුනාම මිනිස්සු නීචකම් කරනවා. මිනිහෙක් වෙලා ඉඳගෙන මිනිස් බල්ලෙක් වෙනවා. ඒක පෙන්වන්න ලොකු බලු ඔලුවකින් මුහුණ වහගෙන යනවා. මිනිස් හරකෙක් පෙන්වන්න හරක් ඔළුවක් දාගෙන යනවා. නරි ඔළුවක් දාගෙන නට නටා යනවා. කයෙන් මිනිහෙක්. නමුත් ගති ලක්ෂණවලින් තිරිසනෙක් වෙලා. එහෙම යන කොට තිරිසන් ලෝකෙ සත්තු වෙලා යන හැටි දකින්න ලැබෙනවා. මනුස්සයෙක් වෙලා කරගත්තු වැඩ පිළිවෙල තමයි මේකෙ මුල. ඔය ගති ලක්ෂණ ඔළුවට ගන්න එපා කියන එකයි මේ පෙන්වන්නෙ.

ඊළඟට විවිධාකාරයෙන් නට නටා යන නැට්ටුවො ඉන්නවා. කයිතාලම්-කරුවො, පතුරු නැට්ටුවො, චාමර නැට්ටුවො, නයියණ්ඩි නැට්ටුවො, රබන් නැට්ටුවො ආදී වශයෙන්. මෙතන නැට්ටුවො කිව්වමත් අර්ථයන් දෙකක් පෙන්වනවා. එක කොටසක් තමයි මේ වැඩකට නැති, ලෝකයේ හැම තැනම නට නටා ඒ පැත්තට මේ පැත්තට හැරී හැරී ලෝකයා මුලා කරවන නැට්ටුක්කාර වැඩ පිළිවෙල, ඒ විදියට කරන රඟපෑම්. මේවා හඳුන ගන්න කියන එක තමයි මේ පෙන්වන්නෙ. ඒ අතර කාවඩි නැටුම කියල එකකුත් තියෙනවා. තමන් තුළ යම් කිසි ආකාරයක පිහිටල තියෙන කහට ගති ඇත්නම් ඒවා ප්‍රසිද්ධියේ එළි දක්වනවා, හංගන්නෙ නැතිව කියනවා. මේ මේ ගති ලක්ෂණ මං ගාව තියෙනවා, මගෙන් වැරදි වෙලා තියෙනවා කියල දෙවියන් ඉදිරියේ සමාව ගැනීමක් අර්ථ දක්වනවා. මෙතනදී කාවඩියක් අරගෙන කරේ තියාගෙන නැටුමක් නටනවා. ඒක වක ගැහිච්ච එකක්. අවංක දෙයක් නෙවෙයි. වංක දෙයක්. ඒක කරේ තියාගෙන හිටියයි කියන එක ක්‍රියාවෙන් පෙන්වනවා. යන්න තිබිච්ච අඩි පාරත් කැවා. ඒක තමයි මේ පෙන්වන්නෙ. තම තමන්ගෙන් පොඩි වරදක් හරි වුණාතම් ඒක මේ විදියට සිහි කරගන්න ඕන. ඒ කාලෙ මම මෙහෙම දේකට මුලා වුණා. නමුත් දැන් මම ඒක බැහැර කරනවා කියන එක තමයි, අනිත් සැරේ කරින් කරට කාවඩිය මාරු කරකර විසි කිරීමෙන් පෙන්වන්නෙ. මේ විදියට කර දෙකේ තියාගෙන නටනවා. එකකින් අනෙකට විසි කරනව මිසක් අතින් අල්ලන්නෙ නෑ. තම තමන් අතින් සිද්ධ වෙන සුළු සුළු වැරදි ඇත්නම් ඒවා එකින් එකට එකතු කරගන්නෙ නැතිව විසි කරල දාල, හිතෙන් නිදහස් වෙලා සුද්ධ වෙනවා. තවත් විදියකින් මේක අර්ථ දක්වනව නම් ''ක'' කියන්නෙ කිළුටු හෙවත් කහට. ''වාඩි'' කියන්නෙ වඩියක් හෙවත් කොටසක් කියන එක. අවිද්‍යා තණ්හාවෙන් හදාගත්තු මේ කහට වැඩ පිළිවෙලේ, කහට වාඩියේ ලැගල ඉන්නවා කියන එක. ඒක තමයි කැව අඩිය කියල කිව්වෙ. ඉතින් වරද වරද හැටියට දකල කමා කරගන්න සිරිතක් මේකෙන් පෙන්වනවා.



ඊළඟට මේ අපේ දේශීය නැටුම් කලාව ගත්තම අනෙක් නැටුම්වලට වඩා ඒකෙ විශේෂත්වයක් තියෙනවා. **උඩරට, පහතරට, සබරගමු ආදී වශයෙන් තියෙන ඔක්කොම නැටුම්වල අතපය ගෙනියන හැටි බැලුවොත්, එක් එක් අයගෙ ශරීරවල තියෙන විෂ කිරණ ඇදල අරගෙන, අන්තිමට පොළවට බහා තබන ස්වභාවයේ ක්‍රම රටාවක් තමයි තියෙන්නෙ. මේ නැටුම් රටාව සම්පූර්ණ විද්‍යාවක්.** කිරණ ශක්තිය තුළින් බාහිර ලෝකෙ තියෙන විස කිරණ පොළවට බස්සවන විද්‍යාවක් තමයි මේ නැටුම් ක්‍රමය. එතකොට ඒකට ගැලපෙන දේවතාවො අර නැට්ටුවන්ගෙ ශරීරවලට සම්බන්ධ වෙනවා. එහෙම සම්බන්ධ වෙලා ඒ අයට අවශ්‍ය ශක්තිය දීල මග පෙන්වනවා. ඒ කාරණය සමහර විට නැට්ටුවො දන්නෙත් නෑ. නමුත් කොච්චර වෙලා නටාගෙන ගියත් අවසාන වෙනකල්ම හතියක් මහන්සියක් නෑ. මහ පුදුමාකාරයේ නැටුම් කැරකි කැරකි නටනවා. නමුත් වෙහෙසක් නෑ. මෙතනදී ගාන්ධර්ව කියන දේවතා කොටස් තමයි සම්බන්ධ වෙන්නෙ. ඒ අය දිව්‍යමය නැටුම් ශිල්පීන්. නැට්ටුක්කාරයන්ගෙ ශරීරවලට සම්බන්ධ වුණාම ඒ අයගෙ නැටුම් තමයි මේ නටන්නෙ. ඒක විද්‍යානුකූල, ශාස්ත්‍රානුකූල නැටුම් කලාවක්. ඉතින් දේව කොටස් ඒ නැටුමට නොපෙනෙන පැතිවලින් සම්බන්ධ වෙලා ඒක මෙහෙයවනවා. ඒ නිසා තමයි කිසි වෙහෙස මහන්සියක් නැත්තෙ. ඉතින් **මේ විද්‍යානුකූල නැටුම් දිහා බලා හිටියම හිත යම් කිසි මානසික සුවයකට පත් වෙනවා. ඒක ඉදිරි වැඩ පිළිවෙලට වැදගත්.**

දැන් මෙහෙම යන කොට තවත් කණ්ඩායමක් ලී කෙළි නැටුම් නටනවා. සමාජයේ ගැටෙන හැටි තමයි මේකෙන් පෙන්වන්නෙ. එක්කෙනාට එක්කෙනා ගැටෙන කොට ඇති වන මහා ඝෝෂාව. එක් කෙනෙක් ද්වේෂ හිතකින් ගැටෙන කොට අනෙක් කෙනාටත් ද්වේෂ හිතක් හට ගත්තොත් ඒකෙන් ලොකු ඝට්ටනයක් ඇති වෙනවා. දෙන්නට දෙන්න ලීවලින් ගහ ගන්නෙත් මේ විදියට ඇති වන ඝට්ටනය පෙන්වන්න. මේක සෙල්ලමක් නෙවෙයි, එකිනෙකා කෙරෙහි ද්වේෂ හිතකින් ගැටෙනව නම්, ඒ මොහොතක් මොහොතක් ගානෙ අන්‍යොන්‍ය වශයෙන් ඝට්ටනයක් ඇති වෙනවා. මේ සංසාර ගමනෙදි ගැටි ගැටී යන ගමනක් මේකෙන් පෙන්වනවා. ඉස්සෙල්ලම තමන් ගැටෙනවා. ඒක තමයි අර තමන්ගෙ අත් දෙකේ තියෙන ලී කෑලි දෙක එකිනෙක ඝට්ටනය කිරීමෙන් පෙන්වන්නෙ. ඊට පස්සෙ අනුන් එක්ක ගැටෙනවා. ඒක තමයි දෙවනුව අනෙකාගෙ අතේ තියෙන ලීයට ගැහීමෙන් පෙන්වන්නෙ. තමා කරා ආපු ගැටීම අනෙකාටත් යනවා. ගැටීම නිසා ද්වේෂයට පත් වෙනවා, දැවෙනවා. ඒකෙන් තමනුත් අනුනුත් විනාශ වෙනවා. ගැටි ගැටී යන සංසාරයේ ස්වභාවය තමයි මේ.

දැන් ඊළඟට මෙහෙම ගිහින් විවිධ භාණ්ඩ නාද කරනවා. පංච තූර්ය නාදය ඇහෙනවා. ඉස්සෙල්ලම කෙනෙක් හක්ගෙඩියක් පිඹගෙන යනවා. අද පන්සලේ සංඛ නාදයක් පවත්වනවා කියන එකයි මේ දැනුම් දෙන්නෙ. **සක් හඬ කියන්නෙ සුද්ධ හඬ කියන එක.** ඒ තමයි දහම් හඬ. ඒක තමයි මේ දැනුම් දෙන්නෙ. දහම් හඬ සංකේතවත් කරන්නෙ සංඛ නාදයෙන්. අෂ්ඨ බ්‍රහ්ම ස්වර නාදය පෙන්වන්නෙ සංඛ නාදයෙන්. ඒක බුදුන් වහන්සේට තිබිච්ච හඬ. මහා බ්‍රහ්මයටත් ඒක තියෙනවා. හැබැයි බුදුන් වහන්සේට සම කරන්න බෑ. නාදය ලෙළදීම, රැව් දෙන හඬ, ගැඹුරු හඬ, හදවතින්ම එන හඬ, අධිෂ්ඨාන කරල සීමා කළ හැකි හඬ... ආදී වශයෙන් ඒක විග්‍රහ වෙනවා. මෑත ☞

කාලයේ මේ හඬින් අල්ප මාත්‍රයක් හරි පිහිටල තිබිච්ච හිමිනමක් තමයි පාතදුරේ අරියධම්ම හාමුදුරුවො. ඒ හඬ කාටවත් පහසුවෙන් අල්ල ගන්න බැරිවුණා. හරි ගැඹුරු, ලෙල දෙන ස්වභාවයේ හඬක්.

ඊළඟට හොරණෑව පිඹිනවා. කනට මිහිරි කර්ණ රසායනයක් ඇති දහම් හඬේ කිසිම හොරයක් නෑ. ඒ හඬ ශාන්තයි, ප්‍රණීතයි, මිහිරියි, මධුරයි. **හොර නැති හඬ තමයි හොරණෑව පිඹීමෙන් පෙන්නුම් කරන්නෙ.** හොර නැති හඬ අහන්න එන්න කියලයි මේ ආරාධනා කරන්නෙ.

ඊළඟට අපිට දැන ගත යුතු ධර්මතාවයන් තවදුරටත් පෙන්වා දෙනවා. එකක් තමයි හේවිසි හඬ. බෙරය දෙපැත්තෙ තියෙනවා ඇස් දෙකක්. ඒක තමයි බෙර ඇහැ කියන්නෙ. ඒකට කෝටු දෙකකින් අධි වේගයෙන් කරකවල ගහනවා. මේ වගේ අපේ ඇස් දෙක කරාත් වේගයෙන් අරමුණු එනවා. එන එන මුලා සහගත අරමුණු විසි කරන්න කියන එකයි මේ කියන්නෙ. ඒවා පාලනය කරල විසි කරන්න, ඒවා තියාගන්න එපා කියන පණිවිඩය තමයි මේ දෙන්නෙ. ඒ කියන්නෙ බෙර ඇහැට ගහන කොට ඒ හඬ ආව ගියා එච්චරයි. ඉතිරි වන දෙයක් නෑ. ඇහැට එන අරමුණුත් ඒ වගේ තමයි. ඒ සංකේතය තමයි හේවිසි හඬෙන් පෙන්වන්නෙ. හේ කියන්නෙ දැනීම, පෙනීම. පෙනෙන දේ අල්ල ගන්නෙ නැතිව විසි කරන්න කියන එකයි මේ කියන්නෙ. සේ + යා - සේයාව කියල කියන්නෙ පෙනීම සමග එකතු වෙනවා කියන එක. (හේ=සේ) සේ යා කර ගන්නෙ නැතුව විසි කරන්න කියන එකයි හේවිසි කියන්නෙ.

ඊළඟට ඊට වඩා අඩු වේගයෙන් ගැට බෙර ගහනවා. අපි කනට කියනව කන් බෙරය කියල. බෙරය කියන්නෙ බිහිරි කියන එක, බෙරි හඬ. මේ කියන්නෙ බෙරිහන් දෙන්න එපා, කෑ කෝ ගහන්න එපා, ඒවා නැතිකර ගන්න කියන පණිවිඩය. මොකද දහම් ශ්‍රවණයට ඒක හරි බාධාවක්. කෑ කෝ ගහන කොට ගැටළු ලිහා ගන්න බෑ. **ගැටළු සහිත හඬ මතු කළොත් මෙන්න මේ වගෙයි කියන එක ගැට බෙරයෙන් පෙන්වනවා.**

ඊළඟට දවුල් ගහනවා. මිනිස්සු හැම වෙලේම දාහය නිසා අවුල ගන්නවා. බඩේ දාහය එන කොට හැම වෙලේම මොකක් හරි රස ආහාරයක් හොයාගෙන කන එක තමයි කරන්නෙ. මේ දාහය හරි කටුකයි. ඒකට තමයි ආහාර ගන්නෙ. හැම වෙලේම හිත කම්පා කරනවා. මෙන්න මේ වගේ පංච කාම රසයට ගිජු වෙන්න එපා, රසයට ගිජු වෙන්න ගියොත් දාහය නිසා අවුලට පත් වෙනවා. දාහයට අවුල ගන්න කොට දාහ දේවල් ඇවිලෙනවා. දාහය අවුල ගත්තොත් බණ අහන්න බෑ. ඒක තමයි මේ දවුල කියන්නෙ.

ඊළඟට තම්මැට්ටම් ගහනවයි කියනවා. තම් කියන්නෙ යම් කිසි ස්ථානයක්. ඒ ස්ථානයේ තියෙන බාධක මට්ටම් කරල මැඩ පවත්වනවා. තාලම් කියන්නෙත් යම් කිසි තහවුරු බවක් ඇති කරගන්න ඒ සඳහා ආලය කරනවා කියන එක. සම්පත්තිය, සුගතිය තමයි තහවුරු කර ගන්නෙ. ඒකට ආලය කරන එක තමයි තාලම් කියන්නෙ.

ඊළඟට පොඩි ළමයි සුදු ඇඳගෙන කොඩි සේසත් උස්සගෙන යනවා. මේකෙන් අන්තිමට ඒකවරණය තමයි පෙන්වන්නෙ. **සත් බවින් ඇති කරන්නා වූ සුවය, ශාන්තිය තමයි සේසත් කියන්නෙ.** මේ සේසතේ තියෙන්නෙ චක්‍ර. ඒ කියන්නෙ අට ලෝ දහම් චක්‍රය, පටිච්ච සමුප්පාද චක්‍රය, සූවිසි පට්ඨාන චක්‍රය .... ආදී මේ වගේ චක්‍ර තමයි සේසත්වල ඉස්සර කාලෙ ඇඳල තිබුණෙ. තවත් විදිහකින් කියනවනම් සත් භාවයේ සෙවණ කියන එකයි සේසත් කියන්නෙ. දැන් ඉතින් මේ විදියට මේ සසර ගමනේ ස්වභාවය මෙහෙම පෙන්වගෙන ගිහින්, ඔය ටික දැනගත්තට පස්සෙ ඒ වගේ වැඩවලින් ඉවත් වෙලා හදවත් පිරිසිදු කරගෙන නිදහස් කරගන්න කියන එක තමයි අර සුදු පිරුවට ඇඳගෙන, කොඩි සේසත් උස්සගෙන සාදුකාර දීගෙන යන ගමනින් පෙන්වන්නෙ.

බණ අහන්න පෙර මෙන්න මේ ටික දැනගෙන, ඒවායේ ආදීනව දැන ගෙන පිරිසිදු හදවතින් පන්සලට එන්න බණ අහන්න, මේ සංඛ නාදය අහන්න, හොර නැති හඬ අහන්න කියල තමයි මේ කියන්නෙ.

මෙහෙම ගිහින් බණ කියන්න ඉස්සෙල්ල පෙරහැරේ අවසාන අංගය විදියට දිය කැපීම සිද්ධ කරනවා. කඩුවෙන් දිය කපල දිය දෙබෑ වෙන වතුර අතරින් නොඉඳුල් වතුර කලයක් අරගෙන ඒක ඊළඟ අවුරුද්ද එනකල් තියල තියනවා. මේකෙන් සිසිල තමයි සංකේතවත් කරන්නෙ. මොකද සැබෑ දේවාලයකින් ගිනි දෙන සැඩ පරුෂ දේවල් කරන්නෙ නෑ. හැම වෙලේම පෙන්වන්නෙ මූලික වශයෙන් තිබිච්ච සිසිලක්. ඒක අර සිසිල් දිය භාජනයෙන් පෙන්වනවා. මේ දේවාලෙ ඉන්න කපු මහත්තයෙක්වත්, එතනට සම්බන්ධ කිසි කෙනෙක්වත් ගිනි දෙන දේවල් කරන්නෙ නෑ. සිසිල් දේවල්මයි කරන්නෙ. සමහර විට ගිනි දෙන දේවල් කරල තිබුණොත්, අර කලේ වතුර අවුරුද්ද යන කොට අඩු වෙනවා. එහෙම වුණොත් ඒක සාපයක්. ඒ කියන්නෙ ඒ දේවාලෙ මොනව හරි ගිනි දෙන වැඩ කරල තියෙනවයි කියන එක. එහෙම වතුර අඩු නැත්නම් ඒක සුභයි. මේ විදියට මනින ක්‍රමයකුත් තියෙනවා. ඔය වතුර බඳුන තමයි ඊළඟ අවුරුද්දෙ දිය කපනකොට අළුත් වතුර බඳුනකට මාරු කරන්නෙ.

දැන් මේ පෙරහරේ වැඩ ඔක්කොම ඉවර වෙලා තමයි පන්සලේ ධර්ම ශාලාවෙ බණ කියන්නෙ. එහෙම ක්‍රමයක් තමයි ඉස්සර තිබුණෙ. ඉතින් ඕක කළාට පස්සෙ වස් දොස් සමනය වෙනවයි කියල අදත් කියනවා. නමුත් වෙන ක්‍රමය දන්නෙ නෑ. අර වගේ **සංසාරයෙ තියෙන ස්වභාවය ක්‍රමානුකූල රටාවකට පෙන්නුම් කරල, මිනිස්සුන්ගෙ හිත් යම්කිසි ශාන්ත ස්වභාවයකට පත් කරල, සුද්ධ දහම අහන්න සැලැස්සුවම වස් දොස් සමනය වෙනව තමයි.** නමුත් අද මේ කාරණය වැහිල ගිහින්. ඒ නිසා තමයි මේ සුන්දර බුද්ධාගම ආදී වචනවලින් මේ වගේ චාරිත්‍ර වාරිත්‍ර විවේචනය කරන්නෙ. හැබැයි අවංකවම බැලුවොත් බුදු දහම කොහොමත් සුන්දර තමයි. දරවලින් කරන්නෙ ගිනි අවුලන එක. දර සුන් කළාම ඇවිලෙන ගින්න නිවෙනවා. එහෙනම් සුන්දර බුද්ධාගම කියල කිව්වට වැරදි නෑ. නමුත් ඒ අදහසින් නෙවෙයි මේ කියන්නෙ, විවේචනය කරන අදහසින්. උපාදානය කරන දර භවයට දැම්මම ගිනි ඇවිලෙනවා. උපාදාන දර ඉවත් කළාම දර සුන් වෙනවා. එතකොට සුන්දරයි. ඉතින් ආනන්ද, මා උපන් රට කෙතරම් සුන්දරද කියල බුදුන් වහන්සේ ඇහුවම, දැන් ඉන්න අපේ අය කියනවා කොච්චර ලස්සනද ? කොච්චර මනස්කාන්තද කියල. මේ රටේ පරිසරය තුළ, පන්සලේ පරිසරය තුළ මේ උපාදානය දුරු කරන්න ඒකට කොච්චර ගැළපෙනවද කියලයි මේ ඇහුවෙ. නමුත් අද හිතන් ඉන්නෙ උන් වහන්සේ ලෝකෙට ආසාවෙන් අවට පරිසරය බැලුව කියල. මෙහෙම අධ්‍යාත්මික නායකයෙක් තමන්ගෙ රටේ ලස්සන කිව්ව කියල ඒ මුලා අදහස් තමයි ගන්නෙ. දහම් අරුත් සැඟවිලා.


දැන් මේ විදියට පෙරහරෙන් පිළිඹිබු වන අධ්‍යාත්මික හරය පෙන්වා දුන්නෙ, ළඟ එන ඇසළ පෙරහර වෙනද වගේ මතුපිටින් ලස්සන විතරක් බලන්නෙ නැතිව, මේකෙන් කියවෙන දහම් පණිවිඩය විමර්ශනාත්මකව විමසා බලා, ඒ විදියට සිද්ධ කෙරෙන පැරණි බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර විවේචනය නොකර, ඒ තුළින් ඵල ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් කියන කාරණය පෙන්වා දෙන්න.

*වතරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## අභයරතනාලංකාරය - 21

# මනුස්සයින්ට ලෙඩ රෝග හදන ගුප්ත ක්‍රම සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම් කිහිපයක්



- වහරක අභයරතනාලංකාර හිමි

*(පසුගිය කලාපයෙන් - නිවසකට සෞභාග්‍යය උදාකර දෙන්න මැණික් ගලකින් දෙවඟනක් මැවූ හැටි...)*

හූල් පැන්නුම්, වැල් පැන්නුම්, රූපයට කටු ගැසීම්, කටහඬ අල්ලා කරන ඇණ ගැසීම් ආදී කටයුතුවලින් මනුස්සයින්ට ලෙඩ රෝග කරදර ඇති වෙන හැටි මේ දහම් සඟරාවේ මීන් පෙර කළාපවල විග්‍රහ කරල තිබුණා. දැන් මේ වගේ දේවල් තියෙනවයි කියල ඔප්පුවෙන, මම මුහුණ දුන්න, මට අහන්න දකින්න ලැබුණු සත්‍ය අත්දැකීම් කිහිපයක් තමයි මේ විස්තර කරන්නෙ.

යම්කිසි කෙනෙක්ගෙ නම එල්ල කරල ජීවමක් කළාම ඒ නමම තියෙන තවත් අයටත් ඒක වදින්න පුළුවන්. නමයි වාසගමයි දෙකම දාල ජීවම් කළොත් ඒ අදාල පුද්ගලයාට ළං වෙලා ඒක ආසන්න වෙනවා. සමහර විට ඒ විදියටම එකම නමයි වාසගමයි තියෙන තවත් පුද්ගලයෙක් නැති වෙන්න පුළුවන්. නමුත් බැරි වෙලා හරි එහෙම හිටියොත් ඒක බෙදිල ගිහින් අර එල්ල කරපු නැති අයටත් වදින්න පුළුවන්. ඒ වගේ නමක් ජීවමකට කොටු කළොත් ඒකෙන් අරමුණු කරපු ආකර්ශනය හෝ විකර්ශනය ඒ නම තියෙන අනෙක් අයටත් බලපාන්න පුළුවන්. ගිහි කාලයේ මං අත්දැකපු ඒ වගේ සිද්ධියක් තමයි මේ.

එක්තරා මන්ත්‍ර ගුරුකම් දන්න කෙනෙක් තරුණයෙකුට එක්තරා ගැහැණු ළමයෙක් වසඟ කරගන්න යන්ත්‍රයක් හදල දුන්නා. කන බොන ආහාරයකට දාල ඉනාවක් වගේ දෙයක් දෙන්න අවස්ථාවක් නොතිබුණු නිසා තමයි මේ වගේ ක්‍රමයක් ඒකට යොදා ගත්තෙ. දැන් මේ තරුණයා ඒ යන්ත්‍රය පැළඳගෙන තමන්ට අවශ්‍ය කරන මොනව හරි බඩු මුට්ටු ටිකක් ගන්න එක්තරා සාප්පුවකට ගියා. ඒ සාප්පුවේ ලස්සන ගැහැණු ළමයෙකුත් හිටියා. ඒ ළමය දන්නෙ අඳුනන්නෙවත් නැතිව හිටි ගමන් අර තරුණයා ළඟට ඇවිත් ඔහුගෙ අතේ තිබ්බ්ච ඔරලෝසුව අල්ලල අතපත ගාන්න පටන් ගත්තා. දැන් මේ ගැහැණු ළමයගෙ දෙමවුපියනුත් ඒ සාප්පුවේ හිටියා. ඒ අයටත් මේ තමන්ගෙ දරුව නිසා කර කියා ගන්න දෙයක් නැතිව මුහුණට මුහුණ බලා ගත්තා. ඉතින් ඒ ළමයට තේරෙන්නෙත් නෑ ඇත්ත වශයෙන්ම තමන් මොකක්ද මේ කළේ කියල. ඒ ළමය එතැනින් ගියේ නැතිව අර තරුණයගෙ අතේ ඔරලෝසුව අල්ලගෙන හිටියා. ඒ අවස්ථාවේදී ඒ ගැහැණු ළමයට ලැජ්ජාවක් කියල දෙයක් නැතිව ගියා. මොකද මේ තරුණයාව කලින් දැකලත් නෑ. අනෙක තමන්ගෙ දෙමාපියනුත් ළඟම ඉඳෙද්දි. සාමාන්‍යයෙන් සිද්ධ වෙන දෙයක් නෙවෙයි මේ.

පස්සෙ මම මේ සිද්ධිය මොකක්ද කියල සෝදිසි කරල බැලුවා. බලන කොට එකම නම තියෙන තවත් කෙනෙක් තමයි මේකට පැටලිලා තියෙන්නෙ. දවසක් අර සාප්පුවේ හිටපු ගැහැණු ළමයට තමන්ගෙ දෙමවුපියන් ඒ නමින්ම කතා කරනව මට ඇහුණා. බලන කොට ඒ නමමයි අර වසඟ කරගන්න ඕන වෙච්ච ගැහැණු ළමයටත් තිබුණෙ. හැබැයි වසඟ කරගන්න ඕන වෙච්ච කෙනා වෙන කෙනෙක්. ඒ කෙනාට වසඟ වෙන විදියට අර ජීවම් කරල දුන්න යන්ත්‍රයත් දාගෙන මේ තරුණයා අර සාප්පුවට ගියාම, ඒ නමින්ම හිටපු වෙනත් ළමයෙක් වසඟ වුණා. නමුත් ඒ ළමයට තේරෙන්නෙ නෑ මොකක්ද වුණේ කියල. යන්ත්‍ර මන්ත්‍රවල තියෙන බලවත්කම තමයි මේකෙන් පේන්නෙ. ඒ ආකර්ශන ශක්තියට තමන්ගෙ හිත ඇදිල යනවා. ඉතින් ඒ නමම තියෙන තවත් ගැහැණු ළමයි හිටිය නම් ඒ අයත් ආකර්ශනය වෙන්න ඉඩ තිබුණා. සමහර විට ඒ නමින්ම ඉන්න වයසක ස්ත්‍රියක් වුණත් ඇදිල එන්න පුළුවන්.

දැන් මේ විස්තර කරන්නෙ තවත් ඒ වගේ වැල් පැන්නුමක් සම්බන්ධ අත් දැකීමක්. හැබැයි මේක කලින් සිද්ධියට වඩා බොහොම භයානක දෙයක්. කාන්තාවක් මාස් සුද්ධිය හැදිල ඉන්න අවස්ථාවක, ඒ කාන්තාව එල්ල කරල රත්නිවිතිය දණ්ඩක් මතුරල බැන්දොත් ලේ යාම නතර කර ගන්න බැරිව මහා විනාශයක් වෙනවයි කියල මීන් පෙර කලාපයකින් පැහැදිලි කරල තිබුණා. අන්න ඒ වගේ සිද්ධියක් තමයි මේ. අපේ ගමේ කට්ටඩි වැඩ දන්න එක්තරා පුද්ගලයෙක් හිටියා. හොඳට ඉගෙන ගත්තු, ඥාතිත්වයෙන් නෑනා කෙනෙකුත් ඔහුට හිටියා. ඉතින් පාර තොටේදි නිකම් මූණ ගැහුණත්, හා නෑනෙ.... කොහෙද මේ යන්නෙ..... ආදී වශයෙන් විහිළුවට කොලොප්පමට අහනවා. ඒ කාන්තාවත් ඒ වගේම, ආ..... මස්සිනේ යනව මේ කඩේට... කියල බොහොම ලෙන්ගතුකමින් කියන සිරිතක් තිබුණා. මේ විදියට තමයි ඒ අය හිතවත්කමින් කතා බහ කළේ. එක අවස්ථාවක මේ කාන්තාවට ඈත පළාතකට ගුරු පත්වීමක් ලැබුණා. ගුරු පත්වීමෙන් කාලෙකට පස්සෙ නැවතත් නිවාඩුවකට ගමට ආවා. මෙහෙම ආපු වෙලාවක නැවතත් මූණ ගැහිල ''ආ නෑනෙ කොහෙද බොල මේ පත්වීමක් හම්බවුණා කියන්නෙ..... '' මෙහෙම කියල අර පුද්ගලය මේ කාන්තාවට වෙනද වගේම කතා බහ කළා. නමුත් දැන් ඒ කාන්තාව එහෙම කතා කරනවට ලැජ්ජයි. ''හඃ.... නෑන බව කවුරුත් දන්නෙ

නැතුවයි..... උඹ කතා කරන හැටි දැනගෙන හිටපං....'' මෙහෙම කියල මේ කාන්තාව අර පුද්ගලයාට සැර කළා. ''ආ උඹට දැන් එහෙනම් මෙච්චරකල් කරපු කතා අමතක වුණාද? බලමු එහෙනම්....'' ඒ පුද්ගලයත් මේ වගේ උත්තරයක් දුන්නා.

දැන් මේ පුද්ගලය ළඟත් මන්ත්‍ර ගුරුකම් තිබ්ච්ච නිසා මේ කාන්තාව ගැන හොඳට සෝදිසියෙන් හිටියා. කොහොම හරි වටේ පිටේ ලකුණු බලල අර කාන්තාවගෙ මාස් සුද්ධිය වෙන කාලය අල්ලල කොටු කළා. ඒ දවස්වල ගෝනගල්දෙණිය නගරයේ බේත් සාප්පුවක් තිබුණා. මේ පුද්ගලයා දැන ගෙන හිටියා, බේත් සාප්පුව පිටිපස්සෙ රත්නිවිතිය වැලක් තියෙන බව. ඔහු මොකද කළේ, ඔළුවෙ ඉඳන් පොරවගෙන බොරුවට උණ ගැනිල කියල මේ සාප්පුවට බේත් ගන්න කියල ගියා. ඊට පස්සෙ බොරුවට ඔක්කාර කරන්න කියල අර බේත් සාප්පුවේ පිළිකන්න පැත්තට ගිහින් හනික රත්නිවිතිය දණ්ඩක් කඩා ගත්තා. කඩල ඒක මැතිරුවා. මතුරල කොහොම හරි යන මාර්ගයේ හරහට තියල අර කාන්තාවට පැන්නෙව්වා.

මේක බොහොම අමාරුවෙන් කරගන්න වැඩක්. නමුත් මේ ගම් පළාතෙ පාරවල්වල තියෙන පිහිටීම අනුව ඒක ලේසියෙන්ම පන්න ගන්න පුළුවන් වුණා. මොකද ප්‍රධාන පාරෙ නෙවෙයි ගෙවල් තිබුණෙ. අඩි පාරවල් දිගේ ඇවිදල එහෙන් මෙහෙන් ප්‍රධාන පාරට යන්න තිබුණ නිසා, හැංගිලා බොහොම ලේසියෙන් ඒ පැන්නුම කර ගත්තා. මේ කාන්තාවත් ගෙදර ඇවිත් රැකියාවට යන බලාපොරොත්තුවෙන් පිටත් වෙන වෙලාවක තමයි මේක පැන්නුවෙ. ඔහොම පන්නල දවසක් දෙකක් ගියාට පස්සෙ අර ස්වභාවිකව නැවතුණු මාස් සුද්ධිය නැවත ඇති වෙන්න පටන් ගත්තා. ඊට පස්සෙ නැවතත් ලේ යාම වැඩි වෙලා මේ කාන්තාවට සිහි නැතිවෙලා රෝහල් ගත කළා. ඒක දැනගෙන අර පුද්ගලයා සෝදිසියෙන් ඉඳල නැවතත් අර දියට දාපු රත් නිවිතිය දණ්ඩ දියෙන් අරගෙන දුමට දාල තිව්වා. ඊට පස්සෙ නැවතත් අර කාන්තාවට සිහිය ආවා. සනීප වෙලා ගෙදර එක්ක ගෙන එනකොට මේ පුද්ගලය සෝදිසියෙන් ඉඳල මොකද කරන්නෙ, අර රත් නිවිතිය දණ්ඩ නැවතත් දියට දානවා. ඉතින් නැවතත් ලෙඩේ වැඩි වෙනවා. ඒක වෛද්‍යවරුන්ට හොයා ගන්නත් බෑ. ඔය විදියට කීප වතාවක්ම කළා.

කොහොම හරි මේක නවත්ත ගන්න බැරිව කාරණය දැනගෙන, මේ දෝසය කපන්න ඒ කාන්තාවගේ ගෙදර උදවිය ලෑස්ති කළා. මේක කපන්න යනවයි කියල දැනගත්තු අර පුද්ගලයත් මොකද කළේ, තමන්ගෙ හිටපු ගුරුන්නාන්සෙ-ගෙන් ගිහින් ඇහුව, මුන් මේක කපන්න යනව මොකද මේකට කරන්නෙ කියල. එහෙනම් ආයෙමත් දුමේ තියපන් කියල ගුරුන්නාන්සෙ කිව්වා. ඒ පාර දෝසෙ කපන්න ඉස්සෙල්ල නැවතත් අර රත්නිවිතිය දණ්ඩ දියෙන් අරගෙන දුමේ තිව්වා. දැන් කැපුවට කැපෙන්නෙ නෑ. මොකද ඒක කැපෙන්න නම්, රත් නිවිතිය



දණ්ඩ දියට දාල ක්‍රියාත්මක වෙන අවස්ථාවකදී තමයි කපන්න ඕන. නමුත් අර පුද්ගලයා ඒක දැනගෙන කපන්න බැරිවෙන්න දුමේ ගෙනත් තිව්වා. දැන් ඒ දෝසෙ කපන්න ආව ඇදුරො මේ කාරණය දන්නෙ නැතිව, වැඩේ කරල නැවතත් යනකොට මේ පුද්ගලය අහනවා, උඹල දෝසෙ කපලද යන්නෙ...., පුළුවන් නම් කපල බලපන් කියල. මොකද මේ පුද්ගලයටත් ඕන වුණේ, කොහොම හරි තමන් මෙහෙම වැඩක් කළයි කියල අර කාන්තාවට දැනුම් දෙන්න. මේ අය යන කල් ඉඳල අර පුද්ගලය නැවතත් රත් නිවිතිය දණ්ඩ දියට දැම්මා. දැන් නැවතත් අර කාන්තාවට අසනීපය හැදුනා. දැන් මේ කාන්තාව හොඳටම වැහැරිලා ඇදිල ගිහින් තමයි හිටියෙ. දෝසෙ කැපුවයි කිව්වට කැපිලත් නෑ. කර කියා ගන්න දේකුත් නෑ. මොකද අර පුද්ගලයගෙ උපක්‍රමය නිසා.

කොහොම හරි මේ කාන්තාවත් තමන්ට වෙච්ච සිද්ධිය දැන ගෙන, බුලත් අතක් අරන් ඇවිත් අර පුද්ගලයව හම්බ වෙලා ''අනේ මස්සිනේ මට සමාවෙයන්..... මං අතින් වරදක් වුණා..... මං අහංකාරකමට මෙහෙම වචනයක් කිව්වා..... ජීවිතේටම උඹ මගේ මස්සිනා තමයි .... මගෙ ජීවිතේ කොහොම හරි බේරල දෙන්න ....'' මේ ආදී වශයෙන් අඬල කියල බැගෑපත් වුණා. ''උඹ දැන් මම මස්සිනා කියල දැන ගත්තනෙ..... ඒ ඇති..... පලයං මම උඹව බේරනවා..... හැබැයි මීට පස්සෙ අර වගේ ලොකු වචන කියන්න එපා......'' ඒ පුද්ගලයත් මෙහෙම කියල දියේ දාල තිබ්ච්ච රත්නිවිතිය දණ්ඩ නැවතත් අරගෙන ඇවිත් කර වෙලා යන්න දුමට දැම්මා. ඊට පස්සෙ ඒක නැවතත් දියට දැම්මෙ නෑ. එහෙම්ම දුමේ තිබිල දිරල ගියා. අර කාන්තාවගෙ අසනීපෙත් එතනින්ම ඉවරයි. නමුත් ඒ දෝසෙ පහ වෙනකල් ඒ කාන්තාව ඒකෙන් වැහැරිලා ගිහින් බොහොම දුක් වින්දා.

ඒ වගේම මේ වැල් පැන්නුම්වලදී තවත් මතයක් තියෙනවා, සපත්තු සෙරෙප්පු දාගෙන ගියොත් වැල් පැන්නුවට වැඩක් නෑ, ඒව අහක් කරල පන්නන්න ඕන කියල. සමහර වෙලාවට එහෙම කාරණයකුත් තියෙනවා. නැතුව නෙවෙයි. එහෙම කරපු අවස්ථාවක් මම දැනුවත්ව තියෙනවා. මේ ඒ වගේ සිද්ධියක්. හැබැයි මේක කළේ යාළුවෙලා හිටපු තරුණයෙකුයි තරුණියකුයි වෙන් කරන්න. කොහොම හරි මේ තරුණයාගේ පවුලේ උදවියට ඒ තරුණයාව යාළු වෙලා හිටපු තරුණියගෙන් වෙන් කරන්න ඕන වෙලා තිබුණා. මේකට ඉස්සෙල්ලම ඒ තරුණයාට නූලක් පැන්නෙව්වා. හැබැයි ඒ පන්නන වෙලාවෙ ඔහු සෙරෙප්පු දාගෙන හිටපු නිසා ඒක වැදුනෙ නෑ. ඊට පස්සෙ මේ නූල කොහොම හරි උපක්‍රමශීලීව පැන්නුවා. ඒ පන්නපු කෙනා මාත් එක්ක ඒ කාලෙ ඒක පන්නපු හැටි කිව්වා. මේ අයට ඥාති වෙන මේ පුද්ගලය ගෙදර එළියෙ බොරුවට මෝටර් සයිකලයක් හදනව වගේ හිටියා. මෝටර් සයිකලය පණ ☞

ගන්වන්න බෑ කියල බොරුවට ඔහු එක්තරා උපක්‍රමයක් තමයි කළේ. දැන් අර තරුණයා, ගේ ඇතුලෙ පත්තරයක් බල බලා ඉන්නවා. බයිසිකලය හදන කෙනා ඒ ගෙදර හිටපු තමන්ගෙ අක්කට කිව්ව, දැන් මම මේ නූල අහවල් තැන තියනවා, මෙයාගෙ සෙරෙප්පු දෙක එතැනින් ඉවත් කරල මෙතනින් පැන්න ගමන් උඹ නූල හරහට තියපන් කියල. දැන් මේ තරුණයා හිමින් සීරුවේ වගක් නැතිව පත්තරේ බල බලා ඉන්න කොට, ඔහුගෙ දෙපාමුල තිබ්බ්ච සෙරෙප්පු දෙක හිමින් සීරුවේ හැංගුවා.

දැන් අර පුද්ගලයා බොරුවට මෝටර් සයිකලය පණ ගන්වන්න උත්සාහ කරනවා. ''මල්ලියෙ අනේ එන්නකො පොඩ්ඩක්..... මේක ස්ටාර්ට් වෙන්නෙ නෑ. මොකක් හරි දෝසයක් තියෙනවා මට නම් හොයන්න බෑ.....'' මෙහෙම කියල අර පත්තරය බලමින් හිටපු තරුණයට බොරුවට කතා කළා. ඔහුත් එතැනට යන්න සෙරෙප්පු දෙක බැලුවා. සෙරෙප්පු නැතිව වට පිට බලනකොට නැවතත් අර පුද්ගලයා එළියෙ ඉඳන් කෑ ගැහුවා, ඉක්මනට එන්න කියල. සෙරෙප්පු හොය හොයා ඉන්න වෙලාවක් නැති නිසා ඒකට උදව් කරන්න ඒ තරුණයා නිකම්ම ගියා. හැබැයි ගියේ අර නූල උඩින් පැනල. යන කොට අර පුද්ගලයා බොරුවට බයිසිකලයේ ස්විචය ක්‍රියා විරහිත කරල තමයි පණ ගන්වන්න උත්සාහ කරල තිබුණෙ. ඉතින් අර තරුණයා කියනවා, ඔයා ස්විච් එක ඕෆ් කරලනෙ ස්ටාර්ට් කරන්නෙ කියල. මොකද ඔහු හිතුවෙ ඇත්තටම ඒ පුද්ගලයට ඒක අමතක වෙලයි කියල. නමුත් ඔහු උපක්‍රමයක් තමයි ඒ විදියට සිද්ධ කළේ.

මේ විදියට කොහොම හරි අර නූල මේ තරුණයට පැන්නෙව්වා. එතැනින් පස්සෙ ඒ තරුණයා සහ තරුණිය අතර තිබ්බ්ච සම්බන්ධයත් කැඩුණා. මොකෙක් හරි මේ තරුණයට විරුද්ධ ආකර්ශනය ඇති කරන අමනුස්සයෙක් මේ නූලට සම්බන්ධ කරල බැන්දා. එහෙම බැන්දට පස්සෙ මොකද වෙන්නෙ, දැන් මේ තරුණයගෙ මානසිකත්වය අර ගැහැණු ළමය දකින කොටත් විරුද්ධයි. දැන් ජේන්න බැරිව යනවා. මේ තරුණයට පැන්නෙව්වෙ ගැහැණු ළමයව එපා වෙන්න. මොකද සමහර අමනුස්සයින් ඉන්නවා ස්ත්‍රීන් ජේන්න බෑ. ඒ වගේ අමනුස්සයෙක් අර වගේ නූලකට සම්බන්ධ කරල පැන්නෙව්වොත්, ඒ පුද්ගලයට අමනුස්සයා බැඳිල ඉන්නකල්, ඒ පුද්ගලයගෙත් අමනුස්සයට සමාන මොනව හරි ගති ලක්ෂණ තියෙනව නම් (ගති ආකර්ශන නියමය අනුව) දැන් අර ගැහැණු ළමය දකින කොටත් ජේන්න බැරිව යනවා, විකර්ශනය වෙනවා, තරහ යනවා, බනින්න හිතෙනවා. එතකොට සම්බන්ධය කැඩිල යනවා.

ළඟට කටහඬ අල්ලල කරන ඇණ ගැසීම් ගත්තොත්, මට ඒ වගේ සිද්ධියකට පෞද්ගලිකවම මුහුණ දෙන්න වුණා. මීට අවුරුදු 18-20 කට පෙර තමයි මේක සිද්ධ වුණේ. අපේ වත්තෙ ගේ ඉස්සරහ හොඳට හැදිච්ච තැඹිලි ගහක් තිබුණා. ටික දවසක් යනකොට අකුණු ගහල වගේ හිටි ගමන් මේ තැඹිලි ගහ මළා. මැරිල ටික කලක් ගියා. මං ඉතින් ඕක ගණන් ගත්තෙ නෑ. කුරුමිණියෙක් කාල මැරෙන්න ඇති කියල මම හිතුවෙ. නමුත් සෝදිසි කරල බලන කොට තැඹිලි ගහේ කරටියේ කුණු වෙච්ච කුඹලක් තියෙනව මම දැක්කා. ඒකට ගහපු යකඩ ඇණයත් එහෙම්ම තිබුණා. බලන කොට ඒ ඇණේ ගිනියම් කරපු එකක්. දැන් මට මගේ සමාධි දර්ශනයට ජේනවා, මේ තැඹිලි ගහට ගහපු ඇණය මගේ බෙල්ල හිර කරන්න ගහපු එකක් කියල. ඒක සොහොන් ඇණයක් අරගෙන ජීවම් කරල ගහපු එකක්. නමුත් ඒ දවස්වල ඒකෙ වෙනසක් මට දැනුනෙ නෑ. හැබැයි පහු වෙන කොට බෙල්ල හිර වෙලා අමාරුකම් එන්න පටන් ගත්තා. ඒ බෙල්ල හිර කිරීම් තවමත් එක්තරා මට්ටමකට තියෙනවා. මේ වගේ අවස්ථාවලදී තැඹිලි ගහේ කරටිය කඩල යනව වගේ බෙල්ල කැඩිල යනවා. නැත්නම් දරුණුවට බෙල්ල ඔත්පල වෙනවා. නමුත් තිබ්බ්ච මොකක් හරි ශක්තියක් නිසා ගහ මැරිල ගියාට බෙල්ල කැඩුනෙ නෑ. දරුණු පීඩා කිරීමක් කරන්න බැරි වුණත් එක්තරා මට්ටමකට ඒකෙ ආබාධය තවමත් තියෙනවා.

මේ ඒ වගේ මෑත කාලයේ වෙච්ච තවත් සිද්ධියක්. එක්තරා ගෙදරක අවුරුදු 1 1/2 - 2 ක් විතර වයස කුඩා දරුවෙක් හිටියා. මේ ගෙදර හිටපු වයසක මනුස්සයෙකුට ඒ කුඩා දරුවගේ ඇඬීම මහා කරච්චලයක් වුණා. මේ වයසක කෙනා මොනව හරි පැරණි මන්ත්‍ර ශාස්ත්‍ර දන්න කෙනෙක්. කිල්ලෝටයක් ඇරල මන්තරයක් මතුරල කෑ ගහන ශබ්දය අල්ලල වැහුවොත්, කටහඬ හිරවෙන බව ඔහු දැනගෙන හිටියා. මේ වයසක කෙනා මොකද කළේ, ඕකට හොඳ වැඩක් කරන්නම් කියල, අර දරුව හයියෙන් අඬන වෙලාවක් අල්ලල අර මන්තරය මතුරල එක පාරටම කිල්ලෝටය වැහුවා. ඒ දරුවගෙ කටහඬ එහෙම්ම එකපාරටම හිර වුණා. ඊට පස්සෙ ඒ දරුවට දිගටම කතා කරන්න බැරිව ගියා. දන්න කියන විවිධාකාර ක්‍රමවලින් දොස් කැපුවත් හරි ගියේ නෑ. ඒ ක්‍රම ඒ අය දැනගෙන හිටියෙ නෑ. අන්තිමට ඒ දරුව කතා කරන්න බැරි ළමයෙක් වුණා. හැබැයි ඒකෙ විපාකය අර වයසක පුද්ගලයටත් අන්තිම කාලයේ දරුණුවටම ආවා. ඒ පුද්ගලයා වයසට ගිහින් අන්තිමට කිසිම දෙයක් කතා කරගන්න බැරිව බොහොම අසරණ වුණා. තමන්ට අවශ්‍ය කරන බේතක් හේතක්, වස්ත්‍රයක්, ආහාරයක්වත් ඉල්ල ගන්න කතා කරන්න ශක්තිය නැතිව ගියා. කියන මුකුත් ඇහෙන්නෙ නෑ. සැහෙන්න දුක් වින්දා. අන්තිමට ඒකෙන්ම මළා. මැරිල බලනකොට සතර අපාගත වෙලා. සංසාරයේ කවද හරි නැවතත් මනුස්සයෙක් වුණත්, තමන්ටත් කතා කරගන්න බැරි වෙලා ගොළුවෙක් වෙන්න පුළුවන්. **මේ වගේ අනුන්ට වින කරන උදවිය, ඒවායේ විපාක විඳවන්න බොහෝ කොටම සතර අපාගත වෙනවා. නැවතත් මනුස්ස අත් බවයක් ලැබුවත්, අර කරපු විපාකවල ශේෂ ඇදිල ඇවිත් දරුණු විදියට පීඩා විඳින්න සිද්ධ වෙනවා.**

**දැන් මේ වගේ කාරණාවලින් මේ සංසාරයේ තියෙන භයානකත්වය තේරුම් ගන්න ඕන. අපි කොච්චර හොඳට හිටියත්, පෙර කර්ම විපාකවල ඵල විදියට දුක් විඳින්න සිද්ධ වෙනවා. මේ වගේ දේවල් කරන උදවියත් ඒවායේ තියෙන භයානකත්වය නොදැන කරන මේ වගේ වැඩවලින්, මුළු සංසාරයම අඳුරු කරගෙන කල්ප ගාණකට ගොඩ එන්න බැරි විපාක හදා ගන්නවා. මේ නිසා මේ වගේ කාරණා කියවල නිකං අහක දාන්නෙ නැතිව, කිසිම කෙනෙකුට මේ වගේ ගිනි දෙන්නවත්, මේවා අනුමත කරන්නවත් යන්නෙ නැතිව, මේ ලැබිච්ච මනුස්ස අත්භවය එළදායී සත් කටයුතුවලට යොදවල, මේ භයානක සංසාරයෙන් එතෙර වෙන්න උත්සාහ කරන්න ඕන. මේ වගේ කාරණා හෙළි කළේ ඒකට උපනිශ්‍රයක් වෙයි කියන බලාපොරොත්තුවෙන්.**

**(ඉතිරි කොටස ලබන කලාපයෙන්)**

**සටහන:**
**නීතිඥ චන්දන සිරිවර්ධන**


# උගුරේ හිරවී ඇති තදබල සෙම් ආසාදනයන් නැසීමට ප්‍රත්‍යක්ෂ ඔසුවක්

වහරක අභයරතනාලංකාර හිමියන් සමාධියෙන් දුටු, අත්දැකීම් සහිත තවත් ප්‍රත්‍යක්ෂ ඔසුවක් තමයි මේ හෙළි කරන්නේ. සමහර අයගෙ උගුර ගෙඩි වෙලා, ගල් වෙලා, හිරවෙච්ච සෙම කොච්චර කාරල ඉවත් කරන්න උත්සාහ කළත් ඉවත් වෙන්නෙ නැති අවස්ථා තියෙනවා. අන්න ඒ වගේ අයට උගුරෙ ගාන බේතක් තමයි මේ. මේ ප්‍රතිකර්මය උන්වහන්සේගේ සමාධියට හසුවුණේ එක්තරා සිද්ධියක් මුල් කරගෙන. උන් වහන්සේගේම වචනවලින් ඒ කතා සාරාංශය තමයි මේ.

''මේක සිද්ධ වුණේ 1990 ගණන්වල. ඒ කියන්නෙ මා හමුවෙන්න එන, ලෙඩ රෝග කරදරවලට පත් වෙච්ච පුද්ගලයින්ට යම්කිසි සමාධි ක්‍රමයකට අනුව ප්‍රතිකර්ම කරන කාලයක තමයි මේක සිද්ධ වුණේ. ඒ කාලෙ හිටපු එක්තරා මනුස්සයෙක්ගෙ උගුර ගල් ගැහිල, කාරන කොට හීනි ඉඳිකටු වගේ, මාළු කටු වගේ දෙයක් පිට වෙන්න පටන් ගත්තා. ඒකට නොයෙක් වෙදකම් කළත් හරි ගිහින් තිබුණෙ නෑ. දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව ඒක කටු පිළිකාවක් කියල තමයි අන්තිමට නිගමනය කරල තිබුණෙ. ඒ පුද්ගලයා මාව හමුවෙන්න ඇවිත් මේ මොකක්ද කියල අහන කොට තමයි, ඔහු වෙනුවෙන් මේ ප්‍රත්‍යක්ෂ ඖෂධය සමාධියට මතු වෙලා ආවෙ. මේ ප්‍රතිකර්මයෙන් පස්සෙ බලා ඉඳෙද්දිම ඒ කටු ඔක්කොම සෙමත් එක්ක ඇදිල ඇවිත් සති 3-4 ක් යන කොට සම්පූර්ණයෙන්ම ලෙඩේ සනීප වුණා. ඊට පස්සෙ මේ බේත තවත් අයටත් දීල ප්‍රත්‍ය වෙලා තියෙන නිසා, අනෙක් අයගෙත් යහපතට මේ විදියට සඳහන් කරනවා.''

මේ සඳහා යොදා ගන්නෙ ගුරුගල් කැට. ඒ කියන්නෙ උරච්චි කරන්න පුළුවන්, ගල ගෑවම ගෑ වෙන ජාතියේ ගුරු පාටට හුරු කබොක් ගලෙන් හැදිච්ච ගල්. කාලයාගේ ඇවෑමෙන් රවුම්, ඕවලාකාර ආදී විවිධ හැඩයන්ට හැඩ ගැන්වුණු මේ වගේ කුඩා කබොක් ගල් කැට සාමාන්‍ය ගුරු පාරවල්වලින්, ගෙදර මිදුලෙන් හෝ ඇල දොළවල් වගේ ස්ථානවලින් පහසුවෙන්ම හොයා ගන්න පුළුවන්. රතු පාටට හුරු ගුරු පැහැයෙන් යුත් මේ වගේ ගල් කැට කුඩු කරල අරගෙන ඉස්සර හිටපු මිනිස්සු දත් මදින්නත් පාවිච්චි කළා.





මෙන්න මේ ජාතියෙ ගල් කැට අහුරක් අරගෙන, බත් උයන දර ලිපක අළු යටට දාල තුන් හතර වතාවක් පමණ හෝ ඊට වැඩියෙන් බත් උයන අවස්ථාවල්දී ගින්දරට රත් වෙන්න ඉඩ හරිනවා. තුන් හතර වතාවක් විතර හෝ ඊට වැඩියෙන් දාල තියන්නෙ සාමාන්‍යයෙන් පැය 8 කට වැඩියෙන් ගිනියම් වෙන්න ඕන නිසා. ඒක එක දිගටම රත් නොවුණත් කමක් නෑ. ඒ වගේම බත් උයන ලිපක් නොවුණත්, මොකක් හරි දර ලිපකට දමල පැය 8 ක් විතර එක දිගට අළු යට රත් කර ගන්න පුළුවන් නම් ඒත් කමක් නෑ. රස්නෙ පිට වෙන්නෙ නැති නිසයි අළු යට දාන්නෙ. මේ නිසා මේක කබලක දාල රත් කරල හරි යන්නෙ නෑ. අළු යටම දාන්න ඕන. මේ විදියට දවසකින් හෝ දෙකකින් හෝ රත් කර ගත්තු ගල් කැට නිවෙන්න හැරල, වතුර දාන්නෙ නැතිව අළු පිහදාල සුද්ධ කරල ගන්නවා. මොකද ලිපේ දාල ගත්තට පස්සෙ තෙතමනය ගාවන්න හොඳ නෑ. තෙතමනය ගෑ වුණොත් ගල් කැටවල ගැබ් වෙච්ච ශක්තිය බැහැල බාල වෙනවා.

දැන් මේ ගල් කැට ටික සුද්ධ කරල අරගෙන හොඳට සියුම් වෙන්න කුඩු කරල තෙතමනය නොවදින්න ආවරණය කරල අසුරල තියා ගන්නත් පුළුවන්. එහෙම නැත්නම් ගල් කැට පිටින්ම අවශ්‍ය වෙලාවට කුඩු කරල ගන්න, තෙතමනය නොවදින විදියට ආරක්ෂා කරල තියා ගන්නත් පුළුවන්. දැන් අවශ්‍ය වෙලාවට අවශ්‍ය ප්‍රමාණයට මේ ගල් කුඩු ටිකක් අරගෙන ඒක දෙහි ඇඹුල්වලින් අනාගෙන, මී පැණි බිංදුවක් දෙකකුත් එකතු කරල මිශ්‍ර කරගෙන බෙල්ලෙ ගාන්න යොදාගන්න පුළුවන්. (දෙහි සහ මී පැණිවලින් කරන්නෙ බේත ප්‍රත්‍ය කරන එක) බෙල්ලෙ ඉදිරිපස උගුරු දණ්ඩ තියෙන ප්‍රදේශයේ තමයි මේ බේත ආලේප කරන්නෙ. උදේ වරුවෙ ඒ විදියට ආලේප කරල පැය 3 - 4 ක් තියෙන්න හරිනවා. මේ විදියට නොකඩවාම සතියක් විතර කළාම උගුරෙ හිරවෙලා තියෙන සෙම ඔක්කොම බුරුල් වෙලා කැබලි පිටින් ගැලවිලා යනවා. කිසිම අතුරු ආපදාවක් නැතිව බොහොම පහසුවෙන් ඒ සෙම කාරල ඉවත් කරන්න පුළුවන්.

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# පිල්ලි යැවීම් මගින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි....

*(පසුගිය කලාපයෙන් - රූපයට කරන කටු ගැසීම්, කටහඬ අල්ලා කරන ඇණ ගැසීම් ආදියෙන් ලෙඩ රෝග කරදර ඇති වන හැටි....)*

මනුස්සයින්ට ලෙඩ රෝග කරදර හදන තවත් භයානක පැත්තක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. කෙනෙකුට අණවින කරන්න මොනව හරි යවන ක්‍රමවේදයක් තමයි මේ. ඒ කියන්නෙ මළමිනියක් හෝ මැරිච්ච සතෙක් හෝ එහෙම නැත්නම් පණ තියෙන සතෙක් මාධ්‍ය කරගෙන, අමනුස්ස දිෂ්ඨියක් සම්බන්ධ කරල ඒකට අණ කරනවා, කාට හරි විපත්තියක් කරල එන්න කියල. මේක පෙර කාලයේ තිබිච්ච මහා භයානකම අණවින ක්‍රමයක්. මේ වගේ ක්‍රමයකින් පුද්ගලයෙක් හෝ පුද්ගල පිරිසක් කෙලින්ම විනාස කරන්නත් පුළුවන්. මේ වගේ දේවල් අද ඊයෙ පටන් ගත්ත ඒව නෙවෙයි. අපේ බුදුන් වහන්සේ පෙරුම් පුරන බෝධිසත්ව කාලයෙත් තිබිල තියෙනවා.

බුදුන් වහන්සේ පෙරුම් පුරන කාලයක දෙව්දත් තෙර, බෝසතාණන් වහන්සේට විරුද්ධව ඒ වගේ පිල්ලියක් යවපු කතාවක් ජාතක කතාවක සඳහන් වෙනවා. බෝසතාණන් වහන්සේ වෙළඳාමෙන් බොහොම ජයග්‍රහණයන් ලබපු නිසා ඒකට ඊරිසියාවෙන්, පිරිසත් එක්කම උන් වහන්සේ මුහුද මැදදීම විනාස වෙලා පලයන් කියල, ඒ කාලෙ වෙළෙන්දෙක් වෙලා හිටපු දෙව්දත් තෙර ඇදුරන් පිරිසක් සමග එකතු වෙලා පිල්ලියක් යැව්වා. මුහුද මැද යාත්‍රා කරන කොට බෝසතාණන් වහන්සේට එක්තරා ගෙජ්ජි හඬක් ඇහුණා. උන් වහන්සේ දැනගත්ත මේ එවන්නෙ පිල්ලියක් කියල. එහෙම දැනගෙන තමන්ගෙ පිරිසට කිව්ව මෙත් වඩන්න කියල. පිරිසත් එක්ක මෙත් වැඩීමත් සමගම අර පිල්ලිය නැව වටේ කැරකිලා ආපසු යන්න ගියා. ගිහින් ඒක එවපු දෙව්දත් ඇතුළු කට්ටඩියො පිරිසට (ඇදුරන්ට) කිව්ව, යන්න බෑ බල වැඩියි කියල. ඊළඟට නැවත වතාවක් තවත් බල වැඩි කරල, දැන් පලයන් කියල යැව්වා. නැවතත් ගෙජ්ජි හඬ ඇහෙන කොටම බෝසතාණන් වහන්සේ තමන්ගෙ පිරිසට කිව්ව, ඔන්න නැවතත් එනවා ඔක්කොම එකතු වෙලා මෙත් වඩන්න කියල. මෙත් සිත වඩන කොටම නැවතත් යන්න බැරිව නැව වටේ කැරකිලා ගියා. තුන් වැනි අවස්ථාවේදී ඇදුරන්ගේ ඇදුරු බලය ඉක්මවා යන්න බලගන්වල නැවතත් යැව්වා. ඒ කියන්නෙ ඇදුරු ආරක්ෂාව ඉක්මෙව්වා. හැබැයි ඒ අය ඒකෙ තියෙන භයානකකම දැනගෙන හිටියෙ නෑ. මොකද ඇදුරු ආරක්ෂාව ඉක්මෙව්වොත් සහ ඒ ඉලක්කය සපුරා ගන්න බැරි වුණොත්, ඒ යවපු පිල්ලිය ඒ විදියටම තමන්ටම කැරකිලා ඇවිත් විනාස වෙන්න පුළුවන්. ඒ වතාවෙදිත් බෝසතාණන් වහන්සේ ඇතුළු පිරිස මෙත් වඩපු නිසා කිට්ටුවට යන්න බැරි වුණා. ඒ නිසා පිල්ලිය ආපසු හැරිල ගිහින් අර ඇදුරෝ ටික ඔක්කොම පෙති ගහල දාල, ඒකෙ හිටපු අමනුස්සය යන්න ගියා.



දැන් මේ කතාවෙන් ඔප්පු වෙනවා, පිල්ලි යැවීම් ඒ කාලෙත් තිබුණයි කියල. අනෙක් කාරණය තමයි භික්ෂූන් වහන්සේලාගේ සීල කොටස විග්‍රහ වෙන කොට චූල සීල, මජ්ජිම සීල, මහා සීල කියල විග්‍රහයක් (දීඝ නිකායේ සීල ස්කන්ධයට සම්බන්ධ සූත්‍රවල) තියෙනවා. එතනදී, මන්තර දපල මළමිනී නැගිට්ටවීම, කණ්ණාඩියෙන් බලා ශ්‍රියා කාන්තාව **ගෙන්වීම (අද කාලෙ අර්ථයෙන් අංජනම් දේවි ගෙන්වීම) වගේ දේවල් භික්ෂූන් වහන්සේලාට කරන්න එපා කියල පෙන්වා තියෙනවා.** මොකද ඒ වගේ දේවල්වලින් හරි හම්බ කරගෙන ලාභ, කීර්ති, ප්‍රශංසා ලබාගැනීම භික්ෂූන් වහන්සේලාට නොගැලපෙන නීච වැඩක් නිසා. ඒ වගේ දේවල් ඒ කාලෙත් තිබිච්ච බවට සාධක මේවායින් පෙන්වනවා.

ඊළඟට මේ පිල්ලි කියන එක හදාගන්නත් විවිධ ක්‍රම තියෙනවා. එයින් බලවත්ම පිල්ලි ක්‍රමය තමයි තුන් කුළුඳුල් බිල්ල කියන්නෙ. ඒ කියන්නෙ අම්මත් පවුලෙ වැඩිමලා වෙලා, තාත්තත් පවුලෙ වැඩිමලා වෙලා, ඒ දෙන්නගෙ පුතත් පවුලෙ වැඩිමලා වෙලා තියෙන අවස්ථාවක, ඒ පුතා මැරුණම ඒ මළ මිනිය තමයි ජීවම් කරන්න ගන්නෙ. ඒ මළමිනිය ගහකට හේත්තු කරල, වත් පිළිවෙත් කරල ජීවම් කරන කොට, වතා තුනකදී මළමිනිය යක්ෂාවේෂයෙන් මහ හයියෙන් හිනාවෙන්න පටන් ගන්නවා. මළ මිනිය හිනා වෙනවයි කියන්නෙ ඒකට අරක්ගත්තු අමනුස්සයා තමයි ඒ හිනාවෙන්නෙ. මෙතනින් තුන් වෙනි වතාවෙදි මළ මිනියෙ දිව බඩ දිහාවට දාල හිනා වෙනවා. එතකොට ඒ එළියට දාපු දිව කපා ගන්නවා. ඊට පස්සෙ මළමිනිය වැටෙනවා. දැන් අර කපාගත්තු දිව තමයි පිල්ලි යවන්න ගන්නෙ. ඒ දිවට දුම් අල්ලල ජීවම් කරන කොට, දිව දඟලල ළමයෙක් බවට පත්වෙනවා. ඒ කියන්නෙ, තියෙන භෞතික තත්ත්වය වෙනස් වෙලා සත්වයෙක්ගෙ ස්වභාවය ගන්නවා. ඒ සත්වයා මස් ලේ ඇහැට පේන්න ළමයෙක් වගේ හැසිරෙනවා. ඊට පස්සෙ ඒ ළමයට යම් කිසි පණිවිඩයක් කිව්වොත් (අණ කළොත්) ඒක කරල නැවත එනවා.

උදාහරණ විදියට අහවල් තැන ඉන්න කෙනා කපල කොටල මරල දාපන් කියල කඩුවක් දුන්නොත් ඒක ගිහින් ☞

කරල එනවා. මරන්නෙ නැතුව බය ගන්වල එන්න කිව්වොත් ඒක විතරක් කරල එනවා. ලෙඩ රෝග හදපන් කියල අණ කළොත් ඒකට අවශ්‍ය කරන පරිසරය සකස් කරල එනවා. කොටින්ම කිව්වොත් අණ කරන්නෙ මොකක්ද ඒක කරල එනවා. මේ විදියට කෙනෙකුට කරදර බාධක කරන්න, ලෙඩ රෝග හදන්න මේ පිල්ලි ක්‍රමය පාවිච්චි කරනවා. වැඩේ කරල ආවට පස්සෙ ඒකට පිදේනියක් විදියට ඒ අමනුස්සයට බිත්තරයක් වගේ මොකක් හරි දෙනවා. මේ තමයි අපට අහන්න ලැබෙන ඉස්සර තිබ්ච්ච ගැඹුරුම හා භයානකම පිල්ලි ක්‍රමය. නමුත් දැන් මේව කරන්න මිනිස්සු නෑ. හැබැයි මේ ක්‍රමය නැතත්, එදා තිබ්ච්ච වෙනත් ක්‍රමවල කොටස් තමයි අදත් පිල්ලි විදියට ජීවම් කරල යවන්නෙ.

ඊළඟට විවිධ මැරිච්ච සත්තු යොදාගෙන කරන තවත් පිල්ලි ක්‍රමයක් තියෙනවා. මැරිච්ච කුරුමිණියො, පත්තෑයො, ගරුඬො, සර්පයො වගේ සත්තු මේකට යොදා ගන්නවා. මේකත් කලින් වගේමයි. මැරිච්ච සතාට ජීවම් කරල මොනව හරි ක්‍රමවලින් අමනුස්සයෙක් ඇතුලට රිංගවල මළ කුණ පණ ගන්වනවා. ඊට පස්සෙ ඒක සම්පූර්ණ සතෙක් බවට පත් වෙනවා. ඊළඟට අහවල් කෙනාව කාල වරෙන් කියල උඹට සංඥා මගින් දැනුම් දෙනවා. ඉතින් සතා මේ හිටිය මොහොතකින් ආගිය අතක් නෑ. කොහේ හිටියත් ගිහින් ඒ පුද්ගලයව හපල එනවා. ඒ තරම් ක්‍ෂණයකින් තමයි ක්‍රියාත්මක වෙන්නෙ. මොකද ඇතුලෙ ඉන්නෙ අමනුස්ස දිෂ්ටියක් නිසා. ඒ දිෂ්ටිය තමයි මේ විදියට සතා හරහා ක්‍රියාත්මක වෙන්නෙ. අදාල පුද්ගලයාට වින කරල, ඒ පිල්ලිය නැවතත් අර ජීවම් කරන්න ගත්තු මල් බුලත් තටුවට එනවා.

දැන් මේ වගේ සිද්ධියක් ගැන කතාවක් තියෙනවා. එක මනුස්සයෙක් අමුඩ ලේන්සුවෙන් පොට්ටනියක් ගැට ගහල තිබුණලු. මේ මනුස්සය බොහොම දුප්පත්. ඔහුත් එක්ක හිටපු තවත් කෙනෙක් හිතල තියෙන්නෙ, ඒ පොට්ටනියෙ තියෙන්නෙ සල්ලි කියල. ඉතින් අර පොට්ටනිය අයිති මනුස්සය, සල්ලි නෑ බං සීනි තේ කොළ ටිකක් ගේන්නවත් කියල කියන කොට, අර අමුඩ ලේන්සුවෙ තියෙන ගැටේ ලිහල ගන්නකො කියල අනික් මනුස්සය කිව්වලු. ඒකෙ සල්ලි නෙවෙයි බං කියල කිව්වම, එහෙනම් මොනවද කියල ඇහුවලු. පස්සෙ පෙන්නන්නම්කො කියල, මල් බුලත් තටුවක් හදල අමුඩ ලේන්සුවෙ ගැටේ ලිහල ඒකෙන් තිබ්බම, කැරපොතු පිහාටු වගේ මැරිච්ච ගරුඬෙක්ගෙ පොතු ගොඩක් තිබුණලු. මේක තියල ජීවම් කරන කොට පොතු ටික බලා ඉඳෙද්දිම ගරුඬෙක් බවට පත් වුණාලු. ඊට පස්සෙ උං මල් බුලත් තටුව හැම තැනම යන්න පටන් ගත්තලු. ඕං බලපන් දැන් ඔය පිල්ලිය කියල, උඹේ හතුරෙක් ඉන්නව නම් කියපං කිව්වලු මේක යවන්න. කාටවත් යවන්න ඕන නෑ, මං ඕක දැක්කනෙ, ඒ ඇති කියල අනෙක් මනුස්සය කිව්වලු. ඊළඟට මොකක්ද මන්තරයක් මතුරල දුම් ටිකක් ඇල්ලුවම ඒ ගරුඬා උන්ඩි වුණාලු. උන්ඩි වුණාම නැවතත් අර පොට්ටනියට තියල ගැට ගැහුවලු. ඊළඟට ඒක කලින් තිබ්ච්ච වගේම පොතු ගොඩක් බවට පත් වුණාලු. දැනටත් ක්‍රියාත්මක වෙන මේ වගේ මහ පුදුම සිද්ධි තියෙනවා.

ඒ වගේම කුකුළෙක් යොදාගෙන පිල්ලි යවන මේ හා සමාන තවත් භයානක ක්‍රමයක් තියෙනවා. එතනදිත් කුකුළෙකුට ජීවම් කරල අමනුස්ස දිෂ්ටියක් සම්බන්ධ කරල පිල්ලිය යැව්වට පස්සෙ, උං එක පාරටම අදාල පුද්ගලයගෙ ඇඟට පනිනවා. ඊට පස්සෙ ඒ පුද්ගලයා ලේ බඩ ගිහින් මැරෙනවා. එක් කට්ටඩියෙක් තවත් කට්ටඩියෙකුට මේ වගේ පිල්ලියක් යවපු සිද්ධියක් පිළිබඳ පැරණි ජන කතාවකුත් තියෙනවා. මේ දෙන්නම කට්ටඩි වැඩ දන්න අය. කොහොම හරි එක කට්ටඩියෙක් කුකුළෙකුට අමනුස්සයෙක් සම්බන්ධ කරල පිල්ලිය යැව්වට පස්සෙ, අර කට්ටඩි වැඩ දන්න අනෙක් පුද්ගලයත් මොනව හරි ද්‍රව්‍යයක් මතුරල තමන්ගෙ ඉදිරියට ආපු කුකුළට දැම්මම, කුකුළ ඒකට වශී වුණාලු. ඊට පස්සෙ අල්ල ගත්තලු. දැන් අර පිල්ලිය යවපු කට්ටඩිය අවුරුදු 2 ක් යන කල්ම නිදා ගන්න වෙලාවක් අහුවුණේ නැතිලු. මොකද නිදාගන්න වෙලාවක් බලල අර පිල්ලිය නැවතත් තමන්ට අනෙක් කට්ටඩිය එවන බව ඔහු දැනගෙන හිටියා. නමුත් ඇහැරිලා ඉන්න වෙලාවක යැව්වොත් ඒ කට්ටඩිය ඒක තමන්ගෙ මන්ත්‍ර බලෙන් කපල කුකුළ අල්ල ගන්නවා. නිදා ගත්තු වෙලාවක එව්වොත් ඒ පිල්ලියට බිලි වෙනවා. මේ නිසා තමයි ඇහැරගෙන හිටියෙ. දැන් අර පිල්ලිය ලැබිච්ච කට්ටඩිය අඳුනකින් මේ සිද්ධිය බලන කොට, අර තමන්ට පිල්ලිය එවපු කට්ටඩිය අවුරුදු 2 ක් යන කල් නිදාගෙන ඉන්න වෙලාවක් අල්ලගන්න බැරි වුනාලු. කොහොම හරි අවුරුදු 2 කට පස්සෙ, ඒ කට්ටඩියට නින්ද ගිය වෙලාවක් අඳුනෙන් බලල හරියටම පිල්ලිය යැව්වලු. පිල්ලිය ගිහින් ඔහුගෙ පපුවට ඇන්නම ලේ බඩ දාල මළාලු.

ඒ කාලෙ එහෙම මහ බලවත් පිල්ලි යැව්වට, අද කාලෙ ඕක බොහොම සුළුවෙන් තමයි කරන්නෙ. ඒවට ගන්නෙ බොහෝ කොටම අඳුන් හෙවත් අංජනම් බලනව කියන ක්‍රමය. එතැනත් පාතාල අඳුන් කියල බලන විවිධ ක්‍රම තියෙනවා. මේවායෙදී විවිධ අමනුස්සයො ඒවට ගෙන්ව ගන්නවා. එහෙම ගෙන්නල ඒ අයට තැන් බලල අණ කරනව, උඹ ගිහින් අහවල් පුද්ගලයට මෙන්න මෙහෙම කරදර කරල වරෙන් කියල. ඒක අර වගේ බලවත්ව පේන්න යවන එකක් නෙවෙයි. සියුම් දෙයක්. නමුත් ගිහින් මිනිස්සුන්ට කරදරකාරී තත්ත්වයන් ඇති කරනවා. සියුම් වුණත් මේකත් දැනට ක්‍රියාත්මක වෙන පිල්ලි ක්‍රමයක්. විවිධාකාර කට්ටඩි වැඩ කරන උදවිය එහෙම දේවල් කරල මිනිස්සුන්ට කරදර කරනවා. ඒකත් අණ විනවලටම අයිති දෙයක්.

මීට අවුරුදු ගණනාවකට ඉස්සර අම්පාර ප්‍රදේශයෙනුත් පිල්ලියක් සම්බන්ධ සිද්ධියක් වාර්තා වෙලා තියෙනවා. පිට ගම් පළාතකින් ඇවිත්, ඒ පැත්තෙ ගුරු වෘත්තියේ නියැලුණු එක්තරා ගුරු මහත්තයෙක්, ඒ ගමේ යම්කිසි වැදගත් කෙනෙකුගෙ ගෙදරක නවාතැන් ගත්තලු. ඒ ගෙදර මහ පැරණි වලව්වක්. ඒ කාලෙ ගුරු මහත්වරුන්ට බොහොම හොඳින් සලකන සිරිතක් තිබුණ නිසා, ඒ ගෙදර හොඳ කාමරයකුත් මේ ගුරු මහත්තයට වෙන් කරල දීල තිබුණලු. මේ ගුරු මහත්තය කාමරයේ නැවතිලා ඉන්න අතරෙදි තනියෙන් කවුරු හරි එක්ක කතා කරනවලු. ඒ හඬ ගෙදර අයටත් ඇහෙනවලු. දැන් මේක ඒ ගෙදර ගෘහ මූලික මහත්තයට කුතුහලයක් වුණාලු. හැබැයි බලනකොට කතා කරන කෙනෙකුත් නැතිලු. බැරිම තැන දවසක් යතුරු හිලෙන් බලාගෙන හිටියලු, කාත් එක්කද මේ කතා කරන්නෙ කියල. එහෙම කතා කරන කොට, ඒ ගුරු මහත්තය තමන්ගෙ ඇඳුම් බෑගයෙන් මොකක් හරි පටියක් වගේ දෙයක් ඇදල ගත්තලු. අරගෙන ඒකට මතුරල දුම් ටිකක් ඇල්ලුවලු. එතකොට ඒක දඟලල පුංචි ළමයෙක් බවට පත් වුණාලු. ඊට පස්සෙ ඒ ළමයට කතා කරල මොනව හරි දුන්නලු. එතනින් පස්සෙ ළමය අතුරුදන් වුණාලු. දැන් මේ ගෙදර මහත්තය, අර ගුරු මහත්තයගෙන් අහල තියෙනවා, මම මෙහෙම දෙයක් දැක්ක, මොකක්ද ඒක ඇත්ත කියන්න කියල. ඒක තමන්ගෙ ආත්තල මුත්තලගෙ කාලෙ ඉඳල පාරම්පරිකව ගෙනාව පිල්ලියක් බවත්, කවදාවත් නරක වැඩකට යොදාගන්නෙ නැති බවත්, ගෙදරට ලියුමක් යවන්න ඕන වුණාම ඒ වගේ හොඳ වැඩකට මේක පාවිච්චි කරන බවත් ඒ ගුරු මහත්තය කිව්වලු. ඒ වගේම ඕන දෙයක් කිව්ව ගමන් කරල දෙනවලු. ඉතින් අර පිල්ලියෙන් මතු වෙච්ච ළමයට, මේ ලියුම ගෙදරට ගිහින් දීල එන්න කිව්වම ගිහින් දීල ☞

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**10 වන කොටස**

අපේ මස් ලේ ඇහැට නොපෙනෙන ලෝකයන් ගැන කතා කරන කොට, තවත් ඒ වගේ නොපෙනෙන ලෝකයක් ගැන තමයි මේ කරුණු කාරණා හෙළිදරව් කරන්නේ. ඒ තමයි සතර අපායෙන් එකක් වන ප්‍රේත ලෝකය. **පරහේ අත හෙවත් ප්‍රේත කියන වචනයෙන් අදහස් කරන්නේ අනුන්ට අත පානවා කියන එක.** ඒ තමයි ප්‍රේත අත්භවක ඉපදෙන්න වඩන පොදු සංඛාරය. හැබැයි මෙතන දී අනුන්ට අතපානවයි කියල කිව්වම, අපි හිතන් ඉන්නවට වඩා මහ පුළුල් ක්ෂේත්‍රයක් මේකට අහුවෙනවා. මොකද මෙතන දී එකපාරටම කෙනෙකුට හැඟෙන්නෙ, අනුන්ගෙන් යමක් ඉල්ලගෙන කන හිඟන්නො වගේ පිරිසක් ගැන විතරයි. නමුත් පරහේ අත හෙවත් ප්‍රේත කියන එකේ තවත් පුංචි කොටසක් විතරයි ඒ. මෙතනදිත් අත පාන සියලු දෙනාම ප්‍රේත වෙනවයි කියන කතාවක් නෙවෙයි මේ කියන්නෙ. අනුන්ට අතපානවයි කිව්වම, හැමවෙලේම අනුන්ගෙ අඩුපාඩු ගැන කියල, එහෙම නැත්නම් තමන්ට නැතිකම නිසා අනුන්ට ඊරිසියා කිරීම ඇතුළු මේ ඔක්කොම අහුවෙනවා. එතකොට මේක පුළුල් විග්‍රහයක්.

උදාහරණ විදියට සමහර අය තමන්ගෙ ශරීර මහත නැත්නම්, මහත අයට ඊරිසියා කරනවා. ඒ අයට ඇනුම් පද කියනවා. ඒ අයත් එක්ක අමනාප වෙනවා.



ඒ වගේම තමන් ශරීර සෞඛ්‍යයෙන් මහත නම්, කෙට්ටු අයට කෝට්ටෝ, ඉදිකට්ටෝ ආදී වශයෙන් කියමින් ද්වේෂ සහගතව අපහාස කරනවා. මහත හොඳ නැති නිසා තමන්ටත් කෙට්ටු වෙන්න ඕන අදහසක් තියෙනවා. නමුත් ඒක නොලැබීම නිසා තමන්ගෙ එක බොරුවට, ලොකුවට වර්ණනා කරල හිතෙන් දුක් විඳ විඳ අනෙක් අයට ඊරිසියා කරනවා, අපහාස කරනවා. ඒ වගේම තමන්ගෙ නැති අඩුපාඩුකම් වහගන්න අන්‍යයන්ට නින්දා අපහාස, නීච නිග්‍රහ කරන්න බලන උදවියත් ඉන්නවා. ඒ අය අන් අයට නිකං අභූත චෝදනා නගනවා. ඒ වගේම තමන් ලස්සන නැත්නම් ලස්සන කෙනාට පහර ගහනවා. තමන් ලස්සන වෙන්න අනෙකාට පහර ගහල, නැති අඩුපාඩු කියල හෙළා දකිනවා. දේපොළ, මිල මුදල් ගත්තත් තමන්ගෙ නැති බැරිකම නොකියා, තියෙන කෙනාට නිකරුණේ පහර ගහල තමන් පොහොසත් වෙන්න බලනවා. ඒ වගේම සමහර වෙලාවට සමහර උදවිය සුවඳ විලවුන්, පවුඩර් වර්ග ආදිය ''උන්ට මොන සුවඳ ද?.....'' මේ ආදී වශයෙන් කියල අනෙකාට දෙන්නෙ නැතිව ලෝභකමින්, ඊරිසියාවෙන් හංගනවා, විසි කරනවා. ඒ වගේ අයට මහා කුණු ගඳ ගහන ශරීර ඇතිව උපදින්න සිද්ධ වෙනවා. ඒ ශරීර පණුවන් ගහල වගේ මහ කුණු ☞

## පිල්ලි යැවීම් මගින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි....

එනවලු.

දැන් මේ වගේ යහපත් වැඩවලට පිල්ලි යොදාගත්තු අවස්ථාත් බොහොම කලාතුරකින් තිබිල තියෙනවා. නමුත් අර ඕනම දෙයක පටන් ගැන්ම යහපත් වෙලා, පසු කාලීනව ඒක මනුස්ස වර්ගයාගේම විනාසයට යොදා ගන්නව වගේ, මේ පිල්ලි ක්‍රමයත් මහා භයානක විනාශකාරී දේවල්වලටම යොදාගන්න මිනිස්සු පෙළඹිලා තියෙනවා.

හැබැයි ඉතින් තාවකාලිකව තමන්ගෙ මොකක් හෝ අරමුණක් ඉෂ්ට කරගන්න, මේ වගේ පිල්ලි ක්‍රම තවත් අයට වින කරන්න යොදා ගත්තත් මේවායෙ විපාකයන් නම් බොහොම බරපතලයි. තමන්ටත් ඒ වගේ විපාකයන්ට කවද හරි ගොදුරු වෙන්න වෙනවා. කවදාවත් වගතුවක් නම් වෙන්නෙ නෑ. අනන්ත සංසාරයේ යන කල්ම තමන්ටත් සතුන්ගෙන් කරදර, සතුරු කරදර, අමනුස්සයින්ගෙ උපද්‍රවවලට වළක්වන්න බැරි විදියට ගොදුරු වෙන්න සිද්ධ වෙනවා. මරණාසන්න අවස්ථාවේදී බොහෝ කොටම මේ වගේ අය චුත වෙලා අපාගත වෙනවා. කවදහරි මනුස්සයෙක් වුණත් උපනුපන් තැන නොයෙක් ලෙඩ රෝග හැදෙනවා, බලවත් අමනුස්ස දෝස එනවා. ඉතින් මුළු ජීවිත කාලෙම විඳවන්න වෙනවා. මේ නිසා මේවායේ තියෙන භයානක පැත්ත ධර්මානුකූලව දැනගෙන, මේ මනුස්සයෙක් වෙලා ගත කරන කෙටි ජීවිත කාලය අනුන්ට ගිනි දීල, සතර අපාගත වෙන කටයුතුවලට යොදවන්නෙ නැතිව, මෙළොව පරලොව යහපතට යොදවනව නම්, ඒක තමන්ටත් ලෝකයාටත් හිතසුව පිණිස වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්.)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

ගොඩක් වෙනවා. මේ විදියට ලෝභකමින් අල්ල ගත්තු මොකක් හරි දෙයක් නිසා ප්‍රේත අත්බැව් ලබන්න හේතු වෙනවා. තම තමන් කරපු කියපු හැටියට ඒවායේ විපාකයන් විඳින්න සිද්ධ වෙනවා.

මේ වගේ අවස්ථාවක දී පුද්ගලයාට මරණාසන්න මොහොතක ගති නිමිත්තක් පහළ වෙනවා. ඒ ගති නිමිත්ත විදියට මස් වැදැල්ලක්, ඇට සැකිල්ලක් හෝ ඒ වගේ යම් කිසි ආකාරයකට ඉතාම දුක්ඛිත සත්ව ස්වරූපයක් පහළ වෙනවා. ඊට පස්සෙ ඒකෙ මානසිකත්වය එන්න එන්නම බලසම්පන්න වෙනවා. චුත වෙනකොට කර්මජ කයක් බවට පත්වෙලා ඒක තමයි ප්‍රේත අත්බැවක් විදියට පටිසන්ධි අල්ලන්නෙ. ඒක ඕපපාතික උප්පත්තියක්. එතැනින් කර්ම වේගයන්ට අනුකූලව මස් වැදැල්ලක් විදියට හැදුණනම්, ඒ ලෝකයේම ඉන්න වෙනත් විවිධ සත්තු ඒකව කන්න පටන් ගන්නවා. ඌ ඒ වේදනා ඔක්කොම විඳිනවා. නමුත් මැරෙන්නෙ නෑ. කර්ම ශක්තියෙන්ම නැවත නැවත ලියලනවා.

ප්‍රේත කය ඇට සැකිල්ලක් වගේ හැදුණනම්, සමහරවිට පුරුක් ගැළවෙන්න ඔන්න මෙන්න කියල එල්ලිලා තියෙනවා. ඒ වගේ වෙලාවට අතපය කැඩෙන්න වගේ දරාගන්න හරි අමාරුයි. නමුත් ඌ බොහොම අමාරුවෙන් ගාට ගාට යනවා. සමහර වෙලාවට ඇදගෙන වැටෙනවා. වැටුණොත් කෑලි හැලෙනවා. නැවතත් එකතු වෙලා කය හැදෙනවා. මේ විදියට කර්ම විපාකය ගෙවනවා. කොච්චර කාලයක් ගෙවන්න වෙයි ද දන්නෙ නෑ. අවුරුදු දහස්, ලක්ෂ ගණන් වගේම සමහර විට බුද්ධාන්තර ගණනාවක් තිස්සේ විඳවන අයත් ඉන්නවා. මේ විස්තර කළේ එක්තරා ප්‍රේත කොටසක ස්වභාවය. තවත් විවිධාකාර ස්වභාවයේ ප්‍රේත කොටස් ඉන්නවා.

සමහර අවස්ථාවල කර්ම විපාක ඍද්ධිය නිසා ආකාසයෙන් පවා යන්න පුළුවන් ප්‍රේත කොටස් ඉන්නවා. ඒකත් කර්ම විපාක විඳවන්නමයි ලැබෙන්නෙ. ඒ විදියට ආකාසයෙන් ගමන් කරන කොටත්, ඒ ලෝකයේ ඉන්න විවිධ සත්තු උන්ගෙ ශරීර කඩාගෙන කනවා. මේ වගේ සිද්ධි සම්බන්ධයෙන් ඒ කාලයේ වැඩ හිටපු සැරියුත් හිමියන්, විශේෂයෙන් මුගලන් හිමියන් වගේ මහරහතන් වහන්සේලා දකල කරපු දේශනා ප්‍රේත වස්තු, විමාන වස්තු ආදී පොත්වල සඳහන් වෙනවා. ඒ වගේ සිද්ධි සම්බන්ධයෙන් මෑත කාලයෙත් යම් සමාධි, දිවැස් ලබාගත් භික්ෂූන් වහන්සේලා දකල ප්‍රකාශ කරල තියෙනවා. එදා වැඩ හිටපු මහ රහතන් වහන්සේලා දකල ප්‍රකාශ කරපු ඒ සිද්ධි සම්පූර්ණයෙන්ම සත්‍ය බව අදත් මේ වගේ කාරණාවලින් ඔප්පු වෙනවා. (මෙවැනි සිද්ධීන් ඉදිරියේ දී අභයරතනාලංකාරය තුළින් බලාපොරොත්තු වන්න.)



ඒ වගේම මේ ප්‍රේත කොටස්වල ආහාරය කර්ම ශක්තියෙන්ම මැවෙනවා. ශරීරයත් කර්ම බලයෙන්මයි හැදෙන්නෙ. සමහර එවුන්ට කන්න බෑ. ඒත් ශරීරය මැරෙන්නෙ නෑ. විපාකය විඳවන්න ඕන නිසා නැවත නැවත ශරීරය කර්ම ශක්තියෙන්ම පෝෂණය වෙවී, කර්ම බලයෙන් හට ගත්තු සතර මහා භූතයන්ගෙන්ම වැඩෙනවා. හැබැයි බඩගින්න කෙළවරක් නැතිව එනවා. සමහර වෙලාවට කෑම පෙනි පෙනී තියෙනවා. නමුත් කන්න බෑ. ඒ කියන්නෙ **මනුස්සයෙක් වශයෙන් ඉඳෙද්දි අනුන්ට පෙන්න පෙන්න නොදී කෑවනම්, ඒ අයට ප්‍රේත වෙලත් කෑම පෙනි පෙනී තියෙනවා, ඒත් කන්න බෑ. නොදී කෑවනම්, තියෙද්දි නෑ කියල හැංගුවනම්, ඒ වගේ අයට කෑම හෙව්වත් කෑම නැතිවෙලා යනවා. කෑම පෙනි පෙනී තියෙද්දි ළඟට යනකොට නැතිව යනවා.** යන්න එන්න පුළුවන්කම තිබුණත් කෑම සම්බන්ධයෙන් අන්ත අසරණයි. අර කරපු විපාකය ඒ විදියටම එනවා. මේ වගේ අයට තමයි කිව්වෙ, උගුරත් නොතෙමෙයි සුර ගඟ වැටුණත් කියල. වීදාගම මෛත්‍රිය මහා නා හිමියන් ලෝවැඩ සඟරාවේ කවියකින් ඒ බව අපූරුවට මෙහෙම සටහන් කරල තියෙනවා.

**උපනොත් පේත වැ**
**පවු කොට නොපනත්**
**කලෙකත් නොලැබෙයි**
**සෙම් සොටු පමණත්**
**උගුරත් නොතෙමෙයි**
**සුර ගඟ වැටුණත්**
**කලෙකත් පිං නොකළැකි**
**මැයි සිතුණත්**


නොපනත්කම් කරල, පවු කරල ප්‍රේත වෙලා උපන්නොත්, කිසි කලෙක සෙම් සොටු තරම් දෙයකවත් ආහාරයක් නොලබන, ඒ වගේම අහස් ගඟ කටට වැටුණත් උගුරවත් නොතෙමෙන ප්‍රේත කොටස් ඉන්නවා. පිං කරන්න හිතුණත් ඒ වගේ දුගති තැනක ඉන්න තාක් පිං කරන්න බෑ. ඒ කියන්නෙ ඉඳිකටුවක් වගේ උගුරක් තියෙන, මහා කල ගෙඩියක් වගේ උස්ස ගන්න බැරි ඔළු ගෙඩියක් තියෙන ප්‍රේත කොටස් ඉන්නවා. ඒ අයට බඩගින්න, පිපාසය කොච්චර දැනුණත් ඒ වගේම ආහාර, ජලය කොච්චර තිබුණත් අර ශරීර ස්වභාවය නිසා ගිලින්න බෑ. ඔළුව පැත්තක, බඩ පැත්තක, ඇඟ තවත් පැත්තක වැටිල ඉන්නවා. සමහර අවස්ථාවල ඒ ලෝකයේම ඉන්න විවිධාකාර සතුන්, මස් වැදැල්ලක් අහුවුණාම ඩැහැගෙන යනව වගේ මේ ප්‍රේත කොටස් ඩැහැගෙන යනවා. ගෙනිහින් කොහේ හරි ගහල කාල ගිලිනවා. ගිලින කොට මහ වේදනාව විඳිනවා. නමුත් අන්තිමට බලනකොට නැවත වතාවක් හිටිය වගේම කර්ම

ශක්තියෙන්ම කය මැව්ල එනවා. මැරෙන්නෙ නැතිව විඳවනවා. හරියට මේ මනුස්ස ලෝකය වගේ තමයි. මහා බලපුළුවන්කාර සමහර මිනිස්සු, කර කියා ගන්න දෙයක් නැති අසරණ පොඩි මිනිස්සු පැහැරගෙන ගිහින් මර මරා වැඩ අරගෙන, තියෙන දේත් කඩා වඩාගෙන අන්තිමට අතපයත් කඩල කොහේ හරි තැනක දාල යනව වගේ තමයි. මනුස්ස ලෝකයේ විතරක් නෙවෙයි තිරිසන් ලෝකයෙත් එහෙමයි. බලපුළුවන්කම තියෙන එකා නැති එකාව ගොදුරු කර ගන්නවා.

ඉතිං මේ විදියට ඒ ප්‍රේත ලෝකයේ දී ආහාරවලට තරග කරන්න බෑ. එහෙම තරඟ කරල පොර කාල ආහාර ගන්න විදියක් නෑ. මොකද සමහර ප්‍රේතයන්ට යන්න එන්නවත් බෑ. කය පහළ වෙච්ච ගමන් එක තැනමයි. ගමන් කරන්න හැකියාව තියෙන ප්‍රේත කොටස්වලට වුණත් අර වගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. මේ විදිහට හැම පැත්තෙන්ම විවිධ දුක්ඛිත තත්වයන්ට පත් වෙච්ච ප්‍රේත කොටස් ඉන්නවා.

මේ වගේ සමහර ප්‍රේත කොටස්වලට ගමන් කරන්න බැරි වෙන්නත් හේතුවක් තියෙනවා. ඒ කියන්නෙ මනුස්සයෙක් වෙලා ඉඳෙද්දි එක තැන වැතිරිලා ජරා වැඩ, නීච වැඩ කරපු අය එක එක තැන වැතිරිලා ප්‍රේතව උපදිනවා. ඒ වගේම දුවල පැනල නීච වැඩ කරපු එවුන්ට, ගමන් කරන්න පුළුවන් විදියට ඒ ජාතියේ කයක් ලැබෙනවා. මේ විදිහට තමන් කරපු කියපු හැටියට තමයි ලැබෙන්නෙ. හේතුවට අනුකූලයි ඵලය. අර කලින් සඳහන් කළා වගේම ලෝභකමට, ඊරිසියාවට අනුන්ට මහතයි කියල ඔච්චම් කරල අපහාස කරපු උදවිය ප්‍රේත වෙලත් මහත් වෙනවා, ශරීර මහා පර්වත වගේ වෙනවා. කෝටු කැලි පෙන්නල අනුන්ට කෝටු කිතයියෝ කියල අපහාස කරපු අය කෝටු වගේ ශරීර ඇතිව උපදිනවා. ඒ අපහාසය ලබපු කෙනා ගුණවතෙක් නම් විපාකයත් මහා බලවත් වෙනවා. අනුන්ට අපහාස කරපු, නිග්‍රහ කරපු හැටියට තමයි ඒකත් ලැබෙන්නෙ. බැරිවෙලා විහිළුවට හරි කාගෙ හෝ රෙදි වස්තරයක් හැංගුවනම්, වැල්වල වනල තියෙන රෙදි හොරකම් කළා නම් ඒ වගේ අය ප්‍රේත වෙලත් නිර්වස්ත්‍ර වෙනවා. රෙද්දක් හොයන්න ගියත්, එහෙම නැත්නම් කවුරු හරි හොයල දානයක් දුන්නත් ඒ වෙලාවට අතුරුදහන් වෙනවා. වස්ත්‍රය පිහිටන්න බැරිව යනවා. මේ වගේ අවස්ථාත් තියෙනවා.

ඊළඟට මේ ප්‍රේත කොටස්වල ශරීර ස්වභාවයන් ගත්තොත් නිශ්චිත ස්වභාවයක් නෑ. ඔළුව, කඳ, ඇස්, අත් පා මේ ඔක්කොම විකෘති ස්වභාවයෙන් තමයි පිහිටන්නෙ. ඒ කියන්නෙ විකෘති ශරීර. සමහර එවුන්ගෙ ශරීර ඌරු ඇඟවල් වගේ, කට ඌරු කටවල් වගේ, ඇස් ඌරු ඇස්




වගේ පිහිටල තියෙනවා. තවත් සමහර ප්‍රේතයන්ගෙ මනුස්ස ශරීර වගේ කොටසකුත්, විවිධ තිරිසන් සතුන්ගෙ ශරීර වගේ කොටසකුත් ආකාරයෙන් මිශ්‍රව පිහිටනවා. සමහර විට කඳ මනුස්සයෙක් වගේ පිහිටල, ඔළුව හරකෙක්ගෙ වගේ පිහිටනවා. ඒ කියන්නෙ නිශ්චිත ස්වරූපයක් කියන්න බෑ. එකපාරටම බැලුවම මොකෙක්ද කියල කියන්නත් බෑ. අපි දකින සත්තුත් නෙවෙයි, මනුස්සයොත් නෙවෙයි, විවිධාකාර ස්වරූපයන්. ඒ ශරීර ගත්තමත් පූර්ණ මසකින්, හමකින් වැහිච්ච ඒවා නෙවෙයි. අඩුපාඩු සහිතයි. සමහර ප්‍රේතයන්ගෙ ශරීරවල හම තිබුණත් හැම තැනම පුල්ලි වගේ තුවාල. මේ විදියේ විවිධාකාර ප්‍රේත කොටස් විවිධ තැන්වල වාසය කරනවා. සමහරු අසූචි, සෙම් සොටු කාරල දාපු ස්ථානවල ඒවා ආහාර කරගෙන ජීවත් වෙනවා. මනුස්ස ගන්ධබ්බ ප්‍රේතයො අතරත් අසූචි කන එවුන් ඉන්නවා. අපි ඥාති ප්‍රේතයො කියල හඳුන්වන ඒ අය ඉන්නෙ මනුස්ස ස්වරූපයෙන්. ඒ අයට ප්‍රේත කියල කියන්නෙ තමන්ගෙ ඥාතීන් දෙන දෙයකින් ජීවත් වෙන නිසා. හැබැයි ඒ අය සතර අපාගත නෙවෙයි. නමුත් මේ කතා කරන්නෙ සතර අපාගත ප්‍රේත කොටස් ගැන.

මේ විදියෙ තවත් ප්‍රේත කොටසක් තමයි කුම්භාණ්ඩ කියල හඳුන්වන්නෙ. **කළගෙඩියක් වගේ අණ්ඩ කෝෂයක් තියෙන ප්‍රේතයො තමයි කුම්භාණ්ඩ කියන්නෙ.** මේ විදියට කුම්භාණ්ඩයො වෙලා උපදින්නත් හේතුවක් තියෙනවා. නොයෙක් ආකාරයේ චණ්ඩිකම් කරල, වළාපොට ගහගෙන තමන්ගෙ හෙළුව සමාජයට පෙන්වන සමහර උදවිය ඉන්නවා. ඒ අය ඒක තමන්ගෙ ලොකුකමක්, චණ්ඩිකමක් හැටියට තමයි සලකන්නෙ. අනෙක් අයට ලැජ්ජා නැති වෙන විදියට ලිංග පෙන්වනවා. එහෙම පෙන්වල, මේ බලපන් කියනවා, මේක කාපිය කියනවා. ඔය විදියට ඔය ජාතියෙ ලැජ්ජා භය නැති වෙන විදියට පෙන්වල, නොයෙක් කතා ප්‍රසිද්ධියේ කියනවා. ඒ වගේ අය ඒ වඩන සංඛාරයන් නිසා ඒක උපාදාන කරගෙන කුම්භාණ්ඩයො වෙලා උපදිනවා. මුළු ශරීරයම කළගෙඩියක් වගේ කෝෂයකින් වැහිල බොහොම දුක් වේදනාවෙන් තමයි ගත කරන්නෙ. ඒ වගේම මේ විදියටම සංඛාර වඩපු ස්ත්‍රීන්ටත් කළගෙඩියක් වගේ ඒ හා සමාන වූ ස්ත්‍රී ලිංගයන් සහිතව උපදින්න සිද්ධ වෙනවා. ඒ අයට කුම්භාණ්ඩියො කියල කියනවා. නමුත් තියෙන්නෙ මහා විශාල ස්ත්‍රී ලිංගයක්.

ඊළඟට පිසාචයො කියල තවත් ප්‍රේත කොටසක් ඉන්නවා. සමහරු අනුන්ගෙ හිතවත්කම් නැති කරල කඩල දානවා, තරහ කරවනවා, පවුල් කොටවනවා. "ච" කියන්නෙ චිත්තය, "පිස" කියන්නෙ පිස දමනවා, විනාස කරල දමනවා. මේ විදියට **අනුන්ගෙ හිතවත්කම් පිහල දම්මම, ඒකෙ විපාකය විදියට පිසාචයො වෙලා උපදින්න හේතු වෙනවා.**

ඒ වගේම තවත් ප්‍රේත ☞

කොටසක් ඉන්නවා ඔලුව නැතිව කඳ විතරක් තියෙන. කක්කුට්ටන්ගෙ බෙල්ලෙ ඇස් තියෙනව වගේ උන්ට ඔළුවක් නෑ. කඳ විතරයි තියෙන්නෙ. මේ ප්‍රේත කොටසට කවන්ධයො කියල කියනවා. කව + අන්ධ තමයි කවන්ධ කියන්නෙ. කව කියන්නෙ යම්කිසි කවයක් හෙවත් ප්‍රදේශයක්. අන්ධ කරනවා කියන්නෙ නොපෙනෙන්න සලස්වනවා කියන එක. ඒ කියන්නෙ සමහරු ඉන්නවා ඊර්සියාවට, ලෝභකමට මොනව හරි ප්‍රයෝජනයට ගන්න දේවල් අනුන්ට වසන් කරනවා, හංගනවා. වටපිට බලල යමක් පහසුවෙන් හොයාගන්න බැරි තත්ත්වයට පත් කරනවා. වයසට ගිය දෙමවුපියන් එහෙම නැත්නම් ගුණවතුන් වගේ අය තමන්ගෙ ගෙදරට ආවොත්, මොනව හරි දෙන්න වෙයි කියල ගෙදර තියෙන දේවල් වට පිට බැලුවම හොයා ගන්න බැරි විදියට හංගනවා. මේ ජාතියෙ කරපු ඒවට විපාක විදියට ප්‍රේත වෙලා, තමන්ටත් ඒ වගේ මානසිකත්වයක් ඇති වෙලා, අවට සෝදිසි කිරීමේ හැකියාව නැති වෙලා යනවා. මේවා බොරු නෙවෙයි. මේ කියන කවන්ධයෙක් ගැන මීට ටික කලකට පෙර කොළඹට නුදුරු ප්‍රදේශයකින් දැන ගන්න ලැබුණා.

එක්තරා පුද්ගලයෙක් රෑ 12 ට විතර තමන්ගෙ වාහනය පදවගෙන තනියෙන් අතුරු පාරක වේගයෙන් ගියා. එහෙම යන කොට ඔහු ඈත ඉඳන් දැකල තියෙනවා, ඒ පාරෙම ඔහු යන දිසාවටම යම් කිසි පුද්ගලයෙක් පයින් ගමන් කරනවා. රෑ බෝ වෙලා යන්න ක්‍රමයක් නැතිව පයින් යනව ඇති කියල හිතාගෙන, ඔහු ඒ පුද්ගලයාට උදව්වක් කරන අදහසින් ළඟට ගිහින් වාහනය නවත්වන්න වේගය අඩු කරල තියෙනවා. බලන කොට ඒ පුද්ගලයගෙ බෙල්ලෙන් උඩ ඔළුවත් එක්ක නැතිලු. නමුත් පයින් ගමන් කරනවා. මේ නිසා ඔහු භය වෙලා වාහනය ඒ පුද්ගලයා පසු කරගෙනම වේගයෙන් නොනවත්වා ධාවනය කරල තියෙනවා. මේ වගේ සිද්ධි ඉඳල හිටල අහන්න ලැබෙනවා. අපි නොහිතන අමනුස්ස කොටස් ඉන්න බවට මේවා හොඳ සාක්ෂි වෙනවා. කර්ම විපාක සෘද්ධියෙන් කය සනීභවනය කරගෙන සමහර අමනුස්සයන්ට මේ විදියට පෙනී ඉන්න පුළුවන්.

මේ විදියට ප්‍රේත විෂය ගත්තම ඒක මහා පුළුල් විෂයක්. විවිධාකාර ප්‍රේතයො ඉන්නවා. අපි යක්ෂ කියල කියන කොටස අතරත් එක්තරා ප්‍රේත කොටසක් **ඉන්නවා. යසස් ක්ෂය කරල දාපු සංඛාරයෙන් තමයි යක්ෂ වෙලා උපදින්නෙ.** මේ අය හැම වෙලේම කපාගෙන කොටාගෙන දුක් විඳින කොටසක්. මනුස්ස ලෝකයේදී මිනිස්සුත් එක්ක රණ්ඩුවට ගිහින් කාම සම්පත් ඩැහැගන්න, ගහ මරාගෙන කපා කොටාගෙන යසස් ක්ෂය කරපු අය මේ වගේ උපදිනවා. දැන් ඒ ලෝකෙ ඉපදිලත් ඒ වගේම දේවල් තමයි කරන්නෙ. ඒ අය ලේ දකින්න, බිලි ගන්න බොහොම කැමතියි. ඔය සමහර කට්ටඩි වැඩවලදි නොයෙක් බිලි දීල, දොළපිදේනි දීල අනුන්ට වින කරන්නත් මේ වගේ යක්ෂ කොටස් ගෙන්ව ගන්නවා. ඒ අය ද්වේෂය නිසා දැවි දැවී සැහෙන කල් ඔය වගේ අත්බැව්වල දුක්



විපාකයන් විඳවනවා.

**දැන් මේ වගේ කාරණාවලින්, මේ සංසාරයේ තියෙන මහා භයානකත්වය තේරුම් ගන්න ඕන. මිනිස්සු සමාජයේ ජීවත් වෙන කොට නොයෙක් දේවල් කරනවා. බොහොමයක් උදවිය පොඩි පොඩි දේවල් අල්ලගෙන කරන පුංචි පහේ නොකටයුතුකම් බොහොම සුළු කොට තකන්න පුරුදු වෙලා ඉන්නවා.** ''අනේ අපි අතින් නම් ඔය වගේ පොඩි දෙයක් වුණාට අපි පිං කරනවනෙ, මල් පූජ කරනවනෙ'' සමහරු මෙහෙමත් කතා කියනවා. **මේ වගේ නොයෙක් මති මතාන්තර තියාගෙන කටයුතු කරන උදවිය හිතන් ඉන්නෙ, මරණින් පස්සෙ ඒ අය හොඳ තැන්වල ඉපදෙනව කියල. සතර අපායට යන්නෙ මහා පරිමාණයේ පවු කරපු අය කියල තමයි ඒ වගේ බොහෝ අය හිතන් ඉන්නෙ. නමුත් එහෙම හිතුවට මැරිල උප්පත්තිය ලබද්දි ඊට හාත් පසින්ම වෙනස් දෙයක් තමයි සිද්ධ වෙලා තියෙන්නෙ. බොහෝ කොටම සතර අපායෙ තමයි උප්පත්තිය ලබල තියෙන්නෙ.**

මීට අවුරුදු කිහිපයකට උඩදි ඈත ගල්ලෙනක, යම්කිසි දිවැස් සමාධි වඩපු භික්ෂූන් වහන්සේ නමක් වැඩ හිටියා. උන් වහන්සේ කියනව, ඒ ගමට උන් වහන්සේ වැඩියට පස්සෙ, ඒ ගම අවට ජීවත් වෙච්ච පන්සීයකට ආසන්න මිනිස්සු සංඛ්‍යාවක් විවිධාකාර හේතු උඩ විවිධ අවස්ථාවලදී මිය පරලොව ගියා කියල. ඒ අය ගැන උන් වහන්සේ විවිධ අවස්ථාවන්වල යොමු කරල බලන කොට, ඒ පිරිසගෙන් මනුස්ස අත්භවයක් ලබල තියෙන බවට යොමු වුණේ එකම එක පුද්ගලයෙක් විතරලු. අනිත් ඔක්කොම උදවිය ඒ අවට ප්‍රේතයො වෙලා, තවත් සමහරු බල්ලො, බළල්ලු, වඳුරො, කුරුල්ලො, සර්පයො වගේ සත්තු වෙලා ඉපදිලා නොයෙක් දුක් විඳිනවලු. මේ පුංචි උදාහරණයක් විතරයි.

**සමහර උදවිය හතර පෝයටම සිල් අරගෙනත්, මොකක් හරි ගෙදර තිබ්බ්ච බඩු මුට්ටුවකට වගේ පුංචි දේකටත් පෙරේතකම් කරල ඒක උපාදාන කරගෙන, ඒ හේතුවෙන් නොයෙක් ප්‍රේත කොටස්වල ඉපදිච්ච අවස්ථා අනන්තවත් තියෙනවා.** නමුත් ඉතින් මේක මෙහෙම සිද්ධ වුණාට, ඒ බව කියල දෙන්න ඉන්න උදවිය බොහොම අඩුයි. ඒ ගැන දැනුවත් අයත් බොහොම අඩුයි. නමුත් යම්කිසි ගුප්ත ක්‍රමවලින්, එහෙම නැත්නම් දිවැස් සමාධි දියුණු කරපු උත්තමයින් මේ කාරණය පැහැදිලිව දකිනවා. නමුත් අද ලෝකයා බොහෝ කොටම හැම දේම භෞතිකත්වය තුළින් මනින්න යන නිසා මස් ලේ ඇහැට පේන්නෙ නැත්නම්, මස් ලේ කන්වලට ඇහෙන්නෙ නැත්නම්, උපකරණවලට අහු වෙන්නෙ නැත්නම්, මේ වගේ කාරණා බොරුයි කියල ප්‍රතික්ෂේප කරන්න පුරුදු වෙලා ඉන්නවා. නමුත් ඒ ප්‍රතික්ෂේප කිරීම තුළ තියෙන භයානකත්වය ඒ අය දකින්නෙ නෑ. ඒ නිසාම මේ මනුස්සයින්ට බොහෝ කොටම පරලොව පිහිටත් නැතිව යනවා. මේ නිසා මේ කාරණා ඥාන සම්ප්‍රයුක්තව තේරුම් අරගෙන මේ සංසාරයේ තියෙන බියකරු බව වටහා ගන්න උත්සාහ කරන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හේතුඵල දහම අනුව මනස මුල් වී ලෝකය හට ගැනීම හා විනාශ වීම

(18 වන කලාපයෙන් - ගතියට ආවේණික රූපයන්ගේ පහළ වීම....)

සත්ත්වයන්ගේ ගතියන්ට ආවේණික නාම රූප පහල කරන ශක්තීන් හා සලායතනයන්ගේ පහල වීම, විද්‍යාඥයන්ට හසු නොවූ පැතිකඩක් ඔස්සේ යම් පමණකින් පැහැදිලි කළා. නැති දෙයක් නිපදවෙන ක්‍රමයක් නැති බවත්, ඇති දෙයක්ම එකින් එක ආකාරවලට පරිවර්තනය වීම නිසා ඒ ඒ ක්‍රියා රටාවන් විද්‍යමාන වන බවත් දන් තියෙන මතයක් තමයි. පරම සත්‍යය වටහා ගැනීමේදී බුදුරජාණන් වහන්සේ පට්ඨාන නියමය අනන්ත බවත් දේශනා කරමින් මේ කාරණය පෙන්වා තියෙනවා. මේ අනුව ප්‍රශ්නය වෙලා තියෙන්නෙ රූපයන්ගෙන් යමක් පිටතට නොගියා නම්, වෙනත් දෙයක් ලෝක තලයේ නැතිනම්, ආපෝ - තේජෝ - වායෝ- පඨවි - වර්ණ - ගන්ධ - රස - ඕජා කියන ශුද්ධාෂ්ටකය පරමාර්ථ ධර්මය නම්, ලෝකයේ මීට වඩා මූලධර්මයක් නෑ කියල පෙන්නුවා නම්, සිත අහම්බෙන් අමුතු නිෂ්පාදනයක් ලෙස බිහිවීමට හේතු නෑ කියන තර්කය. කරුණු තේරුම් ගත්තම ලෝකයේ නැති නොවන, ඇති නොවන, වැඩි නොවන, අඩු නොවන ධර්මතා වශයෙන් රූප ධර්මතාව පමණක් පෙන් වූ බුදුන් වහන්සේලා නෑ. සර්වඥ වූ නිසාම ඒ ශ්‍රේෂ්ඨ උතුමන් වහන්සේලා මීට අදාළ පරමාර්ථ ධර්ම හතරක් දේශනා කරල තියෙනවා. එනම් චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ කියන පරමාර්ථ හතර. චිත්ත, චෛතසික වශයෙන් නාම පරමාර්ථ දේශනා කර තිබියදී රූප පරමාර්ථයන් නාම පරමාර්ථ බවට පත් කිරීමට හේතුව මොකක්ද? රූප කිසි දිනෙක නාම ධර්ම කරන්න බෑ. බුදුන් වහන්සේ මේ රූප විසි අට ආකාරයකින් ක්‍රියා කරන අයුරු පෙන්වා දී තියෙනවා. පළමුව අන්තඃකල්ප ගණනක් විනාශ නොවන, ලෝක සිද්ධාන්තයක් වන, ලෝකය රවටන බොරු මවන මූලිකයා වන අති සූක්ෂම රූප කලාපය දුටු බුදුන් වහන්සේ, එය භූත රූප කියල දැන ගන්නා ලෙස දේශනාවේ පෙන්වා තියෙනවා.

මීළඟට භූත රූපයන්ගේ අවස්ථාවක් පෙන්වමින් ප්‍රසාදයක් ඇති කිරීමට හේතු වන කොටසක් කර්ම ශක්තියෙන් ඇති කරනවා. භූත රූපයන්ගේ පෘෂ්ඨයන් කරා කර්ම ශක්තිය එල්බ ගන්නා





කොට පැහැපත් ප්‍රසාද බවක්, ආලෝක බවක් ඇති කරනවා. උපමාවක් විදියට, වලාකුළු නැති අහසකට එල්ල කරපු ප්ලෑෂ් ලයිට් එකක් බිමට යොමු කළොත් ප්‍රසාදයක් හෙවත් බැබළීමක් එනවා. නමුත් ආකාසයට යොමු කළාම බිමදී තිබිච්ච බැබළීම නෑ. චක්ඛු ප්‍රසාදය, සෝත ප්‍රසාදය ආදී වශයෙන් ප්‍රබෝධය දැනීමට බැලීම් හෙවත් පෙනීම්, ඇසීම් ආදී දැනුම් දෙන ගතියට ප්‍රසාද එළවන්නේ නම් ඒ ප්‍රසාද රූප. මේ ප්‍රසාද රූප පහ සත්වයෙකුගේ වස්තු රූපය හා සම්බන්ධ වෙලා පවතිනවා. මේ භූත රූප හෙවත් අති සූක්ෂ්ම පරමාණු මූලයත්, ප්‍රසාද රූපයත් විෂය ගෝචර වෙන්නෙ නෑ. ලොවුතුරා බුදුන් වහන්සේගේ අනාවරණ ඥානයෙන් දැකපු දෙය අන්‍ය වූ කිසි නුවණකට සොයා ගන්න බෑ. දේශනා කළාම වැටහෙන දෙයක්.

තුන්වැන්න තමයි විෂය රූප. මේවා අණ්වීක්ෂ හෝ කුමන අයුරකින් හෝ බලන්නත් පුළුවන්. යම් අයුරකින් ඇසින් හෝ උපක්‍රමයකින් හෝ බලන්න පුළුවන් නම් ඒවා විෂය වන රූප. ඇස කරා එන ආලෝක කිරණ, කන කරා එන කම්පන වායු අනු හෙවත් නවීන විද්‍යා සම්මත පරමාණු, නාසය කරා එන අංශු (දෙහි, දොඩම්වල පැඟිරි සුවඳ ආදිය), දිවට දැනෙන ද්‍රව්‍ය අංශු රස, කයට දැනෙන තද දේවල්වල ස්පර්ශ කියන පංචේන්ද්‍රිය විෂය වන කොටස් ද, මනෝන්ද්‍රියට විෂය වන කොටස් ද කියන මේවා විෂය රූප වෙනවා. මේ විදිහට රූපවල ආකාර 28 ක් බෙදා දක්වා ඇති අතර ඒ රූප බිඳී නාම බවට පත් වන විග්‍රහයක් බුදු දහමේ නෑ. එහෙම දෙයක් සම්මත කරන්න හේතුත් කිසිවිටකත් ලැබෙන්නෙ නෑ.

චිත්ත ලෙස පවතින පරමාර්ථ ධාතුවකුත් තියෙන බව දේශනා කර තියෙනවා. ආරම්මන විජානන ලක්ෂණය සිත යනුවෙන් පෙන්වා, ප්‍රභාස්වර බව සිත කියලත් පෙන්වා තියෙනවා. දැනෙන ස්වභාවයට අයිති යමක් වේද, ඒ දැනෙන ස්වභාවය චිත්ත නම් පරමාර්ථ ධර්මයක්. හේතු නිසා ගොඩනැගෙන ඵල ධර්ම ස්වභාවය හටගත් දිනයක්, වැනසෙන දිනයක් දේශනා කර නැති ධර්මතාවක්. හේතු ඵල ලෙස ගොඩනැගෙන්නේ මනෝ ධාතුව. මනෝ කියන්නෙ මිනුම්. මිනුම් ඇති බව අපට වැටහෙන්නේ දැනෙන නිසා. මනෝ නම් වූ මනින බව නිසා ආකාර, ලිංග, නිමිති, උද්දේස, ප්‍රඥප්ති යනුවෙන් මිනුම් ඇති නිසාම දැනීමට නැගෙනවා. මිනුම් නැති තැන දැනෙන්නෙ මොනවද? මනෝ සමග දැනෙන බවක් තියෙන

නිසා මනෝ යම් තැනක වේද ආකාර, ලිංග ආදී නාම රූපයන් ගත් නාම ගෝත්‍රත් එතැන වෙනවා. මේ මනෝ, නාම ගෝත්‍ර නිසාම පවතිනවා. නාම ගෝත්‍රවල තියෙන්නේ අතීත මතක සටහන්. ඒවායේ ආකාර, ලිංග.... ආදිය වෙනවා. මේ මනෝවල තියෙන්නේ නාම ගෝත්‍රය නිසා වෙච්ච සටහන්. මනෝ හැදෙන්නේ මනෝ ධාතුවෙන්. මනෝවල මූල ධර්මය තමයි මනෝ මූල. ඒ තමයි දැනීම් සටහන් හදන (මනෝ රූප) මනසේ මූලයි. මේ මනස් මූල නිසාම නිෂ්පාදනය වන මනෝ සටහන් සේයා පටියක හටගත් රූප වගේ ගමන් කරන මනෝ විඤ්ඤාණ ධාතු රැහැනට නැගෙමින් නිෂ්පාදනය කෙරෙමින් අතීතයට යනවා. මේ මනෝ විඤ්ඤාණ ධාතු පටිය අනන්ත ඉදිරියටත් අනන්ත පසුපසටත් තියෙනවා. ඉදිරිය තමයි අනාගතය. පසුපස තමයි අතීතය. මේ මනෝ ධාතු, මනෝ විඤ්ඤාණ ධාතු, මනෝ විඤ්ඤාණය කියන මේවා මොනවද? මනෝ ධාතු, මනෝ කියන්නේ ආකාර, ලිංග, ආදී නාම රූප ධර්ම පිළිබඳ මැනීම. දැනීම නැත්තම් මැනීම වැටහෙන්නෙත් නෑ. මැනීමෙන් තොර නම් දැනීම කියල දෙයකුත් නෑ. මැනීමත් දැනීමත් කියන දෙක, හඬත්, හඬෙහි ලතාවත් වගෙයි. හඬින් තොර ලතාවත් ලතාවෙන් තොර හඬත් නැතිවා වගෙයි, මැනීමෙන් තොර දැනීමත්, දැනීමෙන් තොර මැනීමත් නෑ.

මනින විට, දැන ගන්නා විට නාම රූප ධර්ම හෙවත් ආකාර, ලිංග, නිමිති, උද්දේස, ප්‍රඥප්ති ආදිය ඇති බව පේනවා. මේ ඇති බව පේනව නම්, ඒක දැන ගැනීමේ බලාපොරොත්තුව මනෝ විඤ්ඤාණයක්. ඒක සුදුසු චෛතසික සමගත් උපදිනවා. ඒ මනෝ විඤ්ඤාණය ක්ෂණයකින් විපරිණාම වෙනවා. ඒ කියන්නෙ පරිණාමය වෙනස් වෙලා නාම ගෝත්‍ර නම ගන්නවා. ඒවා විඤ්ඤාණ ධාතු නම් වෙනවා. (දේහය මිය ගිය විට ධාතු ඉතිරි වෙනවා. ඒ මෙසේය. අද සර්වඥ දේහය නෑ. නමුත් ධාතු තියෙනවා. ඒවායින් කොටසක්වත් විනාශ නොවී ශාසන අතුරුදන්වීම දක්වාම පවතිනවා.) මේ නාම ගෝත්‍ර නොදිරන බවත්, ක්‍රමයෙන් අතීතයට යන බවත්, කැමති සේ නොපවතින බවත් පේනවා. මේ නොනැසෙන අතීත මතක සටහන් සැකසෙන්නේ මනෝ ලෝකයේ මනෝ මූලවලින්. මනෝ මූල කියන්නෙ මනෝ විඤ්ඤාණ ධාතු හෙවත් මතක සටහන් හදපු නිෂ්පාදන මූලයි. මේ මනෝ මූල අනන්තයි. මනෝ විඤ්ඤාණ ධාතු හෙවත් මතක සටහන් දෙන මූල, මනෝ නිෂ්පාදනය මනෝ ලෝකයේ මනෝ මූලවලින් හැඩගැසී පවතිනවා. මේ මනෝ මූලත් මනෝමයව නිපදවෙන හේතුඵල දහම්. ද්‍රව්‍ය මූලයෙන් හැඩ ගැසුණු අටවිසි රූප වගේ, චිත්ත නම් වූ මනෝ ධාතුව චෛතසික නම් ආකාර ගනිමින් 52 ආකාරයකට නාම කොටස් ගොඩ නගමින් ක්‍රියාත්මක වෙනවා. මේ විදිහට හටගත් යම් විඤ්ඤාණයක් ඇත්ද එහි දැනීමත්, මැනීමත්, රැවටීමත් තියෙනවා. දැනීම් ස්වභාවය මැනීම ඇති විට පවතිනවා මිසක් තනිව සිටින්න බෑ. මැනීමේදී ආකාර ගන්නවා. නැති දේ ඇති සේ අරගෙන වැරදියට මැන ගන්නවා. වැරදියට හෝ ඇති ආකාර හෝ මැන ගන්නේ මනෝ යනුවෙන්ම පවසනවා. මේ මනෝ ලෝකයේ යමක් මෙසේ වන්නේ ද, මනෝ හැදී තියෙන මූලයෝ ඊට හේතු වෙලා තියෙනවා. පඨවි ධාතු .... ආදී ලෙස කිව් පරිදි මනෝ ධාතුවත් එසේම පර්මාර්ථ ධර්මයක්. (පරමාර්ථ ධර්ම කියන්නේ යමක් විශ්ලේෂණය කර බැලුවම ඒ ආරම්භයට මුල් වූ දෙයයි.)

**පඨවිය කොහේ තිබුණත් අපට දුක ගෙන දෙන්නෙ නෑ. ඡන්ද රාගයෙන් ඇසුරු කළොත්, ඇසුර ගෙන ගියොත් දුක ගෙන දෙනවා. ආපෝ, තේජෝ, වායෝ .... මේ ආදී ලෝකය කෙසේ පැවතුණත් අපට දුක ගෙන දෙන්නෙ නෑ. දුක දෙන්නේ ඒවා ඇසුරේ සිටියොත් තමයි. ඒ වගේම මනෝ හෝ විඤ්ඤාණ ධාතුවල නාම ගෝත්‍ර චේචා, ඒවා තිබ්බව පළියට අපට දුක** දෙන්නෙ නෑ. දුක දෙන්නෙ, ක්‍රියාත්මක වෙමින් විඤ්ඤාණ හදමින් යන ගමන තමයි. හිත ''මම'' නොවන නිසා, රූප ''මම'' නොවන නිසා ආසාවට පැවැත්ම ගෙන යමින් මේ නාම ධර්මවලට, රූප ධර්මවලට ඇලෙමින් කාම, රූප, අරූප යන භව ගමනම නාම රූප යන මේ දෙකින් අල්ලමින් ගමන් කරනවා. ආසා නොකර, ඇති තතු දැකල අතහැරියම නාම ලෝකයත් රූප ලෝකයත් යන දෙකේ හේතුඵල ක්‍රියා සම්බන්ධය නැති වෙලා යනවා. ඒ වගේම පරමාර්ථ නිරෝධ ධර්මයකුත් තියෙනවා. එයට පත් වෙනවා. නිරෝධ සුවය තියෙනවා කියන කොට, ඒක කාම සුවය වගේ විඳින්න පුළුවන් කියල හිතනව නම් ඒක මෝඩකමක්. දූන් බලන්න ඕන මේ ඇසට රූපයක් ගැටුණම සිද්ධ වෙන විද්‍යානුකූල රටාව.

රූපවලට දැනෙන්නෙ නෑ. මනෝ මූලයන්ගේ ප්‍රමාණය අනන්තයි. මේකට සක්වළවල් මෙපමණක් ඇතුළු වේය කියල වෙන් කරන්න බෑ, අනන්තයි. මනෝ මූලිකව ලෝකය හට ගන්නවා. මනෝ ධාතුවේ වේදනා චෛතසිකයට දැනෙන ගතිය තුළ ලෝක සත්ත්වයා අවිද්‍යාවෙන් තණ්හාවෙන් බැඳුණු දවස සෙවීමට බැරි අනාදිමත් අතීතයකට යනවා. මේ විචිත්‍ර බව නිසා අරූප ලෝකයත්, රූප ලෝකයත්, කාම ලෝකයත් කරා මෙහෙයවමින් සත්ත්ව සැරිසැරීම සිද්ධ වෙනවා. අරූප ලෝකවලදී රූප ස්පර්ශයන්ගේ වේදනා හෙවත් දැනෙන බවත්, සංඥා හෙවත් හැඟෙන බවත් කියන මේ කාරණා නැති බව වැටහෙනවා. මේ කාරණය ඉතා සියුම්. මීළඟට දැනෙන බව බලවත් වෙලා අනන්තය දැනෙමින් දැනීම හැඟීම පහල වෙනවා. මීළඟට විසිරුණු ආලෝක මාත්‍ර ඇති ආලෝක ගති සහිත, නමුත් දැක ගන්න තරම් වන ආකාර නැති අනන්ත ආකාශයක් ද දැනීමට හැඟීමට ස්වල්ප මාත්‍ර වූ හැඳිනීම පහල වෙනවා. මේ නාම ලෝක හෙවත් විඤ්ඤාණ ලෝක. මේවායේ විෂය රූප නෑ. මීළඟට ආකාරයක් ඇති දැනීම් ඒකකයක් වූ දැනීම සිටිනවා, හැඟීම සිටිනවා. හැඳිනීම සිටිනවා. මේ තමයි අරූප සමාධි තලවල තත්ත්වය.

මෙහිදී කුඩා චලන සහිත දැනීම් මාත්‍රයක් නේවසඤ්ඤා නාසඤ්ඤාවලට පැමිණීමත්, එය වීර්යයෙන් තමන් විසින් ගොඩ නගන බවත් වැටහෙනවා. එය තවත් ප්‍රසාරණය කිරීමේදී අනන්තය තෙක් විහිදී විඤ්ඤාන තලය දිස් වෙනවා. එතැනිනුත් පහළට බහින කොට ඒ විඤ්ඤාන තලයේ අනන්ත වූ ආකාස තලය ස්පර්ශ කරමින් ආකාසානඤ්චායතන සමාධි තලය දක්වා පැමිණෙන්න පුළුවන්. එතනින් පහළට බහින කොට ශුද්ධ වූ ආලෝකයෙන් නිර්මාණය වූ රූපමය ආලෝකයක් සහිත චතුර්ථ ධ්‍යාන තලයට පැමිණෙන්න පුළුවන්. එතනදී උපේක්ෂා ඒකාග්‍රතා නම් ශුද්ධ මනෝ භාවය විද්‍යමාන වෙනවා. එතැනිනුත් පහළට එන කොට දැනෙන සුඛයෙන් පිරි තෘතිය ධ්‍යාන තලයටත්, තවත් පහළට බහින කොට ප්‍රීති හා සුඛ ඇති ද්විතිය ධ්‍යාන තලයටත්, එයිනුත් පහළට බහින කොට සවිතක්ක, සවිචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන තලයටත්, එතැනිනුත් පහළට බහින කොට පියවි ස්වභාවයේ ලෝකය අරමුණු කරගත් සාමාන්‍ය මනෝ භාවයටත් පත් වෙන්න පුළුවන්. දූන් ක්‍රමයෙන් ස්පර්ශ ධාතු ඇසුර ලබනවා. ස්පර්ශ කරන, බැඳෙන රැඳෙන ගති වෙනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, පහස ඇසුරු කරනවා. මේ විදියට විෂය රූප තියෙන ලොවක්. දැනීම් තියෙනවා. ඒ දැනීම් පටු වෙමින් ද්‍රව්‍ය වස්තු ඇසුරේ යම් තරමකින් ගැලෙයි ද, රූප ඇසුරු කරන කොට ස්පර්ශය බලාපොරොත්තු දැනීමත් වෙනවා. ස්පර්ශ ලබන්න මහත් සේ ළංවෙලා බැඳුණම, මැනීමට බැස ආපු තැන් පටන් මනෝ බවට දැනීම කැටිවෙලා ආකාර ගන්නවා. ආකාර, දේවල් ස්පර්ශ කරනවා. ක්‍රමයෙන් ලිංග, ප්‍රඥප්ති, නිමිති ගන්නවා.

අල්ලාගත් හෘද රූපය වටා ☞

දූනීම් මූල පිහිටනවා. රූප ධාතුවක් ඇසුරේ මනෝ ධාතුව පිහිටනවා. ඒ රූප කලාපයේ ගැටුණම, ස්පර්ශ වුනාම අනුකූල දූනුම මතුවෙලා ආකාර නිපදවෙනවා. ලිංග, නිමිති, ප්‍රඥප්ති නිපදවෙනවා. ඒවා අතීතයට යන මොහොතේම විපරිණාම වෙලා නාම ගෝත්‍ර වැල හට ගන්නවා. ඒ නාම ගෝත්‍ර පසුව එන සිත්වලට එසේම රැකුල් දෙමින් නාම රූප බලවත් වෙනවා. ගති හැඩය ගනිමින් රූපයෝ නැමී සිටිනවා. ශක්තිය නම් ධර්මය තමයි නාමයේ යොමු වෙච්ච බලය. ඒකට ගෝචර වෙච්ච රූප මේ විදහට නැම්මට අනුව හැඩ නිමවා ලෝකය මූලිකව තනනවා. යොමු කළ ශක්තිය, අලවංගුවක් ගැසූ රෝදයක් තමාට හැකි වීරියෙන් කරකවා තමාටම පාලනය කර ගැනීමට නොහැකිව ඒ ශක්තියට හසු වෙලා තමා, ඊටම ගොදුරු වෙලා මුලදී දුන් වේගය අනුව ඇදී ගිහින් චක්‍ර වේගය නවතින තුරු ක්ලාන්ත වූවකු වගේ ගිහින් කාලයකදී චක්‍රය නවතිනවා. එදාට මේ ලෝකයේ විනාශය එනවා. **ලෝක විනාශයයි කිව්වෙ මූල ධාතුවලින් සකස් වෙච්ච ද්‍රව්‍ය වස්තු විපරිණාමය වෙලා ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පහළ තියෙන සියලු ලෝක කොටස් විනාශ වීම.**

මේ විදිහට සිද්ධ වෙන විනාශයත් බොහෝ කාලාන්තරයක් තුළ සිදුවන්නක් මිසක් හදිසියේ සිදුවන දෙයක් නෙවෙයි. **ක්‍රමයෙන් දූෂිත බවට පත් සත්ත්වයන් පොදුවේ මේ දූෂිත බව වැඩි වුනාම ලෝකයේ පැවැත්ම ගෙන ගිය බලයත් සිඳී ගිහින් ක්‍රමයෙන් මහා ගින්නකින් ද වැනසී ගිහින් පරමාණු බවට පත් වෙලා වැනසී යනවා. උපන් සත්ත්වයාත් මේ සමග වැනසෙමින් සියුම් වූ කර්මජ හා චිත්තජ කායයන්ගේ සියුම් තත්ත්වයන්ට පත්වෙමින් ඒවාත් වැනසී යමින් මේ විදිහට මේ ලෝක ධාතුවම වැනසෙනවා. අපාගතව සිටින සත්ත්වයන්ටත් මේ කාලයේ සිද්ධ වෙන ද්‍රව්‍ය වස්තු වැනසීම නිසා ඇසුරු කිරීමට රූපයන්, ද්‍රව්‍යයන් නැතිවීමෙන් ඇලුම් කරන්නට තැන් නැති වෙනවා. ඒ නිසා අහස ඇසුරු කරන බ්‍රහ්ම තත්ත්වයන් පහල වෙනවා. එතකොට නැවත පවිත්‍ර වූ චිත්ත ශක්තියේ බලය නැගී සිටිනවා. නමුත් අනුෂය වශයෙන් තිබ්බච්ච කෙලෙස් මතු වීම නිසා කාලයකදී නැවත ඒ මතකයන් නැගිල, අභ්‍යන්තර වූ නාම ගෝත්‍ර මුල් කර ගෙන ඇති වන ගතිවලට අනුව අභ්‍යන්තර වූ නාම රූප බලවත් වෙලා අභ්‍යන්තර හා බාහිර නාම රූප පහල කරනවා.** ඒවාත් පෙර ලෝකයේ තිබූ කාලයට සමාන ආකාර, ලිංග, නිමිති, උද්දේස, ප්‍රඥප්තිවලින් ආපු සටහන් නිසා, අනුකූල ගති ශක්තියට ගොදුරු වන ශුද්ධාෂ්ඨක කර්මජව හා චිත්තජව නිපදවෙලා, අනුකූල වෙලා කලින් විදියටම ලෝකයක් අලුත් ලෙස ද්‍රව්‍ය වස්තු බවට ආපසු විපරිණාමය වෙලා හට ගන්නවා.

මේ විදියට සත්ත්ව ශරීරත් අනුකූල වෙමින් තද ශරීර, තද ද්‍රව්‍ය වස්තු නිපදවමින් පෙර සේම මේ ලෝක චක්‍රය ගෙන යනවා. මෙහිදී වටහාගත යුතු දෙයක් තියෙනවා. ශක්තිය, නාම හෙවත් හිත සම්බන්ධ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ වුණා නම්, එතෙක් තිබූ මතක සටහන් විනාශ විය යුතුයි. මොකක් නිසාද? ඒවාත් ශක්ති ලෙස එකතු වෙලා සකස් වෙලා තිබුණ නම් මේ විනාශයේදී විනාශ විය යුතු නිසා. නාම ශක්තිය නම් මේ රූප ධාතු සම්බන්ධ දෙයින් වන මූල ධාතුවලට අයිති නැති, ගින්දරට රූප බිඳී පරමාණුවලට පත් වුණත් ඒවාට සම්බන්ධ නැති වෙනම ධර්මතාවක් වන නිසා. **කොතෙක් ලෝකය විනාශ වුනත් කිසිම බලයකින් නාම ගෝත්‍ර හෙවත් මනෝ විඤ්ඤාණ ධාතු ශක්තිය විනාශ නොවන ධර්මතාවක් වී, රූප සම්බන්ධ නොවන මූලධර්මයන් වන නිසා නාම ගෝත්‍ර විනාශ නොවී තියෙනවා.**

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 21 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**<u>ශ්‍රම දායකත්වය</u>** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ ඩී.සී.ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ ගයාන් ගුණරත්න මහතා - ගොතටුව ♦ ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ♦ ස්වර්ණා සමරසිංහ මහත්මිය - නැදිමාල ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**<u>මූල්‍යමය දායකත්වය</u>**

♦ දම් වරුසා දහම් පොත අලෙවියෙන් ලද මුදලින්, කෑගල්ල - ගන්තුනේ මෙරිල් ප්‍රනාන්දු මහතා - රු.29,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ කරුණා ධර්මසේන මහත්මිය - හෝමාගම - රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය, අජන්ත කුමාර මහතා - පදියපැලැල්ල - රු. 6,300/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ තුසිත නාකන්දල මහතා - මහනුවර - රු. 5,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම -නෙළුව- රු. 5,000/-♦ සකුන්තලා ඒකනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 5000/- ♦ ඩබ්.ඩී.පද්මලතා මහත්මිය - වේයන්ගොඩ- රු. 3,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 3,000/- ♦ අනුරුද්ධ පෙරේරා මහතා - කිරුලපන රු. 3,000/- ♦ නන්ද සුදුසිංහ මහතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦ පී.එල්.ගුණවර්ධන මහතා - නුගේගොඩ- රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ අමරා නානායක්කාර මහත්මිය - පිලියන්දල - රු.2,000/-♦ රුචිර ද සිල්වා - නාවල - රු. 2,000/- දර්ශන මධුසංඛ, සසිඳු දුල්සික, සෙනෙහෙලතා, සුමනසූරිය මහත්ම මහත්මීන්- වේවැල්දෙණිය - රු.2,000/-♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ප්‍රේමා ගීකියනගේ මව සහ නිශාන්ත පුතා - හොරණ - රු. 1,300/-♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ රු.1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය රු. 1,000/- ♦

♦ ප්‍රසාද් රණසිංහ මහතා - පන්නිපිටිය - රු. 1,000/- ♦ පී.සංජය රණවීර මහතා ඇතුළු පවුලේ සැම - මහරගම රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල රු.1,000/- ♦ එච්. පී. විජේරත්න මහතා - කිරුලපන රු.1,000/-♦නලින් සේකර මහතා -වළල්ලාවිට - රු.1,000/- ♦ඩබ්.විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/-♦මාලිනී සිරිමාන්න මහත්මිය-රදාවාන- රු.1,000/- ♦ බී.එම්.මුතුමැණිකේ මහත්මිය - උඩුබැද්දාව - රු. 1,000/- ♦ එම්.ආර්.ඩී.චන්ද්‍රලතා මහත්මිය - එල්ලක්කල - රු.1,000/- ♦ අසන්ති චතුරිකා එදිරිසිංහ මෙනවිය - හඳපාන්ගොඩැල්ල - රු. 1,000/- ♦ ජේ.වී.ජයසිංහ මහතා, එන්.ඩබ්.එස්.බණ්ඩාර මහතා, ගර්ලි මහත්මිය, ජිනදාස මහතා, කේ.ලියනාරච්චි මහත්මිය, එල්.ඒ.කේ.ආරියරත්න මහතා, බී.කේ.රත්නාවතී මහත්මිය, ඒ.ඩබ්.වාකිෂ්ට මහතා, ආර්.මාලනී මහත්මිය, කේ.ඒ.හසරංග මහතා, කේ.ඩී.ඉෂාධි මෙනවිය, ආර්.කේ.ඒ.මාලනී මහත්මිය, එස්.එස්.ජනිත් පුතා, එස්. එස්. ජනිති දුව, ඩබ්.ධර්මසේන මහතා, ශ්‍යාමා මහත්මිය, ඩබ්.එම්.ආරියසේන මහතා, එස්.එම්.විජේවික්‍රම මහත්මිය, ආර්.ජී.ඒ. ගයාත්‍රි මහත්මිය, එම්.බී.ඒ. සුනිලා මහත්මිය, තිලකා මහත්මිය, එල්.ඒ.කේ.පේමචන්ද්‍ර මහතා, පාලිතා මහත්මිය, නාලිනී මහත්මිය, චන්ද්‍රා මහානාම මහත්මිය, උපාලි මහතා, බී.සේනානායක මහත්මිය, කමල් නානායක්කාර මහතා, ජේ.ජී.ධර්මදාස මහතා, කේ.විජේවික්‍රම මහත්මිය- වලස්මුල්ල - රු. 27,100/- ♦ මනෝජ් ජයසූරිය මහතා - මහරගම, රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, ඉසුරු සම්පත් මහතා - කළුතර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, චන්දිම ගුණදාස මහතා - මොරටුව රු. 5,800/- ♦ එකතු වූ සියළු මුදල් පරිත්‍යාග රු. 146,500/- ♦ පළමු පිටපත් 7000 සඳහා මුද්‍රණ වියදම රු. 171,500/- ♦ අනෙකුත් වියදම් -රු.10,040/- ♦ සම්පූර්ණ වියදම - රු. 181,540/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියළු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**


සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.




**සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වෙන සදහම් වැඩසටහන් මාලාව සජීවීව විකාශනය කෙරෙන අන්තර්ජාල ගුවන් විදුලි සේවාවට සවන්දීම සඳහා www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ ''දම් සහා ගුවන් හඬ''ට පිවිසෙන්න.**

# මැරුණායි කිව්වට ඉවර නෑ...





මළ හිරු බසින සමයක ලොව යම් තැනක
බලනට අසුබ ලෙස සලකන මළ කුණක
කලකදී තමන්ටත් බිය ගෙන දෙන සැණක
ඵලයකි හේතුවේ මරණය එක පණක

මහ මරණය කියයි යන විට කය සුනු වී
අහකට පනින්නට අසුරක් නැත හිමි වී
සහයෝගයට ඇල්ලූ දෙය මතු භව වී
දහමට අනුව කය නැන වෙයි නැත නිම වී

අත හරින මුත් මස් ලේ කය දුබල විට
නැත අහවරක් තුන් දොස තව තියෙන කොට
සත රැවටුණත් අහවර බව දුකෙහි සිට
ඇත මතු භවක් නොපෙනෙන පර ලොවෙහි හෙට



මේ විදියටම කියමින් හැඬූ පෙර කල ද
නෑ අහවරක් වූයේ ඒ කය මළ ද
ඒ ලෙසටමත් මතු එන අත් බැව්වල ද
වේ මරණයක් යළි ඉපදෙයි කය හළ ද


ගෙයක් හැර තවත් ගෙයකට යන ලෙසට
කයක් හැර කයක් තනවයි ලොව රසට
රැයක් ගෙවී යන හැටි පෙනුනද යසට
බයක් දෙන සසරෙ හැටි නොපෙනෙයි ඇසට

මේ ලෙස මැරී මැරී ඉපදී විඳපු දුක
නෑ මට කියන්නද පෙර අත් බැව් නොදැක
මේ මහ සයුරු දිය කඳ තැබුවද පසෙක
ඒ විඳී දුකෙහි කඳුළැලි සැසඳිය නොහැක

ඉවරයි කියල කිව්වට මතු පිටින් බලා
තවමත් ඉවර නැත මතු අත් බවින් හළා
ලොවමින් ඇළුම් කර හිටියට වෙමින් මුලා
නිවනින් තමයි නවතින්නේ අයින් වෙලා

එකම සොබ පිටින් බැලුවම නෙතට එන
දැකල කියයි මළ වීට බව ඉවර වුණ
සැකය හැරල දැන ගනු වස් සසර ගැන
මෙ කය තනන පිළි සමුපා දකිනු මැන

පබැඳුම - නිහිඳු චන්දන සිරිවර්ධන



# වෙනස

කළු ගල කළ වෙනස ගල් වඩුවෙකුගෙ අතින්
රළු බව නොමැති විය ගති රුව නැගුණු මෙතින්
දළු ලන විටදි තුන් දොස ලොව සතගෙ සිතින්
බැලූවද පහව යයි නොසැලෙන කුළුණු නෙතින්

කරවා සිදුරු කළු ගල ගැඹි කෙරුණු රුව
හරවා රළු පරළු බව ඔප් නැගුණු මුව
පුරවා මෙත් දහර නහවනු පිණිස ලොව
පොරවා ඇත ගුණය මහ කළු ගලට වුව

පස් ජල ගිනි සුළං ගෙන සැදි මෙ කළු ගල
හිස් වෙයි නිකං පැවතුනි නම් නොමැත ඵල
රැස් කර ගතින් දිරියෙන් මනු සතගෙ බල
දිස් වෙයි මුනිඳු රුව නිමවා බලන කල

සකි පෙර මෙ කළු ගල වට කඩතොලු කුහර
දකිනට මිසක නොතිබුණි නිවනට අහර
හැකි වුණ විටදි කවනට මෙත් ගුණ දහර
නොකියයි කිසි විටක කළු ගල යන වහර

සත සිත නිවන මෙත් මුදිතා කරුණාවේ
නැත කිසි දෝස සිත සුවයට ගෙන ආවේ
නෙත යන විටදි සිහි වෙයි බුදු ගුණ බාවේ
ඇත මතු නිවන් ගල් වඩුවා කළ සේවේ

නිමවුම් කෙරුව ගති රුව මෙලෙසට සාදා
පමණින් දුටුව සනසයි සත සිත පාදා
එම පින් බලෙන් නොම වී නිවනට බාධා
සැමතින් දිනේවා කෙළෙසුන් මළ සෝදා

පබැඳුම - සිසිඳු චන්දන සිරිවර්ධන

සිසිඳු චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී